| 6 | ලුණුගම්වෙහෙර | අනුමත ගණන/ප්‍රතිපාදන මුදල | 111 | 911110.60 | 19 | 165000.00 | 18 | 293000.00 | 14 | 141950.00 | 162 | 1511060.60 |
| | | ක්‍රියාත්මක/ආරම්භකර ඇති | 60 | [redacted] | 19 | [redacted] | 3 | [redacted] | 1 | [redacted] | 83 | 0.00 |
| | | අවසන් ගණන/ගෙවා ඇති මුදල | 0 | 548961.00 | 0 | | 3 | 41000.00 | 1 | 23000.00 | 4 | 612961.00 |
| | | භෞතික /මූල්‍ය ප්‍රගතිය(%) | 60.0 | 60.25 | 0.0 | 0.00 | 16.7 | 13.99 | 7.1 | 16.20 | 83.81 | 40.56 |
| 7 | ඕකෙවෙල | අනුමත ගණන/ප්‍රතිපාදන මුදල | 83 | 780105.00 | 1 | 20000.00 | 18 | 293000.00 | 1 | 20000.00 | 103 | 1113105.00 |
| | | ක්‍රියාත්මක/ආරම්භකර ඇති | 81 | [redacted] | 1 | [redacted] | 18 | [redacted] | 1 | [redacted] | 101 | 0.00 |
| | | අවසන් ගණන/ගෙවා ඇති මුදල | 81 | 676873.00 | 1 | 19800.00 | 0 | | 0 | | 82 | 696673.00 |
| | | භෞතික /මූල්‍ය ප්‍රගතිය(%) | 97.6 | 86.77 | 100.0 | 99.00 | 0.0 | 0.00 | 0.0 | 0.00 | 197.6 | 62.59 |
| 8 | සූරියවැව | අනුමත ගණන/ප්‍රතිපාදන මුදල | 71 | 635672.00 | 0 | 0.00 | 9 | 129000.00 | 9 | 103000.00 | 89 | 867672.00 |
| | | ක්‍රියාත්මක/ආරම්භකර ඇති | 71 | [redacted] | 0 | [redacted] | 9 | [redacted] | 9 | [redacted] | 89 | 0.00 |
| | | අවසන් ගණන/ගෙවා ඇති මුදල | 55 | 578515.00 | 0 | | 2 | 39700.00 | 0 | | 57 | 618215.00 |
| | | භෞතික /මූල්‍ය ප්‍රගතිය(%) | 77.5 | 91.01 | 0.0 | 0.00 | 22.2 | 30.78 | 0.0 | 0.00 | 99.69 | 71.25 |
| 9 | තංගල්ල | අනුමත ගණන/ප්‍රතිපාදන මුදල | 150 | 813194.95 | 53 | 339923.90 | 68 | 746880.00 | 47 | 419717.25 | 318 | 2319716.10 |
| | | ක්‍රියාත්මක/ආරම්භකර ඇති | 91 | [redacted] | 23 | [redacted] | 62 | [redacted] | 33 | [redacted] | 209 | 0.00 |
| | | අවසන් ගණන/ගෙවා ඇති මුදල | 31 | 240700.00 | 0 | | 51 | 661683.00 | 24 | 282190.00 | 106 | 1184573.00 |
| | | භෞතික /මූල්‍ය ප්‍රගතිය(%) | 20.7 | 29.60 | 0.0 | 0.00 | 75.0 | 88.59 | 51.1 | 67.23 | 146.7 | 51.07 |
| 10 | තිස්සමහාරාම | අනුමත ගණන/ප්‍රතිපාදන මුදල | 130 | 996545.00 | 6 | 57500.00 | 55 | 598750.00 | 50 | 408425.00 | 241 | 2061220.00 |
| | | ක්‍රියාත්මක/ආරම්භකර ඇති | 93 | [redacted] | 4 | [redacted] | 50 | [redacted] | 40 | [redacted] | 187 | 0.00 |
| | | අවසන් ගණන/ගෙවා ඇති මුදල | 37 | 366789.50 | 0 | | 15 | 136933.00 | 4 | 39600.00 | 56 | 543322.50 |
| | | භෞතික /මූල්‍ය ප්‍රගතිය(%) | 28.5 | 36.81 | 0.0 | 0.00 | 27.3 | 22.87 | 8.0 | 9.70 | 63.73 | 26.36 |
| 11 | වලස්මුල්ල | අනුමත ගණන/ප්‍රතිපාදන මුදල | 179 | 1188593.75 | 5 | 47000.00 | 71 | 735300.00 | 16 | 230625.00 | 271 | 2201518.75 |
| | | ක්‍රියාත්මක/ආරම්භකර ඇති | 179 | [redacted] | 5 | [redacted] | 71 | [redacted] | 16 | [redacted] | 271 | 0.00 |
| | | අවසන් ගණන/ගෙවා ඇති මුදල | 78 | 602066.00 | 3 | 29825.94 | 27 | 300225.00 | 4 | 57750.00 | 112 | 989866.94 |
| | | භෞතික /මූල්‍ය ප්‍රගතිය(%) | 43.6 | 50.65 | 60.0 | 63.46 | 38.0 | 40.83 | 25.0 | 25.04 | 166.6 | 44.96 |
| 12 | වීරකැටිය | අනුමත ගණන/ප්‍රතිපාදන මුදල | 96 | 475367.80 | 0 | 0.00 | 6 | 163000.00 | 4 | 45050.00 | 106 | 583417.80 |
| | | ක්‍රියාත්මක/ආරම්භකර ඇති | 96 | [redacted] | 0 | [redacted] | 6 | [redacted] | 4 | [redacted] | 106 | 0.00 |
| | | අවසන් ගණන/ගෙවා ඇති මුදල | 78 | 470200.00 | 0 | | 4 | 43000.00 | 2 | 29700.00 | 84 | 542900.00 |
| | | භෞතික /මූල්‍ය ප්‍රගතිය(%) | 81.3 | 98.91 | 0.0 | 0.00 | 66.7 | 68.25 | 50.0 | 65.93 | 197.9 | 93.06 |
| | එකතුව | අනුමත ගණන/ප්‍රතිපාදන මුදල | 1414 | 11005904.50 | 125 | 1098023.90 | 581 | 7613430.00 | 286 | 2972892.25 | 2406 | 22690250.65 |
| | | ක්‍රියාත්මක/ආරම්භකර ඇති | 1121 | [redacted] | 94 | [redacted] | 502 | [redacted] | 227 | [redacted] | 1944 | 2142650.85 |
| | | අවසන් ගණන/ගෙවා ඇති මුදල | 710 | 6724523.75 | 36 | 354149.94 | 322 | 4136966.85 | 141 | 1639550.00 | 1209 | 12855190.54 |
| | | භෞතික /මූල්‍ය ප්‍රගතිය(%) | 50.2 | 61.10 | 28.8 | 32.25 | 55.4 | 54.34 | 49.3 | 55.15 | 183.7 | 56.66 |

පාලන අංශය
29 DEC 2010
ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## ගම නැගුම /සමෘද්ධි ග්‍රාම නිළධාරී වසම් 3060යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන - 2010

අනුමත ව්‍යාපෘති ලේඛණය

දිස්ත්‍රික්කය - හම්බන්තොට

| ව්‍යා. සංඛ්‍යාව | ප්‍රා.ලේ.කො | කළාපය | ග්‍රාම නිළධාරී වසම | ව්‍යාපෘතියේ නම හා පිහිටීම | ඇස්තමේන්තු මුදල | අනුමත මුදල (රු.) | ප්‍රතිලාභී පවුල් ගණන |
|---|---|---|---|---|---|---|---|
| 1 | තිස්සමහාරාමය | පන්නගමුව | ඇල්ලගල | ඇල්ලගල කුරුළුගම ගම්මානයේ ඇළ මාර්ගවල කොන්ක්‍රීට් පිලි යොදා ප්‍රතිසංස්කරණය කිරීම | 650,000 | 500,000 | 41 |
| 2 | | | පන්නගමුව | දියඹැදිය සයිෆන් එක අසලින් පටන්ගෙන හැළඹාන මුඩබිම් විරවිල වැවට ඇලමාර්ගයේ රෙගියුලේටරය සකස් කිරීම | 800,000 | 500,000 | 250 |
| 3 | | | මෝලකැප්‍රපතාන | ප්‍රජාශාලාව අසල කෙත් ඇළෙහි පැතිබැම්ම ඉදිකිරීම | 700,000 | 500,000 | 40 |
| 4 | | අකුරුගොඩ | උදුඩගන්දර | කරුවලගස් වැව තැනීම | 750,000 | 500,000 | 35 |
| 5 | | | ජුල්පල්ලම | කොඩිගහවැවේ ඇල මාර්ගය දීර්ඝ කිරීම | 650,000 | 500,000 | 15 |
| 6 | | | වැලිපොතේවල | සූරිය ඉඩම L.K ජයසේන නිවස ඉදිරිපිට කෘෂි ඇළ මාර්ගයේ පැතිබැම්ම ඉදිකිරීම | 700,000 | 500,000 | 55 |
| 7 | | උඩුවිල | තිස්සපුර | තිස්සපුර සමෘද්ධි වැව ප්‍රතිසංස්කරණය කිරීම | 700,000 | 500,000 | 60 |
| 8 | | | සාලියපුර | පඬුගස්වැවේ ගොඩදොර සිට සිට වල දොර දක්වා කෘෂි ඇලක් ඉදි කිරීම | 725,000 | 500,000 | 40 |
| 9 | | | විජයපුර | පියදාස රූබසිංහ නිවස අසල සිට බැමිණියාව කුඹුරුගහයාය දක්වා කෘෂි ඇල මාර්ගයේ පැතිබැම්ම ඉදි කිරීම | 700,000 | 500,000 | 50 |
| 9 | | | එකතුව | | 6,375,000 | 4,500,000 | 586 |
| 1 | සූරියවැව | සූරියවැව | මහගල්වැව | මහගල්වැව ඩී 02 අංක 03 ඇල ප්‍රතිසංස්කරණය කිරීම | 625,000 | 500,000 | 40 |
| 2 | | | විරියගම | උස්කණ්ඩිය අමුණ ඇල පද්දතිය සකස් කිරීම | 325,000 | 250,000 | 150 |
| 3 | | සූරියවැව | විරියගම | සියඹලේ අමුණ ප්‍රතිසංස් කරණය කිරීම | 325,000 | 250,000 | 65 |
| 4 | | | ඉහළකුඹුක්වැව | ඉහළකුඹුක්වැව වැව් කණ්ඩිය ප්‍රතිසංස්කරණය කිරීම හා දොර සකස් කිරීම | 500,000 | 425,000 | 50 |
| 4 | | | එකතුව | | 1,775,000 | 1,425,000 | 305 |

## ගම නැගුම /සමෘද්ධි ග්‍රාම නිළධාරී වසම් 3060යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන - 2010

අනුමත ව්‍යාපෘති ලේඛණය

දිස්ත්‍රික්කය - හම්බන්තොට

| ව්‍යා. සංඛ්‍යාව | ප්‍රා.ලේ.කො | කළාපය | ග්‍රාම නිළධාරී වසම | ව්‍යාපෘතියේ නම හා පිහිටීම | ඇස්තමේන්තු මුදල | අනුමත මුදල (රු.) | ප්‍රතිලාභී පවුල් ගණන |
|---|---|---|---|---|---|---|---|
| 1 | අම්බලන්තොට | බෝලාන | බෝලාන උතුර | වලවෙ ගඟෙන් ජලය ලබාගෙන වගා කිරීම (මෝටර්ගෙය මෝටරය බට ලබා ගැනිම) | 650,000 | 500,000 | 22 |
| 2 | | | කොග්ගල්ල | දෙවන පැරකුම් මාවත කෘෂිජල ව්‍යාපෘතිය(බට ලබා ගැනිම,මෝටරය ලබා ගැනිම,නිවෙස් සඳහා වැලි ලබා ගැනිම | 630,000 | 500,000 | 14 |
| 3 | | | මොදරපිළිවල | මහ ඇලෙන් ජලය පොම්මකර වගා කිරීම | 500,000 | 500,000 | 30 |
| 4 | | නෝනගම | ලුණම දකුණ | ලුණම දකුණ කලපුවේ සිට කපන ලද ඇලෙහි පාර පැත්තේ පැතිබැම්ම බැදීම | 1,000,000 | 500,000 | 46 |
| 5 | | | බැමිණියන්විල | අක්කර 08 ඩි. 1 ඇළහි පැති බැම්ම ඉදි කිරීම | 700,000 | 500,000 | 50 |
| 6 | අම්බලන්තොට | නෝනගම | පුහුල්යාය | පුහුල් යාය ගුණසේකර යායේ වැඩි වතුර බැස්සවීමට පිල්ලක් ඉදි කිරීම | 800,000 | 500,000 | 100 |
| 7 | | මාමඩල | මාමඩල උතුර | නුගේවෙල උස්සාන කෘෂි ව්‍යාපෘතිය | 650,000 | 500,000 | 20 |
| 8 | | | ජංසගම | පහල ජංසගම උස්සාන ජල ව්‍යාපෘතිය | 750,000 | 500,000 | 10 |
| 9 | | | රොටේ | රාජපක්ෂ ගොවිපලේ ඩී 78 සී 48 ඇලෙහි පැති බැම්ම, සබත්තු බෝක්කුව හා සිලින්ඩර බෝක්කුව ඉදිකිරීම | 600,000 | 480,000 | 10 |
| 10 | | හුංගම | ඇත් බටුව | ඇත් බටුව වැඩ ආශ්‍රිතව උස්සාන ජල ව්‍යාපෘතිය | 600,000 | 500,000 | 20 |
| 11 | | | මිණිඇතිලිය | හාතාගල ගොඩ ඇළ ප්‍රතිසංස්කරණය කිරීම | 650,000 | 500,000 | 150 |
| 12 | | හුංගම | එරමිණියාය | ධනපාල කඩය අසල යාය 15 ඇල පැති බැම්ම ඉදිකිරීම | 650,000 | 500,000 | 140 |
| 12 | | | එකතුව | | 8,180,000 | 5,980,000 | 612 |
| 1 | කටුවන | මිද්දෙනිය | මිද්දෙනිය උතුර | මිද්දෙනිය උතුර වැවේ පිටවාන හා පාලම සකස් කිරීම | 650,000 | 500,000 | 50 |
| 2 | | | හෙලල්ල | හෙලල්ල මහවැව හාරා ප්‍රතිසංස්කරණය කිරීම | 600,000 | 500,000 | 20 |

## ගම නැගුම /සමෘද්ධි ග්‍රාම නිළධාරී වසම් 3060යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන - 2010

අනුමත ව්‍යාපෘති ලේඛණය

දිස්ත්‍රික්කය - හම්බන්තොට

| ව්‍යා. සංඛ්‍යාව | ප්‍රා.ලේ.කො | කලාපය | ග්‍රාම නිළධාරී වසම | ව්‍යාපෘතියේ නම හා පිහිටීම | ඇස්තමේන්තු මුදල | අනුමත මුදල (රු.) | ප්‍රතිලාභි පවුල් ගණන |
|---|---|---|---|---|---|---|---|
| 3 | කටුවන | කටුවන | රණසිංහගොඩ | මියනකොළයාය අමුණ ප්‍රතිසංස්නරණය කිරීම | 650,000 | 500,000 | 20 |
| 4 | | වැලිපිටිය | තල්වත්ත | පල්ලෙදෙනිය වැව් කණ්ඩිය ප්‍රතිසංස්කරණය කිරීම | 600,000 | 500,000 | 20 |
| 5 | | මැදකන්ද | උඩවෙල්මුල්ල | වලමග අමුණ ප්‍රතිසංස්කරණය කිරීම | 300000 | 200000 | 8 |
| 5 | | එකතුව | | | 2,800,000 | 2,200,000 | 118 |
| 1 | තංගල්ල | වතාරන්දෙනිය | තලපිටියගම | ගල්පොත්ත වැව ප්‍රතිසංස්කරණය 11 | 600,000 | 500,000 | 100 |
| 2 | තංගල්ල | වතාරන්දෙනිය | නලගම නැ/හිර | විලේ අමුණ සිට ඉහලට කිරමඔය ඉස්වැටිය ප්‍රතිසංස්කරණය සහ විලේ අමුණ පහල කොටස ප්‍රතිසංස්කරණය කිරීම | 600,000 | 500,000 | 80 |
| 3 | | | විතාරන්දෙනිය දකුණ | ඉදල් ආරේ වැව ප්‍රතිසංස්කරණය කිරීම | 600,000 | 500,000 | 25 |
| 4 | | නෙටොල්පිටිය | පට්ටියපොල දකුණ | මහවැව යකඩ කාණුව අසල ඇල මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 600,000 | 500,000 | 40 |
| 5 | | | මැදගම | පොල්මොටේ අමුණට යන පාර අසල ඇලේ පැතිබැම්ම ඉදිකිරීම 11 අධියර | 600,000 | 500,000 | 80 |
| 6 | තංගල්ල | නෙටොල්පිටිය | පට්ටියපොල බටහිර | මුකලන්යාය මහබුරුත වැව හාරා ප්‍රතිසංස්කරණය කිරීම | 600,000 | 500,000 | 150 |
| 7 | | රන්න | වාඩිගල | වී වැපුරූ ආර වැව පැතිබැම්ම සකස් කිරීම | 300,000 | 300,000 | 63 |
| 8 | | | | වලව් මහත්තයාගේ ආර වැව සොරොව්ව සකස් කිරීම | 300,000 | 200,000 | 50 |
| 9 | | | වැල්ලෝඩය | හතුපිටිය වැව හැරී හැරීම හා සොරොව්ව සකස් කිරීම 11 අධියර | 600,000 | 500,000 | 45 |
| 10 | | | රන්න නැගෙනහිර | හිගරු වැව ප්‍රතිසංස්කරණය කිරීම | 600,000 | 500,000 | 100 |
| 11 | | තංගල්ල | කදුරුපොකුණ බටහිර | ඉහළගොඩ ප්‍රදේශයේ පිහිටි ජුල්ගහ වැවේ පිටවාන සකස් කිර වැව හැරීම | 600,000 | 500,000 | 75 |
| 12 | | තංගල්ල | පොළොම්මාරුව උතුර | දංවැව ප්‍රතිසංස්කරණය | 600,000 | 500,000 | 150 |
| 12 | | එකතුව | | | 6,600,000 | 5,500,000 | 958 |

## ගම නැගුම /සමෘද්ධි ග්‍රාම නිළධාරී වසම් 3060යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන - 2010

අනුමත ව්‍යාපෘති ලේඛණය

දිස්ත්‍රික්කය - හම්බන්තොට

| ව්‍යා. සංඛ්‍යාව | ප්‍රා.ලේ.කො | කලාපය | ග්‍රාම නිළධාරී වසම | ව්‍යාපෘතියේ නම හා පිහිටීම | ඇස්තමේන්තු මුදල | අනුමත මුදල (රු.) | ප්‍රතිලාභි පවුල් ගණන |
|---|---|---|---|---|---|---|---|
| 1 | ලුණුගම්වෙහෙර | දෙවිරම්වෙහෙර | උඩමත්තල | උඩමත්තල වැවේ වාන් දොරටුව ප්‍රතිසංස්කරණය කිරීම | 300,000 | 300,000 | 175 |
| 2 | | | අගුණකොළවැව | මහවැවේ ඇලෙහි කැඩුණු බුදුණු ස්ථාන සකස් කිරීම | 250,000 | 200,000 | 130 |
| 3 | | | | අගුණකොළවැවෙහි ස්පිල් එක සකස් කිරීම | 170,000 | 150,000 | 50 |
| 4 | | වීරවිල | වීරවිල | වීරවිල නව නගරයේ පළමුවන පටුමගේ අංක 96 නිවස අසල කෘෂි ළිද ඉදි කිරීම | 500,000 | 250,000 | 20 |
| 5 | | බෙරලිහෙල | දුටුගැමුණුපුර | ඩී.සී.1 බෙදුම්ඇල පි.සී.කෙත් ඇල පැතිබැම්ම සකස් කිරීම හා පස් පිරවීම | 700,000 | 500,000 | 60 |
| 6 | | වීරවිල | මුවන්වැව | මුවන්වැව වසමේ ජනසවි ගම්මානය හා කුරුළු ගම්මානය යන දෙක සදහා පානිය ජලය ලබා ගැනිමට ජලනල එළිම | 500,000 | 100,000 | 75 |
| 6 | | එකතුව | | | 2,420,000 | 1,500,000 | 510 |
| 1 | බෙලිඅත්ත | | කුඩාහිල්ල/දකුණ | දංගහමුලන පොල්ගහ දෙනිය කුඹුරුයායේ පිට ඇලට පැතිබැම්ම ඉදි කිරීම | 500,000 | 500,000 | 35 |
| 2 | | බෙලිගල්ල | බෙලිගල්ල උතුර | යක්වැවේ වැව් බැම්ම අසල පැති බැම්ම බැදිම සහ දකුණු ඇල මාර්ගය හියුම් පයිප්ප දමා සකස් කිරීම, පෝ ඉදි කිරීම සහ වැවේ ආරක්ෂිත වැටක් ඉදි කිරීම | 650,000 | 500,000 | 35 |
| 3 | | | පල්ලත්තර නැ/හිර | අලුත් වැව යටතේ පවතින වම් ඇල ඉවුර පැති බැම්ම ඉදි කිරීම | 650,000 | 500,000 | 90 |
| 4 | | බෙලිගල්ල | පල්ලත්තර දකුණ | දේවමැදගොඩ වෙල් යාය අසල වගා ලිදක් ඉදි කිරීම | 600,000 | 250,000 | 25 |
| 5 | | බෙලිඅත්ත | සිටිනමළුව උතුර | කපුලන්දගොඩ මහවැව ඇල මාර්ගය පැති බැම්ම ඉතිරි කොටස ඉදි කිරීම | 600,000 | 500,000 | 25 |
| 6 | | බෙලිඅත්ත | ඔවිලාන | අහනගහ වත්ත අමුණ ප්‍රතිසංස්කරණය කිරීම | 600,000 | 500,000 | 2 |

## ගම නැගුම /සමෘද්ධි ග්‍රාම නිළධාරී වසම් 3060යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන - 2010

අනුමත ව්‍යාපෘති ලේඛණය

දිස්ත්‍රික්කය - හම්බන්තොට

| ව්‍යා. සංඛ්‍යාව | ප්‍රා.ලේ.කො | කළාපය | ග්‍රාම නිළධාරී වසම | ව්‍යාපෘතියේ නම හා පිහිටීම | ඇස්තමේන්තු මුදල | අනුමත මුදල (රු.) | ප්‍රතිලාභි පවුල් ගණන |
|---|---|---|---|---|---|---|---|
| 7 | බෙලිඅත්ත | ගැටමාන්න | අඹගස්දෙනිය | දොඹගහකුඹුර කෙත් ඇල පැතිබැම්ම සකස් කිරීම | 600,000 | 500,000 | 36 |
| 8 | | නිහිළුව | අරංවෙල බටහිර | පාසල ඉදිරිපිට මාර්ගයේ පණුගල්ආර කුඹුරුයායට කෘෂි ලිදක් ඉදි කිරීම | 400,000 | 250,000 | 10 |
| 9 | | ගැටමාන්න | ගැටමාන්න/උ | එදිරිසිංහ මාවතේ තුප්පදෙනිය වෙල්යාය පැතිබැම්ම ඉදි කිරීම | 550,000 | 500,000 | 85 |
| 10 | | නිහිළුව | තාරපේරිය | කරුවලගහහේන් ගොඩ සමෘද්ධි සමිතියේ බැද්දමුලන කුඹුරට පැතිබැම්මක් ඉදිකිරීම | 600,000 | 500,000 | 150 |
| 10 | | එකතුව | | | 5,750,000 | 4,500,000 | 493 |
| 1 | ඕකෙවෙල | ඕකෙවෙල | බටහිර කඩිගමුව | සලමන් මුදලාලිගේ නිවස ඉදිරිපිට කුඹුරුයායේ ඇල මාර්ගයට පැතිබැම්ම ඉදි කිරීම | 700,000 | 500,000 | 75 |
| 2 | | | ඕකෙවෙල | අලුත්වැව්ගොඩ රඹුක් වැවේ රොන් මඩ ඉවත් කිරීම | 800,000 | 500,000 | 40 |
| 3 | | | වාව්ව | දික්වැල්ලෙගෙ දෙනිය වැව ප්‍රතිසංස්කරණය | 700,000 | 500,000 | 20 |
| 3 | | එකතුව | | | 2,200,000 | 1,500,000 | 135 |
| 1 | වීරකැටිය | කැප්පෙටියාව | බටහිර මුල්ගිරිගල | මුල්ගිරිගල ගොඩ නිල්මලාදෙනියකුඹුර අසල ඇනිකට් එකක් හා පැතිබැම්ම ඉදිකිරීම | 685,000 | 500,000 | 13 |
| 2 | | | බටහිර අතුබොදේ | ගොඩපුරන් ඇල පෝටාව පැතිබැම්ම සකස් කිරීම | 650,000 | 500,000 | 35 |
| 3 | | වීරකැටිය | මුල්ගිරිගල නැ/හිර | පහල කොරටුව අසල වෙල්යායේ පෝටාව හා ඇල මාර්ගය සකස් කිරීම | 650,000 | 500,000 | 20 |
| 4 | | වීරකැටිය | මුල්ගිරිගල දකුණ | කුඩා කඩවල කුඹුරුයාය සඳහා ජලය ලබා ගන්නා ඇල මාර්ගය හාරා සකස් කිරීම | 650,000 | 500,000 | 15 |
| 5 | | | මැදගොඩ | මැදගොඩ වෙල්යායට යාබද තල්ගස් ආර වැව හැරීම හා පැතිබැම්ම සෑදීම | 500,000 | 500,000 | 20 |
| 6 | | | මොරයාය දකුණ | FC 11,13,16 ඇලවේල්ල සකස් කිරීම | 625,000 | 500,000 | 94 |

## ගම නැගුම /සමෘද්ධි ග්‍රාම නිළධාරී වසම් 3060යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන - 2010

අනුමත ව්‍යාපෘති ලේඛණය

දිස්ත්‍රික්කය - හම්බන්තොට

| ව්‍යා. සංඛ්‍යාව | ප්‍රා.ලේ.කො | කළාපය | ග්‍රාම නිළධාරී වසම | ව්‍යාපෘතියේ නම හා පිහිටීම | ඇස්තමේන්තු මුදල | අනුමත මුදල (රු.) | ප්‍රතිලාභි පවුල් ගණන |
|---|---|---|---|---|---|---|---|
| 7 | වීරකැටිය | ගෝණදෙනිය | කළුවගහයාය | පුහුල්ලවැව හැරීම (වී.ඕ.ගුණදාස මහතාගේ නිවස අසල) | 600,000 | 500,000 | 30 |
| 8 | | ගෝණදෙනිය | වැකදවල දකුණ | ඕ 9 ඇලේ අංක 125 කෙත් ඇලේ සිට 126 කෙත් ඇල දක්වා දෙපැත්ත දක්වා දෙපැත්ත පැත් බැම්ම සැකසීම | 600,000 | 500,000 | 165 |
| 9 | | | දකුණු කුඩාබිබුල | කුඹුරුයාය සඳහා ජලය ලබා දෙන ඇල මාර්ගයේ දෙපස පැතිබැම්ම ඉදි කිරීම | 600,000 | 500,000 | 80 |
| 10 | | | නැ/කිංචිගුනේ | වැව්පැළැස්ස වැව ප්‍රතිසංස්කරනය කිරීම හා කුඹුරුයායට වතුර බසින ඇල මාර්ගය පැතිබැම්ම සකස් කිරීම | 600,000 | 500,000 | 45 |
| 11 | | | බට/කිංචිගුනේ | උලකැපුහේන ඇල මාර්ගය පැතිබැම්ම ඉදි කිරීම | 600,000 | 500,000 | 30 |
| 12 | | ජුලම්පිටිය | ඔකඳයාය බට. | මැකිලිය වැව හැරීම | 600,000 | 500,000 | 45 |
| 13 | | | ඔකඳයාය උ. | කුඹුකේ වැව හැරීම හා කණ්ඩිය සකස් කිරීම | 600,000 | 500,000 | 85 |
| 13 | | එකතුව | | | 7,960,000 | 6,500,000 | 677 |
| 1 | වලස්මුල්ල | ජුලම්පිටිය | ජුලම්පිටිය | තිහවගෙදර කෘෂි ලිදක් ඉදි කිරීම | 600,000 | 250,000 | 6 |
| 2 | | වලස්මුල්ල | යහල්මුල්ල | ඇත්දත්කුඹුර වෙල්යායෙහි ඇල මාර්ග ෂඳහා පැති බැම්ම ඉදි කිරීම (මීටර් 200) | 600,000 | 500,000 | 36 |
| 3 | | වලස්මුල්ල | බෝවල බටහිර | පන්සලේවත්ත කුඹුර සිට කපි හැද්ම දක්වා ඇල මාර්ගයට පැති බැම්මක් ඉදි කිරීම අඩි 200 | 600,000 | 500,000 | 90 |
| 4 | | කැප්පෙටියාව | නැගෙනහිර ඕමාර | ඔලියමාර වැව ප්‍රතිසංස්කරණය කිරීම | 600,000 | 500,000 | 34 |
| 5 | | වලස්මුල්ල | වලස්මුල්ල ඉහල | දෙයියනෙමුල්ල කුඹුරු යායේ පැතිබැම්ම සකස් කිරීම දිග අඩි 200 | 600,000 | 500,000 | 75 |
| 5 | | එකතුව | | | 3,000,000 | 2,250,000 | 241 |

## ගම නැගුම /සමෘද්ධි ග්‍රාම නිළධාරී වසම් 3060යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන - 2010

අනුමත ව්‍යාපෘති ලේඛණය

දිස්ත්‍රික්කය - හම්බන්තොට

| ව්‍යා. සංඛ්‍යාව | ප්‍රා.ලේ.කො | කලාපය | ග්‍රාම නිළධාරී වසම | ව්‍යාපෘතියේ නම හා පිහිටීම | ඇස්තමේන්තු මුදල | අනුමත මුදල (රු.) | ප්‍රතිලාභි පවුල් ගණන |
|---|---|---|---|---|---|---|---|
| 1 | අඟුණකොලපැලැස්ස | උඩයාල | මැදයාල | ගුන්නකුඹුර අමුණේ දකුණ ඉවුරේ 2වන කෙත් ඇල කොන්ක්‍රීට් කිරීම | 700,000 | 500,000 | 25 |
| 2 | | උඩයාල | අත්තනයාල බටහිර | කිරිමැටිආර වැව ඉදිරිපිට කුඹුරුයායට ජලය ලබා ගැනීමේ ප්‍රධාන ඇල මාර්ගයට පැතිබැම්ම ඉදි කිරීම (මී. 100) | 620,000 | 500,000 | 65 |
| 3 | | හකුරුවෙල | ඉදිගැටවෙල | ගොඩගම යාය ඇලට පැතිබැම්ම සකස් කිරීම | 700,000 | 500,000 | 150 |
| 4 | | | නෙවලපෝරුව | කනුකැටි බද්දුවෙල ඇලෙහි පැතිබැම්ම හා ඇනිකට් එක ඉදි කිරීම | 700,000 | 500,000 | 60 |
| 5 | | හකුරුවෙල | ජුලමුල්ල | කරවි ගහ වැවෙන් එන මාර්ගයේ ඇනිකට් එක ඉදිකර පැති බැම්ම සහිතව ඇල මාර්ගය හා වේල්ල සකස් කිරීම. | 700,000 | 500,000 | 22 |
| 6 | | | ජදුර | ගොවිහමුදා ගමේ කෘෂි ඇල මාර්ගයේ පැති බැම්ම සකස් කිරීම | 425,000 | 300,000 | 25 |
| 7 | | | ජදුර | යාය 18 ඩී.එප්.සී .1කෘෂි ඇල මාර්ගයේ පැති බැම්ම ඉදිකර පස් දමා සකස් කිරීම | 250,000 | 200,000 | 96 |
| 8 | | අඟුණකොළපැළැස්ස | මැටිගත්වල | Xe 3 ඇලෙහි පැතිබැම්ම ඉදි කිරීම | 420,000 | 400,000 | 45 |
| 9 | | අඟුණකොළපැළැස්ස | ආචාරියගම | ආචාරියගම බෝක්කුව අසල කුණු ආර හරස් කර වේල්ල සකස් කිරීම | 600,000 | 500,000 | 37 |
| 10 | | | අමරතුංගගම | පුංචිවැව අසල කුණුආර ඇල සකස් කිරීම | 600,000 | 500,000 | 60 |
| 11 | | තලාව | දෙබොක්කාව දකුණ | දෙබොක්කාව ග්‍රාම නිළධාරී කාර්යාලය අසල පහල වැව ප්‍රතිසංස්කරණය කිරීම | 700,000 | 500,000 | 64 |
| 12 | | තලාව | දබරුල්ල දකුණ | කරමැටිය ප්‍රදේශයේ පානිය ළිඳ අසල කෘෂි ළිඳ සකස් කිරීම | 700,000 | 250,000 | 25 |
| 13 | | තලාව | දබරුල්ල දකුණ | දබරුල්ල කරමැටිය දක්වා යන පාසල් මාවතෙහි සමෘද්ධ ළිඳ අසල පාරෙන් කුඹුරු | 400,000 | 250,000 | 95 |
| 13 | | එකතුව | | | 7,515,000 | 5,400,000 | 769 |
| 192 | | මුළු එකතුව | | | 54,575,000 | 41,255,000 | 5,404 |

## සමෘද්ධි ග්‍රාම නිලධාරී වසම් 3060 හි කඩිනම් යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන 2010
## හම්බන්තොට දිස්ත්‍රික්කය

| ප්‍රා.ලේ.කො. | වසම | ව්‍යාපෘතියේ නම හා පිහිටීම | ඇස්තමේන්තු මුදල රු | අනුමත මුදල (රු.) |
|---|---|---|---|---|
| වීරකැටිය | ගල්පොත්තයාය/ද | පගේ කණුව අසල සිට කැටකාල කඩේ දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | ඕකන්දයාය/උතුර | පාලු පන්සල පාර ගලගම ගෙදර අසල සිට ගෝණදෙනිය ගෙදර දක්වා මාර්ගය කොන්ක්‍රට කිරීම | 600,000.00 | 500,000.00 |
| | ඕකන්දයාය/බටහිර | වැවේ හන්දියේ සිට බබුල සක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | දකුණ කුඩා බබුල | සේරුගොඩවත්ත හන්දියේ ගෙදර දක්වා ඇති කෘෂි මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | බටහිර කිංචිගුණේ | බටහිර කිංචිගුණේ ඕවිලාන වැව දක්වා උල කැපුහේන කෘෂි මාර්ගය කොන්ක්‍රට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | න/ කිංචිගුණේ | හාල්පන්දෙනිය ගෙදර ළග සිට ඇති කෘෂි පාර කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | උ/ බුද්ධියාගම | බදුවත්ත තේක්ක මණ්ඩිය පාර කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | බ/මුල්කිරිගල | සමගිපුර පාර කොන්ක්‍රීට් කිරීම දෙවන අදියර | 600,000.00 | 500,000.00 |
| | බ/අතුබෝදේ | උඩහ කණුකැටිය වැව හැරීම | 600,000.00 | 500,000.00 |
| | කළුවගහයාය | කෘෂි ළිදට යන කුමානායක මාවත කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | මොරයාය දකුණ | ඩී අට සිට ගජනායක ගම දක්වා ඇල මාරගයේ මොරයාය දකුණ අඩ 13 ඒදණ්ඩ අසල පාලම ඉදි කිරීම | 600,000.00 | 500,000.00 |
| | වැකදවල දකුණ | සේන මහතාගේ නිවස අසල සිට ඇල බන්ට් එක සක්වා කෘෂි මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | ද/ මුල්කිරිගල | බිසෝගල ආරණ්‍යයට යන පාර කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | මැදගොඩ | වලකන්ද ගෙදර අසල සිට කෘෂි මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | 670,000.00 | 500,000.00 |
| | නැ/ මුල්කිරිගල | පාලංකඩ සෞඛ්‍ය මධ්‍යස්ථානය අසල මලපලා කන්ද පාර කොන්ක්‍රීට් කිරීම | 670,000.00 | 500,000.00 |
| අම්බලන්තොට | බැමණියන්වල | හංගන්වගුර ඩී2 ඇලේ පැතිබැම්ම හා නාන තොටුපල සකස් කිරීම | 700,000.00 | 500,000.00 |

**සමෘද්ධි ග්‍රාම නිලධාරී වසම් 3060 හි කඩිනම් යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන 2010**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

| ප්‍රා.ලේ.කො. | වසම | ව්‍යාපෘතියේ නම හා පිහිටීම | ඇස්තමේන්තු මුදල රු | අනුමත මුදල (රු.) |
|---|---|---|---|---|
| | ලුනම දකුණ | රජසරණගම ඒ.පී. චන්ද්‍රසේන මහතාගේ නිවස අසල සිට මීටර 100ක් පාර කොන්ක්‍රීට් කිරීම | 700,000.00 | 500,000.00 |
| | පුහුල්යාය | පුහුල්යාය බොරලුවලපාර පස් පුරවා පැතිබැම්ම ඉදිකර පාර කොන්ක්‍රට් කිරීම | 300,000.00 | 200,000.00 |
| | පුහුල්යාය | පුහුල්යාය සුමිත් මහතාගේ කඩය අසලින් යන තොටුපල පාර කොන්ක්‍රීට් කිරීම | 400,000.00 | 300,000.00 |
| | රොටේ | වැව මාවත පැතිබැම්ම ඉදි කිරීම | 700,000.00 | 500,000.00 |
| | ජංසගම | ජංසගම සිරිදියස් මුදලාල්ගේ කඩය අසල මාරගය කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | මාමඩල උතුර | මාමඩල වැව අසලින් පටන් ගන්නා නුගේවල පාර කොන්ක්‍රීට කිරීම | 700,000.00 | 500,000.00 |
| | එරමිණියාය | ගාලබැදිවැව කෘෂිපාර කොන්ක්‍රට් කිරීම | 700,000.00 | 500,000.00 |
| | ඇත්බටුව | යාය11පානීය ළිද ඉදි කිරීම හා කිරිමැටය පානීය ළිද ඉදිකිරීම | 700,000.00 | 500,000.00 |
| | මණිඇතිලිය | පිට්ටනිය කෘෂිවේල්ල පාර කොන්ක්‍රීට් කිරීම | 700,000.00 | 500,000.00 |
| | මොදරපිළිවල | ඔවිලාන පාර ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | 700,000.00 | 500,000.00 |
| | බෝලාන උතුර | කොග්ගල්ලආර බස්නාවෙන් වතුර පොම්පකර වගා කිරීම | 700,000.00 | 500,000.00 |
| | කොග්ගල්ල | කොග්ගල්ල ගල්කන්ද පාර කොන්ක්‍රීට් කිරීම | 700,000.00 | 500,000.00 |
| අඟුණකොලපැලැස්ස | ඉදිගැටවෙල | ගොඩිගම යාය මාරගයේ යට පැත්තේ පැති බැම්ම ඉදි කිරම, ඉදිගැටවෙල ප්‍රජා ජල ව්‍යාපෘතියේ ජතිරි වැඩ නිම කිරීම, මීටර1000ක් දුරටජලනල එලීම,ළිදට වැංකියට ආවරණ සැකසීම, සියලු උපාංග ෂහිත ජල මීටර සවි කිරීම | 700,000.00 | 500,000.00 |
| | දෙබොක්කාව උතුර | හිග්ගහවත්ත ළගට සිලින්ඩර බෝක්කුවක් සකස් කිරීම | 63,999.99 | 51,385.70 |
| | | ආර්.බී.දියෝනිස්ගේ නිවස අසල සිලින්ඩර බෝක්කුවක් ඉදි කිරීම | 96,115.33 | 77,424.24 |
| | | ඩී.එල් ආරියදාසගේ නිවස අසලට සිලින්ඩර බෝක්කුවක් ඉදි කිරීම | 63,999.99 | 51,385.70 |
| අඟුණකොලපැලැස්ස | | පාරවත්ත ළිද අසල සපත්තු පාලම ඉදි කිරීම | 124,059.98 | 120,434.97 |

**සමෘද්ධි ග්‍රාම නිලධාරී වසම් 3060 හි කඩිනම් යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන 2010**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

| ප්‍රා.ලේ.කො. | වසම | ව්‍යාපෘතියේ නම හා පිහිටීම | ඇස්තමේන්තු මුදල රු | අනුමත මුදල (රු.) |
|---|---|---|---|---|
| | | පල්ලෙවෙල මාරගය සපත්තු පාලම ඉදි කිරීම | 124,059.98 | 120,434.97 |
| | | ඩබ්ගලීලාවතී මියගේ නිවස අසල සිලින්ඩර් බෝක්ක- ඉදි කිරීම | 53,189.91 | 51,782.14 |
| | දෙබොක්කාව දකුණ | දෙබොක්කාව ඉදිරිපිට ඉහල වැව ප්‍රතිසංස් කරණය කිරීම | 700,000.00 | 500,000.00 |
| | ජදුර | බටඅත ඇලේ පී.ජේමාවතී මහත්මියගේ නිවස අසල මගී පාලම | 700,000.00 | 500,000.00 |
| | ජුල්මුල්ල | ජුලමුල්ල තුප්පහිගම ඉදල්ආර වැවේ රොන්මඩ ඉවත් කර වැව් කණ්ඩිය සකස් කිරීම | 650,000.00 | 500,000.00 |
| | නෙටලපෝරුව | කොස් ගස් හන්දියේ සිට ඌරුබොකු ව්‍යාපාරයේ නෙටලපෝරුව කුඹුරු යාය දක්වා ඇති කෘෂිපාර කොන්ක්‍රීට් කිරීම | 650,000.00 | 500,000.00 |
| | මැදයාල | දංගස්ආර වැව පුලුල් කිරීම හා පිටවාන සැකසීමසහ එම මාරගයේ සිළිණ්ඩර බෝක්කුවක් ඉදි කිරීම | 700,000.00 | 500,000.00 |
| | 217 අත් බටහිර | බදූම කඩුල්ල ඉස්මත්තේ ඇති කුඹුරු යායේ ප්‍රධාන ඇළ මාරගය පිළිසකර කිරීම | 700,000.00 | 500,000.00 |
| | අමරතුංගම | ගුරුගොඩැල්ල ගොවිපල අසල කෘෂි පාර කොණ්ක්‍රීට් කිරීම | 700,000.00 | 500,000.00 |
| | මැටගත්වල | සුදු වැල් පිට්ටනිය හරහා බෙළිඅත්තගමට යන කෘෂි මාරගය කොණ්ක්‍රීට්කිරීම | 650,000.00 | 500,000.00 |
| | ආචාරියගම | ග්‍රාම සංවරධන මාරගයේ ඉතිරි කොටස කොබ්ක්‍රීට් කිරීම | 700,000.00 | 500,000.00 |
| | දබරැල්ල දකුණ | මහ වැව හැරීම සහ පිටවාන සකස් කිරීම | 900,000.00 | 500,000.00 |
| බෙලිඅත්ත | කම්බුස්සාවල /නැ | සමරසේකර මාවත ගමගේ වත්ත සිට කොන්ක්‍රීට් කිරීම | 606,099.71 | 500,000.00 |
| | අඹගස්දෙනිය | ඉහළගෙදර මාරගය කොන්ක්‍රීට් කිරීම | 608,864.64 | 500,000.00 |
| | ගැටමාන්න උතුර | එදිරිසිංහ මාවත අඹගස්දෙනියේ මාරගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | 608,724.77 | 500,000.00 |
| | බෙළිගල්ල/උ | සිරිවිමලගම මාරලය කොන්ක්‍රීට් කිරීම | 608,970.09 | 500,000.00 |
| | පල්ලත්තර/නැ | අලුත්වැව යටතේ වම් ඉවුර ඇල පැති බැම්ම සකස් කිරීම | 609,050.41 | 500,000.00 |
| | පල්ලත්තර/දකුණ | දේවමැදගොඩ මාරගය කොන්ක්‍රීට් කිරීම | 608,697.43 | 500,000.00 |
| | නාකුලුගමුව බටහිර | සිරිපුර හදපාන්ගොඩැල්ල හරහා කෘෂිපාර කොන්ක්‍රීට් කිරීම | 609,317.25 | 500,000.00 |
| | කුඩාහීල්ල/ දකුණ | මරිස්වත්තමුතුමාල විදුහල අසලත් බාස්ගේ වත්ත පාර කොන්ක්‍රීට් කිරීම | 608,088.96 | 500,000.00 |

**සමෘද්ධි ග්‍රාම නිලධාරී වසම් 3060 හි කඩිනම් යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන 2010**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

| ප්‍රා.ලේ.කො. | වසම | ව්‍යාපෘතියේ නම හා පිහිටීම | ඇස්තමේන්තු මුදල රු | අනුමත මුදල (රු.) |
|---|---|---|---|---|
| | ගලගම නැගෙනහිර | ගල්ළිද්ද හේන පාර කොන්ක්‍රීට් කිරීම | 609,157.10 | 500,000.00 |
| | වඟරක්ගොඩ දකුණ | මුණසිංහගොඩ මාරගය ගෙවත් තිලක ෆොටෝ මාවත කොන්ක්‍රීට් කිරීම | 608,901.50 | 500,000.00 |
| | තාරපේරිය | කරුවලගහහේන්ගොඩ දංගහ කොරටුව අසල කෘෂි ලිද සහ ගමගේ පිටිගොඩ කෘෂි ලිද ඉදි කිරීම | 403,442.22 | 500,000.00 |
| | අරන්වෙල බටහිර | අරංවෙලපාසල ඉදිරිපිට කෘෂිමාරගය කොන්ක්‍රීට් කිරීම | 608,277.05 | 500,000.00 |
| | ඕවිලාන | ඔවිලාන සෞඛ්‍ය මධ්‍යස්ථානය පාර කොන්ක්‍රීට් කිරීම | 609,579.65 | 500,000.00 |
| | සිටිනමළුව උතුර | මහවැවයාය පැතිබැම්ම ඉදිකිරීම | 608,822.77 | 500,000.00 |
| හම්බන්තොට | සීය /උතුර | ඕවිලාන පාර කොන්ක්‍රීට් කිරීම (දෙවන අදියර) | 630,000.00 | 500,000.00 |
| | සිසිලසගම | චිත්‍රාගල මනිපුරගම පාර කොන්ක්‍රීට් කිරීම (දෙවන අදියර) | 650,000.00 | 500,000.00 |
| | සිය/ දකුණ | පාලුමණ්ඩිය පාර කොන්ක්‍රීට් කිරීම ( දෙවන අදියර) | 650,000.00 | 500,000.00 |
| | අරවනමුල්ල | හකුරම්මුල්ල දෙබරගහපාර කොන්ක්‍රීට් කිරීම( දෙවන අදියර) | 650,000.00 | 500,000.00 |
| | කොහොලන්කල | ආරබැද්ද ආරාම මාවත කොන්ක්‍රීට් කිරීම (2 අදියර) | 650,000.00 | 500,000.00 |
| | යහංගල/නැ | උස්සාන ජල යෝජනා ක්‍රමය මගින් ගෙවතු වගා කිරීම (2 අදියර) | 650,000.00 | 500,000.00 |
| | කැලියපුර | විහාර මාවත පාර කොන්ක්‍රීට් කිරීම,2වන අදියර | 620,000.00 | 500,000.00 |
| කටුවන | මිද්දෙනිය/උ | අබේවරණ මාරගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම(1 පටු මග) | 700,000.00 | 500,000.00 |
| | හෙලල්ල | මහවැව මාරගය කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | ආදළුගොඩ | ආදදැළුගොඩ පන්සල අසල මාරගය කොන්ක්‍රීට් කිරීම | 650,000.00 | 500,000.00 |
| | රණසිංහගොඩ | 18 කණුව අසල පාරේ ජේමලතා මහත්මියගේ නිවස අසල කඳු බැවුම හා ඩී නන්දෝරිස් මහතාගේ නිවස අසල කඳු බැවුම කොන්ක්‍රීට් කිරීම | 700,000.00 | 500,000.00 |
| | ඕබඩගහදෙනිය | ඕබඩගහදෙනිය මහගල්ගොඩ මාරගය කොන්ක්‍රීට් කිරීම | 700,000.00 | 500,000.00 |
| | විරක්කුට්ටගොඩ | හිදකරල්දෙනිය හන්දියේ සිට පණුගල්ආර හන්දිය දක්වා මාරගය කොන්ක්‍රීට් කිරීම | 700,000.00 | 500,000.00 |
| | උලහිටියාව බටහිර | ඉඹුලගොඩ මාරගයේ සිට සරවෝදය අසලින් ආරම්භ වන මාරගයට සම්බන්ධ වන කළුගහරොද මාරගය කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |

**සමෘද්ධි ග්‍රාම නිලධාරී වසම් 3060 හි කඩිනම් යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන 2010**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

| ප්‍රා.ලේ.කො. | වසම | ව්‍යාපෘතියේ නම හා පිහිටීම | ඇස්තමේන්තු මුදල රු | අනුමත මුදල (රු.) |
|---|---|---|---|---|
| | තල්වත්ත | තල්වත්ත බොයිලේරුව අසල සිට තල්වත්ත විහාරස්ථානය දක්වා හල්මිල්ලයාය මාරගය කොන්ක්‍රීට් කිරීම | 650,000.00 | 500,000.00 |
| | උලහිටියාව/නැ | උලහියාව ප්‍රාදේශිකය අසලින් ආරම්භ වී උලහිටියාව නැගෙනහිර වසම හරහා ප්‍රධාන මාරගයේ මිද්දෙනියවත්ත අසල සිට ෂල්ගස දක්වා කොන්ක්‍රීට් කිරීම | 650,000.00 | 500,000.00 |
| | බෙංගමුකන්ද | බෙංගමුකන්ද දක්වා දිවෙන මාරගයේ වසම ආරම්භ වන ස්ථානයේ මාරගය කොන්ක්‍රට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | උඩවෙල්මුල්ල | පොල්අතුනගොඩ මාරගය උඩවෙල අසල සිට කඳු සහිත කොටස කොන්ක්‍රීට් කිරීම | 700,000.00 | 500,000.00 |
| | පහළ අලුපොත්දෙනිය | නිවිතිවෙලයාය මාරගයේ කඳු සහිත කොටස අම්බලම සිට කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| ලුනුගම්වෙහෙර | බෝගහවැව | කම්මල් දෙවට පාර කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | අගුණකොළවැව | අගුණකොළවැව පහලින් ඇති කුඹුරු වලට යන පාර කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | උඩමත්තල | ආරණ්‍යපාර කෘෂි මාරගය කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | බෙරළිහෙල | අංක 605 සිට විහාරස්ථානය දක්වා මාරගය ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | 700,000.00 | 500,000.00 |
| | දුටුගැමුණුපුර | ජනසවිගම ප්‍රජාශාලාව දක්වා වූ පාරේ ඉතිරි කොටස ප්‍රජාශාලාව දක්වා කොන්ක:ට් කිරීම | 700,000.00 | 500,000.00 |
| | ජයගම | ජයගම ප්‍රජාශාලාව ඉදිරිපිට කාණුපද්ධතිය හා පැතිබැම්ම ඉදි කිරීම | 600,000.00 | 500,000.00 |
| | වීරවිල | වීරවිල නව නගරයේ මැද පාරේ වතුර දමන ස්ථානයට බෝක්කුවක් දමා දෙපස කාණු පද්දතිය සකස් කොට පාරේ ඉතිරි කොටස කොන්ක්‍රට් කිරීම | 1,000,000.00 | 500,000.00 |
| | ඉත්තන්වැකඩවල | නො 141 ඉඩම ඉදිරිපිට පාරේ ඉදිකරන ලද පැති බැම්ම ඉතිරි ාකොටස නිම කිරීම | 1,000,000.00 | 500,000.00 |

## සමෘද්ධි ග්‍රාම නිලධාරී වසම් 3060 හි කඩිනම් යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන 2010
## හම්බන්තොට දිස්ත්‍රික්කය

| ප්‍රා.ලේ.කො. | වසම | ව්‍යාපෘතියේ නම හා පිහිටීම | ඇස්තමේන්තු මුදල රු | අනුමත මුදල (රු.) |
|---|---|---|---|---|
| | මුවන්වැව | කුරුළු ගම්මානයේ පාර කොන්ක්‍රීට් කිරීම | 700,000.00 | 500,000.00 |
| ඔකේවෙල | ඕකෙවෙල | ජය මාවත ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | බ/කඩිගමුව | කඩිගමුව සමුපකාරය අසල සිට කජ්ජුගස් කොරටුව දක්වා මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | වාවිව | බතලවත්ත සිට පාසල දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | යුහිරිගම | වටරවුම්පාර කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | රාජපුරගොඩ | පණුගල් ඇන්දගේන පාර ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | ගොඩවැන්න | පුහුගහ ලන්ද මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| සූරියවැව | මහපැලැස්ස | මද්දුගේ කඩේ අසල මිදි වගාවට යන පාර ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | 625,000.00 | 500,000.00 |
| | හබරත්තවල | යාන්ත්‍රික කොහු කර්මාන්ත ශාලාව ඉදි කිරීම හා මැෂින් ලබා ගැනීම | 625,000.00 | 500,000.00 |
| | බැද්දෙවැව | බෝපැල අසල සිට නුගේ කන්ද ගම් ඒකකය දක්වා පාරේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | 625,000.00 | 500,000.00 |
| | විරියගම | විරියගම සිරිල් මාවත සිළින්ඩර බෝක්කු ඉදිකිරීම හා පාර ප්‍රතිසංස්කරණය කිරීම | 675,000.00 | 500,000.00 |
| | ඉහලකුඹුක්වැව | එම්.ඒ. සෝමපාල මහතාගේ නිවස අසල සිළින්ඩර බෝක්කව ඉදි කිරීම හා පහල කුඹුක්වැව මිගහජඳුර වැවට යන පාර කොන්ක්‍රීට් කිරීම | 650,000.00 | 500,000.00 |
| | මහගල්වැව | මහසෙන්පුර කෝන්ගහ අසල මාර්ගයේ බෝක්කුව ඉදි කිරීම හා පාර කොන්ක්‍රීට් කිරීම | 675,000.00 | 500,000.00 |
| තංගල්ල | වැලලොඩය | හතුපිටිය වැව හාරා ප්‍රතිසංස්කරණය කිරීම | 601,992.40 | 500,000.00 |
| | රන්න නැ | නෙළුම්වැවට ජලය ගෙන එන ඇල මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රීට් තිරීම | 600,508.37 | 500,000.00 |
| | වාඩිගල | වලව මහත්තයාගේ වැව හැරීම හා පැතිබැම්ම සකස් කිරීම | 600,000.00 | 500,000.00 |
| | මැදගම | පොල්මෙට්ට අමුණ අසල තිබෙන ඇලේ පැතිබැම්ම සකස් කිරීම | 605,751.47 | 500,000.00 |
| | පට්ටියපොල/ද | පට්ටියපොළදකුණ ඉහල වැව ප්‍රතිසංස්කරණය | 600,765.15 | 500,000.00 |
| | පට්ටියපොල/බ | කටුකුඹුර ඇලේ ඉහල කොටස කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |

## සමෘද්ධි ග්‍රාම නිලධාරී වසම් 3060 හි කඩිනම් යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන 2010
## හම්බන්තොට දිස්ත්‍රික්කය

| ප්‍රා.ලේ.කො. | වසම | ව්‍යාපෘතියේ නම හා පිහිටීම | ඇස්තමේන්තු මුදල රු | අනුමත මුදල (රු.) |
|---|---|---|---|---|
| | නලගම/නැගෙ | සේරුවලගොඩ සිට කිරම ඔය දක්වා ඇල සකස් කිරීම | 600,000.00 | 500,000.00 |
| | තලපිටියගම | ඉහළවැව ප්‍රතිසංස්කරණය කිරීම | 600,024.42 | 500,000.00 |
| | විතාරන්දෙනිය/ද | කරගහ වැවේ සිට සමයංවල වත්ත දක්වා ඇල මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | පොළොම්මාරුව/උ | ඔලියවැව සොරොව්ව ප්‍රතිසංස්කරණය/පිටවාන සැකසීම/පිටවාන ඇල සැකසීම | 616,274.25 | 500,000.00 |
| | පල්ලික්කුඩාව | තාසිංගෙවත්ත පාර කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | කඳුරුපොකුණ බට | ගල්කුලගහ වැවට පිටවාන සකස් කර සොරොව්ව දොරක් සෑදීම | 700,000.00 | 500,000.00 |
| | පහජ්ජාව | දූවවත්ත කළපුවට යන පාර කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | මොරකැට ආර/නැ | වලවව්වත්ත ධීවර ගම්මානයේ සිට මුහුදු වෙරළ දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | මොරකැට ආර/බට | ඩී.එච්.බෙනඩික් මහතාගේ නිවස අසලින් යන පාර සහ බෝක්කුව සැකසීම | 515,565.33 | 500,000.00 |
| තිස්සමහාරාමය | විජයපුර | පියදාස මහතාගේ නිවස අසල (හරස්වැවට පිවිසෙන බෝක්කුව අසල) විරවිල ප්‍රධාන ඇලෙන් ජලය ලබා ගැනීම සඳහා 2008 වර්ෂයේ කැපූ ඇලේ ඉතිරි වැඩ නිම කිරීම හා අඩි 300ක් දුරට කොන්ක්‍රීට් පීල්ලක් ඉදි කිරීම | 600,000.00 | 500,000.00 |
| | සාලියපුර | පිනදාස මහතාගේ නිවස අසල මාර්ගයට සපත්තු බෝක්කුවක් ඉදි කිරීම | 220,000.00 | 200,000.00 |
| | | බේබිනෝනා මයගේ නිවස අසල ඇල හරහා පෙට්ටි බෝක්කුව ඉදි කිරීම | 335,000.00 | 300,000.00 |
| | තිස්සපුර | මැදගිරිපුර කේ.පී.ගීතා මයගේ නිවස අසල බෝක්කුව සහිත පාර කොන්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | උද්ධගන්දර | රුවන්වැවේ ඇලවේලි සකස් කිරීම (කොන්ක්‍රීට් කිරීම) | 650,000.00 | 500,000.00 |
| | වැළිපොතේවල | ජනසවි මාවත 2008 ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | 650,000.00 | 500,000.00 |
| | පුල්පල්ලම | සී.1 කොඩිගහවැව පාර ඉතිරි කොටස මීටර 150 පමණ දුර කොන්කීට් කිරීම | 600,000.00 | 500,000.00 |

**සමෘද්ධි ග්‍රාම නිලධාරී වසම් 3060 හි කඩිනම් යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන 2010**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

| ප්‍රා.ලේ.කො. | වසම | ව්‍යාපෘතියේ නම හා පිහිටීම | ඇස්තමේන්තු මුදල රු | අනුමත මුදල (රු.) |
|---|---|---|---|---|
| | ඇල්ලගල | ලුණුගම්වෙහෙර කු.ග. 4 කුරුලුගමපෙත් ඇල සහ (එච්.සී. 31හා එච් සී 28 කෙත් ඇල) පෙට්ටි බෝක්කු 2ක් ඉදි කිරීම | 900,000.00 | 500,000.00 |
| | පන්නගමුව | දියබැදිය සයිෆන් එක අසලින් පටන් ගෙනවරවල වැව දක්වා මුඩුබිම් සංවර්ධනය සදහා ඇල කැපීම, දෙවන අධියර | 800,000.00 | 500,000.00 |
| | මෝලකැපුපතාන | මෝලකැපුපතාන සිට පන්නගමුව දක්වා කෘෂි මාර්ගය අඩි 2ක් උසට පස් පුරවා දීර්ග කිරීම | 700,000.00 | 500,000.00 |
| වලස්මුල්ල | ඔමාර /තැ | තෙළඹුගහදෙනිය වැව හෑරීම, වැව් කණ්ඩිය සැකසීම,සොරොව්ව සෑදීම | 700,000.00 | 500,000.00 |
| | හොරෙවල | හොරෙවල පිංකැල්ල වල්ලෙහේන්ගොඩ කුඹුරු යායේ පැතිබැම්ම ඉදි කිරීම | 800,000.00 | 500,000.00 |
| | හදුගල | හදුගල ගල්ඇණගොඩ මාර්ගය කොන්ක්‍රීට්කිරීම | 80,000.00 | 500,000.00 |
| | මතුවකන්ද | මැදවාඩිය බෙලිඅත්තකුඹුර අසල මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 800,000.00 | 500,000.00 |
| | පාතේගම | පාතේගම දෙහිගහහේන දක්වාමාර්ගය කොණක්‍රීට් කිරීම | 1,000,000.00 | 500,000.00 |
| | පුලම්පිටිය | දුනුමඩලආරට යන ස්ථානයට සපත්තු පාලමක් ඉදි කිරීම හා සළ බැවුම් සහිත කඳු පෙදෙස කොණ්ක්‍රීට් කිරීම | 600,000.00 | 500,000.00 |
| | වලස්මුල්ල ඉහල | බෝවල මාරලයේ කටරොඩුය දක්වා මාර්ගය කොණ්ක්‍රීට් කිරීම(කටරොඩුව ගම්මානය බෝගහකොරටුව මාර්ගය) | 800,000.00 | 500,000.00 |
| | බටහිර බෝවල | පත්තුව වත්ත හන්දියේ සිට පුල්ගහහේන මාර්ගයේ වේල්ලෙහ් පැලිබැම්ම ඉදි කිරීම | 700,000.00 | 500,000.00 |
| | යහල්මුල්ල | දෙනියමුල්ලට යන මාර්ගය අසල වෙලෙහි පැතිබැම්ම ඉදි කිරීම | 800,000.00 | 500,000.00 |
| | | | **81,732,300.12** | **62,972,847.72** |

**විශේෂ ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන - 2010**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු මුදල (රු.) | අනුමත මුදල (රු.) | ප්‍රතිලාභී පවුල් ගණන |
|---|---|---|---|---|---|
| හම්බන්තොට | අම්බලන්තොට | කොග්ගලුආර විහාරස්ථානයේ දහම් පාසල් ගොඩනැගිල්ලේ වහලය සෙවිලි කිරීම. | 100,000.00 | 50,000.00 | 160 |
| | කටුවන | මිද්දෙණිය උතුර වැවේ පිටවාන සකස් කිරීම. | 600,000.00 | 100,000.00 | |
| | වලස්මුල්ල | උක්ගස්හේන බටේහේන මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 2,000,302.00 | 1,000,000.00 | |
| එකතුව | | | 2,700,302.00 | 1,150,000.00 | 160 |

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

බොහොම ස්තුතියි ගරු නියෝජ්‍ය ඇමතිතුමා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය. සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගෙන් ප්‍රමාණවත් සේවාවක් සිද්ධ වනවා කියලා ඔබතුමා සඳහන් කළා. මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් කරලා තිබෙනවා, සමෘද්ධි අධිකාරියේ සේවය කරන පිරිසට විශ්‍රාම වැටුප්වලට හිමිකම් කියන රාජ්‍ය සේවයක් බිහි කරනවා කියලා. මේ සඳහා අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවාද? මේ පොරොන්දුව ඉෂ්ට කරන්නේ කවදාද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

මහින්ද චින්තනයේ තිබෙන ඒ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ කාර්ය භාරය සහ ඔවුන්ගේ අනාගතය පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාගේ අය වැය කථාවේදී ඉතාම පැහැදිලිව සඳහන් කළා. ඒ වාගේම දැනට සති දෙකකට උඩදී පැවති ලංකාවේ සියලුම සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ මහ සභා රැස්වීමේදී ජනාධිපතිතුමා ඉතාම පැහැදිලිව ප්‍රකාශ කළා, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කරනවා කියලා. ඒ පිළිබඳව මූල්‍යමය ප්‍රශ්නයක් අපට නැහැ. වෙනසක් තිබෙනවා නම්, මූල්‍යමය ගැටලුවක් තිබෙනවා නම් අපට ඒක මේ පාර්ලිමේන්තුවේදී සම්මත කර ගෙන විසඳා ගන්න පුළුවන්. ඒ නිසා දැනට අපට එහෙම ගැටලුවක් නැහැ. රංජිත් සියඹලාපිටිය ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරලා, ඒ කමිටු නිර්දේශය මත අවශ්‍ය විධිවිධාන යොදන්න අපි ඉදිරියේදී ක්‍රියා කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මගේ දෙවන අතුරු ප්‍රශ්නය. ඔබතුමා සඳහන් කළා, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගෙන් සිදු වන සේවාව ගැන. විශේෂයෙන්ම දුප්පත් ජනතාව සවිබල ගැන්වීම සිද්ධ කරනවා කිව්වා. අධික ජීවන වියදමත් සමඟම ඒ දුප්පත් ජනතාවට අත්‍යවශ්‍ය ආහාර ලබා දීම සඳහා අය වැයෙන් රුපියල් මිලියන 750ක් වෙන් කරලා තිබෙනවා. සමෘද්ධිලාභී පවුල් 15,73,000ක් ඉන්නවා. පවුලක සාමාජිකයන් හතර දෙනා ගණනේ ගණන් හදලා බැලුවොත් එක පුද්ගලයකුට මුළු මාසයටම ලැබෙන්නේ රුපියල් නවයයි. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි ඒ මුදල ප්‍රමාණවත්ද කියලා?

ඒ වාගේ සුළු මුදලක් වෙන් කිරීම තුළින් සමෘද්ධි සංවර්ධන නිලධාරිවරයාට ඒ අදාළ කාර්ය භාරය ඉෂ්ට කරන්න පුළුවන්ද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැහැ. ගරු මන්ත්‍රීතුමනි, බොහෝ දුරට මේ සමෘද්ධිය කියන එක වරදවා තේරුම් අරගෙන තිබෙනවා, මිනිසුන්ගේ යැපීම් සඳහා දෙන දීමනාවක් කියලා. නමුත් මේක දිරි දීමනාවක්. මේ හා බැඳුණු වැඩසටහන් 11ක් තිබෙනවා. ඔබතුමා නියෝජනය කරන දිස්ත්‍රික්කය වන හම්බන්තොට දිස්ත්‍රික්කයේ -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා මගේ ප්‍රශ්නයට නොවෙයි උත්තර දෙන්නේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
කෙනෙකුගේ මිලදී ගැනීමේ හැකියාව පිළිබඳව ඔය ප්‍රශ්නය එන්න පුළුවන්, මෙච්චර ගණනකින් ජීවන රටාව ගෙනි යන්න පුළුවන්ද කියලා. නමුත් ඒක නොවෙයි සමෘද්ධිය කියන්නේ. සමෘද්ධිය කියන්නේ ඒ හා බැඳුණු ව්‍යාපාර ගණනාවක් එක්ක යන එකක්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා මගේ ප්‍රශ්නයට උත්තරය දෙන්නකෝ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔබතුමා අහන්නේ මේ මුදල ප්‍රමාණවත්ද කියලා. ජීවත් වන අපි හැම කෙනෙකුටම -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අහන්නේ සමෘද්ධිලාභියකුට මාසයකට රුපියල් නවයක් ලබා දීම ප්‍රමාණවත්ද කියලායි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නවය කියන එක, ඒ ගණන් හැදීම වැරැදියි. ලංකාවේ මුළු ජනගහනයටම අදාළව මේ ගණන් හදලා ගන්න බැහැ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, මම ඒ ගණන බෙදුවේ සමෘද්ධිලාභී පවුල් 15,73,000න්.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මෙහෙමයි. මාසිකව රුපියල් 140ක් දෙන මුද්දරය තිබෙනවා. 250 මුද්දරය තිබෙනවා. 1,000 මුද්දරය තිබෙනවා. 700 මුද්දරය තිබෙනවා. මේවායින් බඩු මිලදී ගැනීම කරන්න අපි තීන්දුවක් අරගෙන නැහැ. රුපියල් නවය නොවෙයි, මේ සමෘද්ධිය හා බැඳුණු ව්‍යාපාරවලින් රුපියල් දසදහස් ගණනක් එක් කෙනෙකුට එනවා. ඒ නිසා ඒකයි ජීවන රටාවට බැඳිලා තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ තුන්වැනි සහ අවසාන අතුරු ප්‍රශ්නය. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම මගේ ප්‍රශ්නයෙන් අසා තිබෙනවා සමෘද්ධි සංවර්ධන නිලධාරින් වෙනුවෙන් ගෙවන වැටුප් ප්‍රමාණය. ඔබතුමා ඒ ලබා දුන්න පිළිතුර ප්‍රකාරව මම මේ කාරණය අහන්න කැමැතියි. සමෘද්ධි අධිකාරිය සඳහා 2011 දී වැටුප් ගෙවීමට වෙන් කරලා තිබෙනවා රුපියල් මිලියන 7,225ක්. නමුත් ප්‍රාග්ධන වියදම් හැටියට වෙන් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 3,260යි. ඒ කියන්නේ පඩි ගෙවන්න වෙන් කර තිබෙනවා බිලියන 7.2ක්. සහන ලබා දෙන්න වෙන් කර තිබෙනවා රුපියල් බිලියන 3.2ක්.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
පඩි ගෙවීමයි, සහනාධාරයි -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා පොඩ්ඩක් මගේ ප්‍රශ්නය අහන්න. සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ තත්ත්වය මොකක්ද? පුනරාවර්තන, ඒ කියන්නේ පඩිනඩි, ගමන් ගාස්තු, ආයතන නඩත්තුව සඳහා මිලියන 11,142යි. ඒ කියන්නේ බිලියන 11.1යි. නමුත් ප්‍රාග්ධන, ඒ කියන්නේ සක්‍රිය ප්‍රායෝගික සහන වැඩසටහන් සඳහා රුපියල් මිලියන 3,900යි. මේක සාධාරණද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔබතුමා මේ ගණන් හදන්නේ පඩියත් එක්ක වෙන් කරපු සහනාධාරය පිළිබඳව.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඒක තමයි ඔය කියන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, ඒක නොවෙයි මම කියන්නේ. සමා වෙන්න.

පුනරාවර්තන වියදම් සඳහා මිලියන 7,200යි. පුනරාවර්තන කියන්නේ වැටුප්, ගමන් ගාස්තු ආදිය. ප්‍රාග්ධන වියදම, ඒ කියන්නේ වැඩසටහන්, ඒ වාගේම සහන ලබාදීම්, ව්‍යාපෘති සඳහා මිලියන 3,260යි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඊට අමතරව ඔය -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම මේ කියන්නේ අය වැය ඇස්තමේන්තුවලින්.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ඔය වෙන් කරපු මුදල් නොවෙයි. මේ සමෘද්ධි බැංකුවල බිලියන ගණනක් තිබෙන මුදල්වලින් සමෘද්ධිලාභීන් සඳහා වෙනම වැඩසටහන් ගෙන යනවා. ඒ වාගේ ඔබතුමා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ දුප්පත් අයගේ නිවාස 300ක් අපි තෝරා ගෙන තිබෙනවා මේ අවුරුද්ද ඇතුළත ඒවා සම්පූර්ණයෙන් හදන්න. ඒවා මේවාට ඇතුළත් වෙලා නැහැ.

ඊට අමතරව ඔබතුමා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් 286ක් අපි දියත් කරලා තිබෙනවා. ඒ 286 සඳහා රුපියල් දසලක්ෂ 1,091ක් අපි වියදම් කරලා තිබෙනවා. මත් ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් 42ක් අපි කරලා තිබෙනවා. ඒ සඳහා රුපියල් 1,26,000ක් වියදම් කරලා තිබෙනවා. ළමා හා වැඩිහිටි වැඩසටහන් ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ සඳහා රුපියල් 2,97,075ක් අපි වියදම් කරලා තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඔබතුමා මගේ ප්‍රශ්නයට උත්තරය දෙන්න.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

මේවා තමයි අමතරව කරන වැඩසටහන්. දිරිය පියස නිවාස වැඩසටහන් කළා. එම නිසා මේක ප්‍රාග්ධනයත් එක්ක, පුනරාවර්තන වියදම් එක්ක සංසන්දනය කරන්න එපා. සමෘද්ධි ව්‍යාපාරය සඳහා ජනතාව අතර ඊට වඩා පැතිරිලා යන මූල්‍යමය වියදමක් අපි කරනවා.

## දේශපාලනඥයන් සහ රජයේ සේවකයන්ගේ විදේශ සංචාර : තානාපති කාර්යාල අරමුදල්
## அரசியல்வாதிகள் அல்லது அரச அலுவலர்களின் வெளிநாட்டு விஜயம்: தூதரகங்களின் நிதி
## OVERSEAS TRIPS OF POLITICIANS AND PUBLIC SERVANTS : EMBASSY FUNDS

0588/'10

10. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දේශපාලඥයින් හා රජයේ සේවකයන් විදේශ ගත වන අවස්ථාවලදී ඔවුන්ගේ වියදම් පියවා ගැනීම සඳහා ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලට, එම කාර්යාල සතු අරමුදල් භාවිත කිරීමට සිදු වන්නේද;

(ii) එසේ නම්, පසු ගිය වර්ෂ හයක කාලය තුළ එවන් වියදම් වෙනුවෙන් අදාළ තානාපති කාර්යාලවලට ගෙවීමට සිදු වූ මුළු මුදල වාර්ෂික පදනමින් කොපමණද;

(iii) ඉහත සඳහන් ගෙවීම් සිදු කරන ලද්දේ කිනම් අවශ්‍යතාවන් වෙනුවෙන්ද;

(iv) එම ගෙවීම් සිදු කරන ලද්දේ පෞද්ගලික හෝ රාජකාරි අවශ්‍යතා වෙනුවෙන්ද;

(v) ඒවා පෞද්ගලික අවශ්‍යතා නම්,එම ගෙවීම් සිදු කරන ලද පුද්ගලයන්, ඒවා සිදු කරන ලද දිනය හා හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசியல்வாதிகள் அல்லது அரச அலுவலர்கள் வெளிநாடுகளுக்கு விஜயம் செய்கின்ற சந்தர்ப் பங்களில் அவர்களின் செலவினத்துக்காக இலங்கைத் தூதரகங்கள் தமது நிதியிலிருந்து பணத்தை செலவழிக்க வேண்டியுள்ளதா என்பதையும்,

(ii) ஆம் எனில், கடந்த ஆறு வருடங்களில் அத்தகைய தூதரகங்களினால் செலவு செய்யப்பட்ட மொத்தத் தொகையை, வருடாந்த அடிப்படையிலும்,

(iii) மேற்படி கொடுப்பனவுகளை மேற்கொண்டமைக் கான நோக்கத்தையும்,

(iv) அதிகாரிகளின் தனிப்பட்ட தேவைகளுக்காகவா அக்கொடுப்பனவுகள் செலுத்தப்பட்டன என்பதையும்,

(v) அக்கொடுப்பனவுகள் தனிப்பட்ட காரணங்க ளுக்காக வழங்கப்பட்டிருப்பின் அவை வழங்கப்பட்ட நபர்களையும், எந்தத் திகதியில், எந்தக் காரணத்திற்காக வழங்கப்பட்டது என்பதையும்

அவர் தெரிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of External Affairs:

(a) Will he state-

(i) whether Sri Lankan embassies have to spend money out of embassy funds to cover up the expenses of politicians and public servants when they go overseas;

(ii) if so, the total amounts spent by relevant embassies for such expenses for the last 6 years on per year basis;

(iii) the purpose of making aforesaid payments;

(iv) whether the reasons for that payments are personal or official; and

(v) if those are on personal reasons the persons to whom the payments were made, on what date and for what reason?

(b) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි,-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, විදේශ කටයුතු ඇමතිතුමා නැහැ නේද? මා ප්‍රශ්න අටක් අහලා තිබෙනවා. ඒ ප්‍රශ්න අටෙන් එක ප්‍රශ්නයකට තමයි නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුරු දුන්නේ. මා හිතන හැටියට ඔබතුමාට සමහර අතුරු ප්‍රශ්නවලට උත්තර දෙන්න බැහැ. මෙම ප්‍රශ්නයට උත්තරයක් තිබෙනවා නම් ඒක සභාගත කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පිළිතුරක් තිබෙනවා. විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරන්නම්. පසුව ඇමතිතුමාගෙන් විස්තර අහන්න.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) නැත. එසේ නොකරන ලෙසට අමාත්‍යාංශ චක්‍රලේඛ මඟින් විදේශ දූත මණ්ඩලවලට උපදෙස් ලබා දී ඇත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එතුමාගෙන් අහලා එතුමා ඉන්න දවසක් කියන්න. එතකොට ඔක්කොම ප්‍රශ්න අහන්නම්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
විදේශ ඇමතිවරු ඉන්නේ සාමාන්‍යයෙන් විදේශ සඳහා නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇත්තද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඇමතිතුමා ඉන්නවා. අද හදිසි නියෝජිත පිරිසක් ඇවිත් ඉන්නවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හොඳයි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ජ්‍යෝෂ්ඨ ඇමතිවරු ඇති නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක හෙට දැන ගන්න පුළුවන්.

## හක්මණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : පානීය ජලය සැපයීම
ஹக்மன பிரதேச சபை அதிகாரப் பிரதேசம்: குடிநீர் வழங்கல்
HAKMANA PRADESHIYA SABHA AREA : SUPPLY OF DRINKING WATER

0703/'10

11. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) මාතර දිස්ත්‍රික්කයේ, හක්මණ ප්‍රාදේශීය සභාව මඟින් පාලනය කරනු ලබන පානීය ජල ව්‍යාපෘතියේ අකාර්යක්ෂම බෙදා හැරීම හේතුවෙන් පාරිභෝගිකයින් දැඩි අපහසුතාවට මුහුණ පාන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ජල ව්‍යාපෘතිය මඟින් පානීය ජලය ලබා ගන්නා කුටුම්බ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ජල ව්‍යාපෘතියෙන් නව ජල සම්බන්ධතා ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති කුටුම්බ සංඛ්‍යාව කොපමණද;

(iii) නව ඉල්ලුම්කරුවන් වෙත පානීය ජල පහසුකම ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) හක්මණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වැඩි වන ජල පරිභෝජනයට ගැළපෙන අයුරින් පානීය ජලය සැපයීම සඳහා ව්‍යාපෘති සකසා තිබේද;

(ii) ඒ සඳහා යොදා ගන්නා ජල මූලාශ්‍ර කවරේද;

(iii) දැනට පවත්නා ජලය බෙදා හැරීමේ අකාර්යක්ෂමතාව මඟ හැරීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

(iv) ඒවා ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) மாத்தறை மாவட்டத்தில் ஹக்மனை பிரதேச சபையினால் நிருவகிக்கப்படும் குடிநீர் வழங்கல் திட்டத்தின் வினைத்திறனற்ற நீர் விநியோகம் காரணமாக பாவனை யாளர்கள் பெரும் அசௌகரியங்களை எதிர்நோக்குவதை அவர் அறிவாரா?

(ஆ) (i) அந்த நீர் வழங்கல் திட்டத்தின் மூலம் குடிநீர் பெற்றுக்கொள்ளும் குடும்பங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(ii) அந்த நீர் வழங்கல் திட்டத்திலிருந்து புதிதாக குடிநீர் இணைப்புக்கான பெற்றுக்கொள்ள விண்ணப்பித் துள்ள குடும்பங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(iii) புதிய விண்ணப்பதாரர்களுக்கு குடிநீர் வசதிகள் எப்போது வழங்கப்படும் என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) (i) ஹக்மன பிரதேச சபை அதிகாரப் பிரதேசத்தில் அதிகரித்துவரும் நீர் நுகர்வுக்கு ஏற்றவகையில் குடிநீர் வழங்குவதற்கான கருத்திட்டங்கள் உருவாக்கப்பட்டுள்ளனவா என்பதையும்,

(ii) அதற்காக பயன்படுத்தப்படும் நீர் மூலங்கள் எவை என்பதையும்,

(iii) தற்போது நீர் வழங்கலில் நிலவும் வினைத்திறன் இன்மையை நீக்குவதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் என்ன என்பதையும்,

(iv) அவை எப்போது நடைமுறைப்படுத்தப்படும் என்பதையும்

அவர் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Water Supply and Drainage :

(a) Is he ware that the consumers face severe hardships due to the inefficient distribution of water carried out by the drinking water project managed by the Hakmana Pradeshiya Sabha in the Matara District?

(b) Will he inform this House-

(i) the number of households that have been provided with drinking water from the aforesaid water project ;

(ii) the number of households that have applied to get new water connections from the aforesaid water project ; and

(iii) the date on which the drinking water facility will be provided to the new applicants?

(c) Will he inform-

(i) whether the projects have been planned to supply drinking water in keeping with the increase in the water consumption in the area of the Hakmana Pradeshiya Sabha ;

(ii) the sources of water that will be used for the aforesaid purpose ;

(iii) the courses of action that will be followed to avoid the inefficiency currently prevailing in the distribution of water ; and

(iv) the date on which the aforesaid courses of action will be followed?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

(අ) මෙම ජල ව්‍යාපෘතිය හක්මණ ප්‍රාදේශීය සභාව මඟින් පාලනය කරන බැවින් මෙම ප්‍රශ්නය පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමු කරන්නේ නම් වැදගත් කියා මම හිතනවා.

නමුත් ප්‍රශ්නයේ ඉතිරි කොටස්වලට මම පිළිතුරු දෙනවා.

(ආ) (i) පැන නොනඟී.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී.

(ඇ) (i) හක්මණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වැඩි වන ජල පරිභෝජනයට ගැළපෙන අයුරින් පානීය ජලය සැපයීම සඳහා ව්‍යාපෘති සකසා තිබෙන අතර නව ජල යෝජනා ක්‍රමයක් සැලසුම් කර ඉදි කිරීම් කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. ඒ සඳහා සම්පූර්ණ ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 383.36කි.

(ii) භූගත නිෂ්පාදිත නළ ළිං 05ක් සහ ස්වාභාවික ජල බුබුළක් ජල මූලාශ්‍ර ලෙස යොදා ගැනේ.

(iii) නව ජල පවිත්‍රාගාරයක් සහ නව බෙදා හැරීම් පද්ධතියක් ඉදි කිරීමට යෝජිතව ඇත.

(iv) අදාළ ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු 2010.07.27 දින ආරම්භ කර ඇති අතර, මෙම ව්‍යාපෘතිය 2013.12.31 වන දින වන විට අවසන් කර ක්‍රියාත්මක කිරීමට අපි බලාපොරොත්තු වනවා.

(ඈ) පැන නොනඟී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු ඇමතිතුමනි, සමාවන්න. ප්‍රශ්නයේ (ආ) (i), (ii), (iii) කොටස්වලින් අසා තිබෙන්නේ සංඛ්‍යාත්මක පිළිතුරු ලැබෙන ප්‍රශ්න. ඒවාට "පැන නොනඟී" කියලා පිළිතුරු දුන්නා. ඒක ටිකක් පැහැදිලි මදි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ප්‍රාදේශීය සභාව මඟින් දැනට පාලනය වන ජල යෝජනා ක්‍රමයක් ගැනයි ඔබතුමා ප්‍රශ්නය අහන්නේ. එහෙන් තමයි මේ විස්තර ගන්න ඕනෑ. ඒකට මට තව දීර්ඝ කාලයක් ගන්න වෙනවා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

මේක මා නියෝජනය කරන කොට්ඨාසයේ තිබෙන -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒකට ඇමතිතුමා පිළිතුරු දෙයි. තමුන්නාන්සේ වාඩි වෙන්නකෝ. තමුන් නියෝජනය කරන ආසනය ගැන ප්‍රශ්නයක් ඇහුවොත් තමුන්නාන්සේ උත්තර දෙන්න. මේ ප්‍රශ්නයට ගරු ඇමතිතුමා උත්තර දෙයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මම ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. හක්මණ ප්‍රදේශයේ තත්ත්වය වඩාත් හොඳින් දන්නේ හක්මණ ප්‍රදේශය නියෝජනය කරන ඒ නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා ඇති ප්‍රාදේශීය සභාවෙන් මේ ජල යෝජනා ක්‍රමය පාලනය කරන බව. දැන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් මිලියන 383ක වියදමින් නව ජල යෝජනා ක්‍රමයක් ආරම්භ කරලා තිබෙනවා. එය ඉතා ඉක්මනින් නිම කිරීමේ ඉලක්කයට අපි ගමන්

කරනවා. අපේ රජයට එය ආරම්භ කරලා ඉදිරියට ගෙන යන්න පුළුවන් වීම ඒ ප්‍රදේශයේ ජනතාවගේ ජයග්‍රහණයක්. ඒ ජලය ලබා ගන්නේ භූගත නළ ළිං පහක් සහ ස්වාභාවික ජල බුබුළක් ජල මූලාශ්‍ර ලෙස යොදා ගෙනයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම ස්තුතිවන්ත වෙනවා ගරු ඇමතිතුමා ඒ ප්‍රශ්නයට උත්තරයක් දීපු එක ගැන. මම අහපු ප්‍රශ්න දෙකේදීම ඒ අදාළ අමාත්‍යවරුන් දෙදෙනා සඳහන් කරන්න යෙදුණා, මේ ප්‍රශ්න ඒ අමාත්‍යාංශවලට අදාළ නැහැ කියලා. නවක මන්ත්‍රීවරු වන අපි වේවා, කවර මන්ත්‍රීවරයකු හෝ වේවා පාර්ලිමේන්තුවේ ලේකම්තුමා හරහා අපි දෙන ඒ ප්‍රශ්න ඉදිරිපත් කරන අමාත්‍යවරයා පිළිබඳව අපේ සඳහන් කිරීම වැරදි නම් එය නිවැරදි කිරීමට මේ පාර්ලිමේන්තුවට වග කීමක් තිබෙනවා. ඒ නිසා කරුණාකරලා ඒ කටයුත්ත සිදු කරන්න. එහෙම නොවුණොත් අපි අහන ප්‍රශ්නයට වග කිව යුතු පිළිතුරක් ලැබෙන්නේ නැහැ.

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මේකයි ගරු කථානායකතුමනි. මේ සඳහන් කිරීම කුමක් වුවත් ඇත්ත තත්ත්වය තමයි සමහර දවසට මේ වතුර බොර පාට ගන්න එක. මැටි පිළිස්සූ විට ලැබෙන ගඩොල්වල පාටක් ගන්නවා. ඒ කොට්ඨාසය නියෝජනය කරන ලක්ෂ්මන් යාපා අබේවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාත් ඒක දන්නවා. මේ ජලය පවිත්‍ර කිරීම සඳහා කරන්නේ ටැංකියට ක්ලෝරින් ටිකක් දමන එක විතරයි. නමුත් ජල පවිත්‍රාගාරයක ව්‍යුහය ඒක නොවෙයි. සැබෑ ජල පවිත්‍රාගාරයක ව්‍යුහය මේක නොවෙයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා, දැන් තමුන්නාන්සේට අහන්න ඕනෑ ප්‍රශ්නය මොකක්ද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ඒ නිසා මේ තත්ත්වය නිවැරදි කරන්න අමාත්‍යතුමා මැදිහත් වෙනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මැදිහත් වෙනවා. මම ඔබතුමා කියපු ආකාරයට මැදිහත් වෙනවා. පවිත්‍ර කරපු වතුර තමයි අපි පාරිභෝගිකයාට දෙන්නේ. පවිත්‍ර නොකරපු වතුර දෙන නිසා තමයි දැන් ඒ ප්‍රාදේශීය සභාවෙන් මේක අපි අරගෙන අලුත් යෝජනා ක්‍රමයක් හදන්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මේකයි. පිරිසිදු ජලය පාරිභෝගිකයාට ලැබෙනවා වාගේම සමහර උස් ප්‍රදේශවල ජීවත් වන ජනතාවට භූමියේ උස නිසා මේ ජලය ලබා ගැනීමේ ගැටලුවක් තිබෙනවා. උස ප්‍රදේශවලට මාසයකින් එකහමාරකින් මේ ජල යෝජනා ක්‍රමය හරහා වතුර ලැබෙන්නේ නැති තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා, නළ මාර්ග යොදා තිබුණත්. එය නිවැරදි කිරීමට ගන්නා ක්‍රියා මාර්ගය කුමක්ද කියා මා දැන ගන්න කැමැතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මේ වැඩසටහන තුළ එය අන්තර්ගත කර තිබෙනවා. සමහර ප්‍රදේශවලට යළිත් කුඩා ටැංකිවලට උඩට පොම්ප කර ඒ මඟින් බෙදා හැරීම තමයි කරන්න වෙන්නේ. කන්ද උඩට ගෙන යන්න පුළුවන් වෙනත් ක්‍රමවේදයක් තවම නැහැ. ඒකත් සැලකිල්ලට ගැනීමට අන්තර්ගත කර තිබෙනවා, ක්‍රියාත්මක කිරීම සඳහා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මේකයි. මේ විස්තර කිරීම් එපාය කියලා ඔබතුමා පුනපුනාම සඳහන් කළත් මේ හැම ප්‍රශ්නයකදීම පුංචි විස්තර කිරීමක් කරන්න සිද්ධ වෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හැබැයි ස්ථාවර නියෝගවලට අනුව එහෙම බැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මේ ප්‍රාදේශීය සභා, ප්‍රජා ජල ව්‍යාපෘති යන මේ ආයතනවලින් ජල මූලාශ්‍ර මුල් කර ගෙන මෙවැනි ජල යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරනවා. වැඩේ කර ගෙන යද්දී ඇනුණාම නැත්නම් අසාර්ථක වුණාම ඒක ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය පිට දානවා, නැත්නම් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය පිට දානවා. මේක දැන් සංස්කෘතියක් බවට පත් වෙමින් යනවා. ඒක අමාත්‍යාංශයටත් බරපතළ ප්‍රශ්නයක්. ඒ වාගේම පාරිභෝගිකයන්ටත් ප්‍රශ්නයක්. ඒ නිසා මේ සෙල්ලම කොතැනින් හරි නවතින්න ඕනෑ, ගරු කථානායකතුමනි. එබැවින් මේ සියල්ල එක වහලක් යටට -එක කුඩයක් යටට- ගන්න පුළුවන් ශක්තිමත් ක්‍රමවේදයක් සකස් කරන්න අමාත්‍යතුමා මැදිහත් වෙනවාද? ඒ වාගේම මේ හැම එකකටම "ඔව්" කියනවාත් එක්කම කවදා වන කොටද කියලා මේකට කාල රාමුවකුත් දෙනවා නම් හොඳයි. මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නයෙන් අහපු එකට කාල රාමුවකුයි, මේකට කාල රාමුවකුයි ගරු ඇමතිතුමා සඳහන් කරනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒක තමයි අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටියේ අය වැය ලේඛනයට ඡන්දය දෙන්නය කියා. මී ළඟ අදියරය කුමක්ද, අලුතෙන් ඇති වන ක්‍රියා මාර්ගය කුමක්ද කියා එහි සඳහන් වෙලා තිබෙනවා. මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ඒ කාරණාව මගේ අවධානයට ගෙන ඒම ගැන.

## හම්බන්තොට දහම් පාසල් : මූල්‍ය ප්‍රතිපාදන
### அம்பாந்தோட்டை மாவட்ட அறநெறிப் பாடசாலைகள்: நிதி ஒதுக்கீடு
### DHAMMA SCHOOLS IN HAMBANTOTA: FINANCIAL ALLOCATIONS

0521/'10

12. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබෙන දහම් පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම දහම් පාසල් සංවර්ධනය කිරීම උදෙසා රජය වර්ෂයකට ලබා දෙන ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iii) දහම් පාසල් සංවර්ධනය වෙනුවෙන් රජය වෙන් කර ඇති මුදල ප්‍රමාණවත් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாந்தோட்டை மாவட்டத்திலுள்ள அறநெறிப் பாடசாலைகளின் எண்ணிக்கை யாதென்பதையும்,

(ii) இந்த அறநெறிப் பாடசாலைகளை அபிவிருத்தி செயவதற்கென ஒரு வருடத்துக்கு அரசாங்கம் வழங்கும் நிதித் தொகை எவ்வளவென்பதையும்,

(iii) அறநெறிப் பாடசாலைகளின் அபிவிருத்திக்கென அரசாங்கம் ஒதுக்கீடு செய்துள்ள பணத்தொகை போதுமானதாவென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs :

(a) Will he inform this House-

(i) the number of Dhamma Schools situated in the Hambantota District;

(ii) the amount of annual financial allocations provided by the Government for the development of these Dhamma Schools; and

(iii) whether the financial allocations provided by the Government for the development of the Dhamma Schools are sufficient?

(b) If not, why?

**ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා (බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன - பௌத்த சாசன, மத அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. M.K.A.D.S. Gunawardana - Deputy Minister of Buddha Sasana and Religious Affairs)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 413යි.

(ii) පුස්තකාල දීමනාව රුපියල් 7,626,000.00

නිල ඇඳුම් ලබා දීම සඳහා රුපියල් 2,943,763.76

දහම් පාසල් උපකරණ සඳහා රුපියල් 150,000.00

මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (2010 වසරට) රුපියල් 10,719,763.76

(iii) ප්‍රමාණවත් වේ.

(ආ) අදාළ නොවේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම අතුරු ප්‍රශ්නවලට යන්න කලින් අහන්න කැමැතියි, මේ ප්‍රධාන ප්‍රශ්නය -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කෙළින්ම අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම එතුමාගෙන් ඒ උත්තරය නිවැරදිද කියලා අහන්න කැමැතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කරුණාකරලා අතුරු ප්‍රශ්නය අහන්න. අතුරු ප්‍රශ්න තුනක් අහන්න තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හරි. මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය තමයි, හම්බන්තොට දිස්ත්‍රික්කයේ දහම් පාසල් සංවර්ධනය වෙනුවෙන් ඔබතුමා අරමුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා කිව්වා.

**ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා**
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
2010 දී මුදල් ලබා දුන්නා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
2010 දී රුපියල් ලක්ෂ 107ක් නේද?

**ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා**
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
ඔව්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇත්ත වශයෙන්ම මම ඔබතුමන්ලාට කියන්න කැමැතියි, ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් හොඳ වැඩසටහනක් කළා. ඒ තමයි දහම් පාසල් ගුරුවරුන්ට නිල ඇඳුම් ලබා දීම. ඒක ප්‍රශංසනීයයි. නමුත් දහම් පාසල් ගුරුවරුන්ට විශේෂ වරප්‍රසාදයක් තිබුණා. රජයේ රැකියාවල සම්මුඛ පරීක්ෂණවලට මුහුණ දෙන කොට වෙනම ලකුණු ප්‍රමාණයක් ලබා දීමේ වැඩසටහනක් තිබුණා. දහම් පාසල් සංවර්ධනය කිරීම සඳහා මේක ලොකු පිටුවහලක් වුණා. එම ප්‍රතිපත්තිය නැවත වරක් ක්‍රියාත්මක කරන්න ඔබතුමන්ලා කටයුතු කරනවාද කියා මම අහන්න කැමැතියි?

**ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා**
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය, 2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය නිමිත්තෙන් රටේම දහම් පාසල් ගොඩනැඟිලි නොමැති දහම් පාසල්වලට දහම් පාසල් ගොඩනැඟිලි ඉදි කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න ඔබතුමන්ලාගේ සැලැස්මක් තිබෙනවාද කියා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි?

**ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා**
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)
මම හිතන්නේ මේ ප්‍රශ්නයට නම් ඒක අදාළ නැහැ. ඒක වෙනත් ප්‍රශ්නයක් හැටියට වෙන දවසක අහන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. තුන්වෙනි අතුරු ප්‍රශ්නය.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එපමණයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 13-0589/'10-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු අමාත්‍යතුමනි, මේ ප්‍රශ්නයට උත්තරය එවලා තිබෙනවාය කියලා මට -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එවලා නැහැ. එවා තිබුණා නම්, I would have at least tabled the Answer. It has not come. I will see that it is answered in two weeks.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ජනතාකරණයෙන් පසු විශ්‍රාම ගිය ලංගම සේවකයන් : පාරිතෝෂික
## மக்கள் மயப்படுத்தப்பட்ட பின் ஓய்வுபெற்ற இ.போ.ச. ஊழியர்கள்: பணிக்கொடை
## CTB EMPLOYEES RETIRED AFTER PEOPLISATION : GRATUITY

0294/10

1. **ගරු අනුර දිසානායක මහතා (ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවට)**
(மாண்புமிகு அநுர திஸாநாயக்க - மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி சார்பாக )
(The Hon. Anura Dissanayake - on behalf of the the Hon. Sunil Handunnetti)
ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) 1991.08.25 දින ලංගම ජනතාකරණය කිරීමෙන් පසු 2002 වර්ෂය දක්වා විශ්‍රාම ගිය සේවකයන්ට මුල් පත්වීමේ දින සිට පාරිතෝෂික ගෙවීමට ශ්‍රී ලංගමය බැඳී සිටින බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මුල් පත්වීමේ දින සිට ඔවුන්ට පාරිතෝෂික ගෙවීමට නොහැකි බවට ශ්‍රී ලංගමය අධිකරණ තීන්දුවක් ඉල්ලා සිටියේද;

(ii) එම අධිකරණ තීන්දුව කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කම්කරු කොමසාරිස්වරයා විසින් එම විශ්‍රාමිකයන්ට පාරිතෝෂික ගෙවන ලෙස උපදෙස් ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඒ විශ්‍රාමික සේවකයින් කී දෙනෙකු සඳහාද;

(iii) ගෙවීමට ඇති මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) එම විශ්‍රාමිකයන්ට පාරිතෝෂික ගෙවීමට කටයුතු නොකරන්නේ මන්ද;

(ii) එම මුදල් කඩිනමින් ගෙවීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නො එසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) 1991.08.25ஆந் திகதி இ.போ.ச. மக்கள் மயப்படுத்தப் பட்டதன் பின்னர் 2002ஆம் ஆண்டு வரை ஓய்வுபெற்ற ஊழியர்களுக்கு முதல் நியமனத் திகதி தொடக்கம் பணிக்கொடை செலுத்துவதற்கு இ.போ.ச. கடமைப் பட்டுள்ளது என்பதை அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) முதல் நியமனத் திகதி தொடக்கம் அவர்களுக்குப் பணிக்கொடை செலுத்த முடியாமலிருப்பதாகக் கூறி இ.போ.ச. நீதிமன்றத் தீர்ப்பொன்றைக் கோரியிருந்ததா என்பதையும்,

(ii) அந்த நீதிமன்றத் தீர்ப்பு என்னவென்பதையும் அவர் குறிப்பிடுவாரா?

(இ) (i) தொழில் ஆணையாளரினால் அந்த ஓய்வு பெற்றோருக்கு பணிக்கொடை செலுத்துமாறு ஆலோசனை வழங்கப்பட்டுள்ளதா என்பதையும்,

(ii) அவ்வாறெனின், ஓய்வு பெற்ற ஊழியர்கள் எத்தனை பேருக்கு என்பதையும்,

(iii) செலுத்தவிருக்கும் மொத்த தொகை எவ்வளவு என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) (i) அந்த ஓய்வு பெற்றோருக்கு பணிக்கொடை செலுத்த நடவடிக்கை எடுக்கப்படாமல் இருப்பதற்கான காரணம் என்ன என்பதையும்,

(ii) அந்தப் பணத்தைத் துரிதமாகச் செலுத்த எடுக்கப்படும் நடவடிக்கைகள் என்ன என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Will he admit that the SLTB is bound to pay gratuity to the employees who retired since the peoplisation of the CTB on 25.08.1991 up to 2002, with effect from their date of first appointment?

(b) Will he state-

(i) whether the SLTB sought a court order to the effect that gratuity cannot be paid to them from the date of first appointment; and

(ii) what the court order is ?

(c) Will he inform this House-

(i) whether the Commissioner of Labour has instructed that gratuity be paid to those pensioners;

(ii) if so, the number of pensioners to whom gratuity be paid; and

(iii) the total amount to be paid ?

(d) Will he state-

(i) as to why action is not taken to pay gratuity to those pensioners; and

(ii) the steps to be taken to pay such gratuity expeditiously?

(e) If not, why?

**ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)

(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) ඔව්.

(ආ) (i) නැත.

කෙසේ වුවද පොකුරු බස් සමාගම් මගින් අංක CA (Writ) 143/2003 දරන නඩුව අභියාචනාධිකරණයේ පවරා ඇත. එහිදී අධිකරණයේ තීරණය වූයේ මුල් පත්වීමේ දිනයේ සිට සේවය අවසන් වන දින දක්වා මුළු කාලයට පාරිතෝෂික ගෙවිය යුතු බවත්, ගෙවූ පාරිතෝෂික මුදලක් වේ නම් එය අඩු කළ හැකි බවත්ය.

2005.10.19 වෙනි දින ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය පිහිටුවීමෙන් අනතුරුව එකී තීන්දුවට එරෙහිව අංක S.C.Spl. LA 77/2007 දරන විශේෂ අභියාචන අයැදුම ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ මුත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට නෛතික පුද්ගලභාවයක් නොමැතිය යන මූලික විරෝධතාව මත එකී අයැදුම නිෂ්ප්‍රභ කරන ලදී.

(ii) අදාළ නොවේ.

(ඇ) (i) ඔව්. (සහකාර කම්කරු කොමසාරිස්වරුන් විසින් උපදෙස් දී ඇත.)

(ii) 879 කි.

(iii) රු.31,820,301.23 (රුපියල් මිලියන තිස් එකයි දශම අටක්.)

(ඈ) (i) දැනට කටයුතු සම්පාදනය කරමින් පවතී.

(ii) දැනට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අර්ථ සාධක අරමුදල් ප්‍රතිපාදන සපයා ගැනීමට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව මණ්ඩලීය පිළිවෙත් අනුගමනය කරමින් ගෙවීමට කටයුතු කරනු ඇත.

(ඉ) අදාළ නොවේ.

**කථානායකතුමා**

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

ප්‍රශ්න අංක 8-0886/'10 -(1), ගරු විජිත හේරත් මහතා.

**ගරු අනුර දිසානායක මහතා**

(மாண்புமிகு அநுர திஸாநாயக்க)

(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මම ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා වෙනුවෙන් එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***

*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

**කථානායකතුමා**

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

ප්‍රධාන කටයුතු.

**ගරු ජෝන් අමරතුංග මහතා**

(மாண்புமிகு ஜோன் அமரதுங்க)

(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, -

**කථානායකතුමා**

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

ගරු ජෝන් අමරතුංග මහතා.

## වරප්‍රසාද : නියෝජ්‍ය අමාත්‍යවරුන්ට සිය වෘත්තියේ නියැලීමේ අයිතිය

சிறப்புரிமை: பிரதி அமைச்சர்களுக்குத் தமது தொழில்களில் ஈடுபடும் உரிமை

PRIVILEGE : RIGHT OF DEPUTY MINISTERS TO ENGAGE IN THEIR PROFESSIONS

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, මම මේ මතු කරන්නේ මුළු පාර්ලිමේන්තුවටත්, මෙහි සිටින සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේත් ගරුත්වය පිළිබඳව හදිසියේ ඇති වුණු ප්‍රශ්නයක් ගැනයි. ඊයේ කොළඹ දිසා අධිකරණයේ අංක 1 දරන අධිකරණයේ නඩුවක් පැවතුණා. ඒ නඩුව ඉදිරිපත් කර තිබුණේ අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාට එරෙහිවයි. එතකොට එම නඩුවේ වගඋත්තරකරු වෙනුවෙන් පෙනී සිටියේ මේ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය ඇමතිවරයෙක්. මම දන්නා තරමට පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව ඇමතිවරුන්, නියෝජ්‍ය ඇමතිවරුන් උසාවියේ නඩු සඳහා පෙනී සිටින්නේ නැහැ. එම සම්ප්‍රදාය මෙහි විතරක් නොවෙයි එංගලන්තය, ඒ වාගේම අනෙකුත් බොහෝ රටවල්වලත් තිබෙනවා. එසේ පෙනී සිටීමෙන් වැරැදි දෙකක් සිදු වෙනවා. එකක්, අධිකරණයට යම් කිසි බලපෑමක් කිරීමේ අදහසින් ඒක කෙරෙනවාද කියන එක. ඒක තමයි අපට තිබෙන සැකය. ඉතින් මේක සම්පූර්ණයෙන්ම වැරැදි වැඩක්. මේ පිළිබඳව එම නඩුවේ පෙත්සම්කරුගේ නීතිඥ මහත්මයා විරුද්ධත්වය ප්‍රකාශ කර තිබෙනවා. එතකොට එතුමා කියා තිබෙනවා, "මම ඇටෝර්නි ජෙනරාල්තුමාගෙන් අවසර අරගෙන ආවා." යි කියලා. ඉතින් මා දන්නේ නැහැ, අපේ අධිකරණයට කුමක් වෙන්නට යනවාද, පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරුන්ට කුමක් වෙන්නට යනවාද කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි. තමුන්නාන්සේ මතු කරපු ප්‍රශ්නය පිළිබඳව සොයා බලා, සියලු දෙනාත් එක්කම සාකච්ඡා කරලා, සුදුසු නියෝගයක් ලබා දෙන්නම්. [බාධා කිරීමක්] හොඳයි, බොහොම ස්තුතියි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

අපේ ගරු විපක්ෂ නායකතුමා නීතිඥවරයෙක්. ඒ වාගේම ගරු නිමල් සිරිපාල අමාත්‍යතුමා නීතිඥවරයෙක්. [බාධා කිරීමක්] කවදාවත් පෙනී සිට නැහැ, මේ තනතුරු ලබා ගත්තාට පස්සේ. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

එය අවධානයට යොමු කළා. බොහොම ස්තුතියි. [බාධා කිරීමක්] හොඳයි, මා ඒ පිළිබඳව සියලු දෙනාත් එක්ක සාකච්ඡා කරලා සුදුසු නියෝගයක් දෙන්නම්.

ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 හා 2.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු කථානායකතුමනි, කාරණයක් අහන්න තිබෙනවා. ඒක අපි ඊයේ අරගත්ත කාරණයක්. එනම් ප්‍රාදේශීය සභා ඡන්ද පිළිබඳ ප්‍රකාශයක් කරන්නය කියලා ඉල්ලුවා. ඒ ප්‍රකාශය අද කරනවාද, හෙට කරනවාද කියලා මම දැන ගන්න කැමැතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

අද රෑට කරනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

අද රෑට කරනවා?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔව්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

දැන් ඒවා කරන්නත් භය වෙලා වාගේ. භාගයක් තියනවා. භාගයක් තියන්නේ නැහැයි කියනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ඇයි භය? ඔබතුමන්ලා තමයි රටට භය. අපි භය නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනි වර කියවීම. ගරු (ආචාර්ය) සරත් අමුණුගම ඇමතිතුමා. [බාධා කිරීමක්]

**ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා**
(மாண்புமிகு மாவை. சோ. சேனாதிராஜா)
(The Hon. Mavai S. Senathirajah)

Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

There is a point of Order being raised.

**ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා**
(மாண்புமிகு மாவை. சோ. சேனாதிராஜா)
(The Hon. Mavai S. Senathirajah)

Sir, yesterday I made a statment regarding some offensive activities occurring in the Jaffna Peninsula and even the Chair has assured that the Hon. Minister will reply today. We expect a reply. We want to know whether he will respond to our suggestion today.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු සභානායකතුමා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, එතුමා ඒ මතු කරන ලද ප්‍රශ්නය පිළිබඳව අපි එක් දිනක විවාදයක් දීමට එකඟ වෙලා තිබෙනවා. දැන් අද පක්ෂ නායක රැස්වීමේදී දිනය නියම කරගෙන, ඒ නියම කරගත් දවස පුරාම ඒ සම්බන්ධයෙන් මතු කරන ලද සියලුම ප්‍රශ්නවලට පිළිතුරු දීමට රජය සූදානම්.

**කථානායකතුමා**

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

හොඳයි.

**ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා**

(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)

(The Hon. Suresh Premachandran)

Mr. Speaker, a one-day Debate is a different matter. Yesterday, we made a statement complaining about several matters and the Hon. Minister is supposed to answer it today. That was the Order given by the Chair yesterday, Sir. The one-day Debate is somewhat different and that would take, in fact, two weeks time.

**කථානායකතුමා**

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

හොඳයි. ගරු ඇමතිතුමන්ලාට අවශ්‍ය නම් ඒකට පිළිතුරු දෙන්නත් පුළුවන්, නොදෙන්නත් පුළුවන්. විශේෂයෙන්ම ඒක එතුමන්ලාට තිබෙන නිදහසක්. බොහොම ස්තුතියි. ගරු (ආචාර්ය) සරත් අමුණුගම ඇමතිතුමා. [බාධා කිරීමක්]

**ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා**

(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)

(The Hon. Suresh Premachandran)

We raised some important matters, Sir. There are killings, rapes and abductions. These are important matters. The Hon. Minister is not willing to give an answer. [*Interruption.*] In this House if the response is like this, where can we raise these issues? [*Interruption.*]

**ගරු ජෝන් අමරතුංග මහතා**

(மாண்புமிகு ஜோன் அமரதுங்க)

(The Hon. John Amaratunga)

That Debate is for the Hon. Douglas Devananda's statement. - [*Interruption.*]

**කථානායකතුමා**

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

සභානායකතුමා එයට පිළිතුරු දෙන්න භාර අරගෙන තිබෙනවා. ඒක පැහැදිලියි. ඊට වඩා කථා කරන්න දෙයක් නැහැ.

## බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත

## வங்கிகளால் வழங்கப்பட்ட கடன்கள் அறவிடுதல் (விசேட ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலம்

## RECOVERY OF LOANS BY BANKS (SPECIAL PROVISIONS) (AMENDMENT) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***

*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for Second Reading read.*

[අ. භා. 1.56]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව පිළිබඳ අමාත්‍යතුමා)**

(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சர்)

(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation )

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දෙවන වර කියවිය යුතුය" යි මම යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, මම බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත අනුමතිය සඳහා සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**

(மாண்புமிகு ஜோன் அமரதுங்க)

(The Hon. John Amaratunga)

We are moving an amendment. Are you accepting that - [*Interruption.*]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**

(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)

(The Hon. (Dr.) Sarath Amunugama)

No, no. We are not accepting that.

**ගරු ජෝන් අමරතුංග මහතා**

(மாண்புமிகு ஜோன் அமரதுங்க)

(The Hon. John Amaratunga)

Why? [*Interruption.*]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**

(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)

(The Hon. (Dr.) Sarath Amunugama)

No, no. That is why we are having the Debate. [*Interruption.*] Let us continue with the Debate. [*Interruption.*] No, no. Let us start the Debate.

**ගරු ජෝන් අමරතුංග මහතා**

(மாண்புமிகு ஜோன் அமரதுங்க)

(The Hon. John Amaratunga)

Are you conceding it or are you opposing it?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

That will be taken up at the Vote.

ගරු කථානායකතුමනි, මේ පනතේ අපේ පරමාර්ථය ඉතාම පැහැදිලිව සංක්ෂිප්තයෙන් මා කියන්න කැමැතියි. අප ඒක සටහන් කරලා තිබෙනවා. ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතට අලුතින් 5අ වගන්තිය අතුළත් කරනු ලබන අතර, ඇතුළත් කරනු ලබන වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන මුදල මත උපචිත වී ඇති යම් පොලියක් හෝ ඒ මුදල මත පනවා ඇති දඩ මුදල් හැර, ණයට ගෙන ඇති ප්‍රධාන මුදල රුපියල් මිලියන පහකට වැඩිනම් පමණක් පරාටේ බලය ක්‍රියාත්මක වීම අදාළ විය යුතු බවට මේ පනතෙන් අප මේ සභාවට යෝජනා කරනවා.

අප මේ යෝජනාව ගෙන එන්න විශේෂ හේතුවක් වුණේ සුළු ණයකරුවන්ගේ ඉල්ලීමක් තිබුණා දැනට තිබෙන ඒ නෛතික තත්ත්වය තුළ කිසියම් දුෂ්කරතාවකට මුහුණ පානවාය කියලා. එම ඉල්ලීම සලකා බලා රජය තීරණය කළා රුපියල් මිලියන 5 දක්වා මේ ප්‍රශ්නය උද්ගත වී තිබෙන අයට පරාටේ ක්‍රමය යටතේ පිළියම් සොයන්නේ නැතුව සාමාන්‍ය නෛතික උසාවි ක්‍රමය හෝ වෙනත් ගනුදෙනු ක්‍රමයකින් ඒ ප්‍රශ්නය විසඳා ගත යුතුය කියා. ගරු කථානායකතුමනි, මුලින්ම කියන්නට ඕනෑ මේ තිබෙන්නේ පරාටේ පිළිබඳ ප්‍රශ්නයක් විතරක් නොවෙයි කියා. මේ ප්‍රශ්නයේ තිබෙන්නේ මොකක්ද? මෙය අපේ සම්පූර්ණ බැංකු ක්‍රමය පිළිබඳ ප්‍රශ්නයක්. මා විශේෂයෙන් එක්සත් ජාතික පක්ෂයට මතක් කරන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. මොකද, මට මතකයි අපි පාර්ලිමේන්තුවේ ඉන්න කාලයේ එන්.යූ. ජයවර්ධන මැතිතුමා - මගේ හිත මිත්‍ර රවි කරුණානායක මැතිතුමාත් පිළිගන්නවා ඇති- විශාල උද්ඝෝෂණයක් ගෙන ගියා පුවත් පත් මඟින්, සාකච්ඡා මඟින් ඒ බැංකු ක්‍රමය තුළින් බැංකුත් ආරක්ෂා කර ගැනීම අත්‍යවශ්‍යයි කියලා. මොකද බොහෝ දුරට ඒ නීතියේ ප්‍රමාදයන් තුළ බැංකුවට තිබෙන ඒ සාධාරණ හිමිකම් පවා ගන්න බැරි වුණු තත්ත්වයක් තිබුණු කාලයක තමයි මේ යෝජනා ආවේ. යෝජනා කිහිපයක් ගෙනාවා. එකක් තමයි parate execution කියන මේ යෝජනාව. තවත් එකක් තමයි වෙනම commercial courts ඇති කර ගැනීම. [බාධා කිරීමක්] මම ඒකට එන්නම්. ඒකේ අවශ්‍යතාවන් තිබෙනවා.

ඒ වාගේම බැංකුවත්, සංවර්ධනයත්, බැංකු ණයකාරයත් අතර තිබෙන සම්බන්ධය වඩාත් පැහැදිලි කර ගැනීමට විශේෂයෙන්ම නඩුකාරවරුන්ටත් මේ කොම්පැනි නීතිය සහ වෙළෙඳ අංශය පිළිබඳ දැනුමක් ලබා දීම අත්‍යවශ්‍යයි කියන ඒ වාගේ විවිධ යෝජනා ගෙනාවා. මේක අත්‍යවශ්‍ය දෙයක්. අපි ඊයේ සාකච්ඡා කළා රක්ෂණ අංශය ගැන. අද අපි සාකච්ඡා කරනවා බැංකු අංශය ගැන. මේ අංශ දෙකම -අපේ මූල්‍ය අංශය- අපේ එදිනෙදා ජීවිතයට කොයි තරම් වැදගත්ද කියලා බොහෝ විට අපි සලකන්නේ නැහැ. මිනිසෙකුගේ ඇඟ තුළ ලේ ගමන් කරනවා වාගේ, ඒ අවයවයන් ක්‍රියා කරනවා වාගේ, දවසේ මූල්‍යමය ගනුදෙනු හරියට කෙරුණේ නැත්නම් මුළු රටම අර්බුදයකට පත් වනවා. විශේෂයෙන්ම ඔබතුමන්ලා අර්ථශාස්ත්‍ර අංශය ගැන අවබෝධයක් තිබෙන අය වශයෙන් හොඳට දන්නවා බැංකු අතර දින පතා මුදල් හුවමාරු වන බව. මහ බැංකුව මුදල් දෙනවා. බැංකුවල මුදල් මහ බැංකුවට දෙනවා. ඒ වාගේම පොලී අනුපාත වෙනස් වන අයුරින් ඒ සම්බන්ධතා ඇති කර ගන්නවා. ඒ නිසා මේ බැංකු ක්‍රමය, මූල්‍ය ක්‍රමය කියන එක පුංචි දෙයකට සීමා වෙච්ච දෙයක් නොවෙයි. ඒක හරියට මිනිස් සිරුරක් වාගේයි. ආර්ථිකය දියුණු වන්න නම් ඒ දේහය නීරෝගීව තිබෙන්න ඕනෑ, හරියට වැඩ කරන්න ඕනෑ. අපේ මූල්‍ය අධිකාරිය ශ්‍රී ලංකා මධ්‍යම බැංකුව වන්න පුළුවන්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වන්න පුළුවන්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වන්න පුළුවන්. ඒ වාගේම බැංකු, රක්ෂණ යන සෑම අංශයක්ම එක්කාසු වෙලා තමයි ඒ මූල්‍යමය කටයුතු සිද්ධ වන්නේ. එක පැත්තකින් අපි පිළිගන්නවා ක්ෂණිකව තීන්දු දෙන්න පුළුවන්, මීට වඩා වෙළෙඳ ක්ෂේත්‍රය ගැන දැනුම තිබෙන නීති ක්ෂේත්‍රයට අපි යන්න ඕනෑ කියලා. ඒක පැහැදිලි කරන්න ඕනෑ. දෙපැත්තටම ඒක හොඳයි. දැන් මේ පරාටේ ක්‍රමය ගැන කියන විට, ඔබතුමන්ලා ඉතාම ජනප්‍රිය විධියට ඒ ගණන වැඩි කරන්න කියලා කියනවා. නමුත් අපි සහනයක් දුන්නාම එතකල් කවුරුවත් කථා කළේ නැහැ. ඒ අය ගරු ජනාධිපතිතුමා හමු වන්න ආවාම, සහනය දෙන්න කියලා ජනාධිපතිතුමා තීරණය කළාට පස්සේ, අපි කිව්වා මේක නිකම් topping up වාගේ කියලා. මොකද, අපි මොනවා හෝ කිව්වාම වග කීමක් නැහැ නේ. සාමාන්‍යයෙන් කියන්නේ, the Opposition must have its say, the Government must have its way. ඒකට තමයි ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ. ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වය තමුන්නාන්සේලාට නවත්වන්නට බැහැ, මේ එක එක යෝජනා ගෙනැල්ලා. තමුන්නාන්සේලාගේ කථා කිරීමේ අයිතිය අප තහවුරු කරන්නට ඕනෑ. එහෙම නේද ගරු මන්ත්‍රීතුමා? ඒක අප තහවුරු කරන්නට ඕනෑ. නමුත් ආණ්ඩු කිරීමේ අයිතියට තමුන්නාන්සේලාට ඇවිත් බලපෑම් කරන්නට බැහැ. ඒකයි ප්‍රජාතන්ත්‍රවාදී න්‍යාය. The Government must have its way and the Opposition must have its say. ඒකයි ප්‍රජාතන්ත්‍රවාදය. අපි මේවා ඔක්කොම හොඳට කල්පනා කරලා මිලියන පහකට මේ සීමාව දැම්මා. මේ කිසි දෙයක් බලන්නේ නැතිව විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා දැන් කිව්වා නේ "අපි මේකට තව ඉලක්කමක් දමමු"ය කියා. තව ඉලක්කමක් දාලා මේක ඔක්කොම අවුල් කරන්නට තමයි හදන්නේ. දැන් ඒක වෙනම පැත්තක තබමු.

ගරු කථානායකතුමනි, මා මේ කාරණය කියන්නට ඕනෑ. පරාටේ ක්‍රමයකට බැංකුවක් යනවාය කිව්වාට හැම දෙයක්ම පරාටේ ක්‍රමයට යන්නේ නැහැ. ගනුදෙනුකාරයා නියම වෙලාවට ගනුදෙනු හරියට පියෙව්වේ නැත්නම් බැංකුව නොයෙක් විධියේ අභ්‍යන්තර ක්‍රියාමාර්ගවලට යොමු වෙනවා. ඉස්සෙල්ලාම - [බාධා කිරීමක්] Yes, you are used to blackmail. Your party is also used to blackmail. But, we cannot be subject to blackmail. මෙතැන වෙන්නේ, බැංකුව සාමාන්‍ය විධියට තමන්ගේ ඒ ණය ලබා ගන්නට බලනවා. ඒ ගනුදෙනුකාරයාත් එක්ක සාකච්ඡා කරනවා. යම් යම් අවස්ථාවලදී බැංකුවට මේ නීති පාවිච්චි කරන්නට වෙනවා. එහෙම නැත්නම් එය බැංකුවේ මුදල් පිළිබඳ ප්‍රශ්නයක්. මීට ඉස්සර විජේතුංග මහත්මයාගේ කාලයේදී තමුන්නාන්සේලාට මතක ඇති, තමුන්නාන්සේලාගේ මුදල් ඇමති, තමුන්නාන්සේලාගේ අගමැති, තමුන්නාන්සේලාගේ ජනාධිපති කාලයේදී මොකක්ද කිව්වේ? ප්‍රසිද්ධියේ ඇවිත් කිව්වා, මහජන බැංකුව බංකොලොත්, ලංකා බැංකුව බංකොලොත් කියා. මේ ගරු සභාවට ඇවිත් කිව්වා, අය වැය විවාදයේදී.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

දැන් ඒ ගොල්ලන් බබ්බු.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

එහෙම කියපු මිනිස්සු දැන් කොහොමද කථා කරන්නේ? මේ සභාවට ඇවිල්ලා කිව්වා නේ. පුවත් පත් සාකච්ඡාවලදීත් කිව්වා. ලංකාවේ තිබුණු රාජ්‍ය බැංකු බංකොලොත් කියා කවුද කිව්වේ? මේ ගොල්ලන්ගේ මුදල් ඇමති, අගමැති, ජනාධිපති. Triple chance එකට ගහපු එක් කෙනා. අපි බලන්න ඕනෑ, මේ බැංකු කියන ආයතන ආරක්ෂා කර ගෙන ඉස්සරහට යන්න. මොකද, ඒක තමයි මර්ම ස්ථානය. අපට ඇමෙරිකාවෙන් දෙන පාඩම මොකක්ද? බැංකු ක්‍රමය කඩා ගෙන වැටුණොත් ඒක අනික් හැම

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

ක්ෂේත්‍රයකටම යනවා. මා ඊයේ ඒක පැහැදිලි කළා. ඉස්සෙල්ලාම Lehman Brothers වැටුණා. ඒ ගොල්ලන් වැටුණාම ඊ ළඟට වැටුණේ American International Group කියන රක්ෂණ අංශය. මොකද මේ ඔක්කොම එකට සම්බන්ධ මූල්‍ය දේවල්. නිකම් අහම්බෙන් අපට තීරණ ගන්න බැහැ. දැන් මා එකක් කියන්න ඕනෑ. තමුන්නාන්සේලාට සංඛ්‍යා ලේඛන ටිකක් දෙන්නම්. විශේෂයෙන් බැංකුවලට තව ණය ලබා දෙන්න කියා ජනාධිපතිතුමා ඉතාම දැඩි ලෙස නියෝගයක් දුන්නා. අප දන්නවා, බැංකු මුලින් ටිකක් මේක කරන්න හොරයි කියා. මොකද ඒ ගොල්ලන්ගේ සම්ප්‍රදාය මේ විධියට ණය ප්‍රසාරණය කිරීම නොවෙයි. හැම දේම සුරක්ෂිත කර ගන්න පුළුවන් අංශවලට සල්ලි රැක ගැනීමයි. නමුත් අපි කියන්න සන්තෝෂයි, අපේ රජය යටතේ ගරු ජනාධිපතිතුමාගේ නියමය අනුව අද බැංකු ඒ ණය ලබා දීම වැඩි කර තිබෙන බව. මේ බලන්න, ගිය අවුරුද්දේ year on year ණය ප්‍රසාරණය. ගිය වර්ෂයේ ණය ලබා දීම සියයට 22කින් වැඩි වෙලා තිබෙනවා. මේ අවුරුද්දේ ඊටත් වැඩි වෙයි. මොකද අද අපේ ආර්ථික තත්ත්වය ඉතාම හොඳ තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවාය කියා මා කියන්න කැමැතියි. අපේ විරුද්ධ පක්ෂයට මා කියන්න කැමැතියි, 2010 තමයි අපේ සියලුම ආදායම් ඉලක්ක කරා අප ගියේ කියා. මිලියන 817ක අපේ සම්පූර්ණ ආදායම් ඉලක්කය අප 2010 ලබා ගත්තා. [බාධා කිරීම්] නැහැ, නිකම් ඉන්න කෝ. තමුන්නාන්සේ කථා කරන කොට අපටත් එක එක දේවල් කියන්න පුළුවන්. තමුන්නාන්සේගේ ආර්ථිකය ගැනත් කියන්න පුළුවන්. අපි එහෙම කියන්නේ නැහැ නේ. හොඳට මතක තියා ගන්න, අප මේ එක්තරා ආර්ථික සංවර්ධනයකට යන්නේ. ගරු මන්ත්‍රීතුමනි, හැම දේම එකින් එකට සම්බන්ධ කර ගෙන අප කටයුතු කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. බැංකු ක්ෂේත්‍රය රක්ෂා කිරීමේදී වැදගත් දෙයක් තමයි Doing Business Index එක. දැනට අප 130ට ඉන්නේ. 2010 වර්ෂයේ එක තවම ලෝක බැංකුවෙන් පළ කර නැහැ. නමුත් මා තමුන්නාන්සේලාට, මේ සභාවට හෙළි කරන්න කැමැතියි, එන වර්ෂයේ 130 සිට 100නුත් පහළට double-digit අංශයකට අප යනවාය කියා. අපේ ඉලක්කය තව අවුරුදු පහක් ඇතුළත Doing Business Index එකේත් 30 වැනි තැනට යන්නයි. අන්න ඒකයි අපේ ඉලක්කය. [බාධා කිරීම්] නැහැ, නැහැ. අප ඒකට යනවා. තමුන්නාන්සේලා බලන්න, ඊයේ "ගාඩියන්" සඟරාවේ ලංකාව ගැන මොකක්ද කියා තිබෙන්නේ කියා. ඉතාම හොඳට වැඩ කරන stock exchange එකක ආරම්භයක් ගැන කියනවා. මෙතුමායි, මමයි රූස්වීමකට ගියා. රූස්වීමකට නොවෙයි සාදයකට. දැන් තමුන්නාන්සේත් පිළිගන්නවා. අද IPOs කීයක් එනවාද? පෝලිමට මිනිස්සු එනවා. මහ ජනයා තමන්ගේ සල්ලි දී ආර්ථික ප්‍රසාරණයට සහභාගි වනවා. ඒක හොඳ දෙයක් නේ. මේවා list කරලා, මහ ජනතාවගේ -

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඇමතිතුමනි, ප්‍රශ්නයක් අහන්නම්. IPOs 40ක් එනවා කියා ඔබතුමා කිව්වා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
40ක් නොවෙයි, IPOs ගොඩක් එනවා කියා මා කිව්වේ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු ඇමතිතුමනි, ආරංචියක් තිබෙනවා, ආණ්ඩුවේ කොටස් ගොඩක් විකුණන්න දැන් සූදානම් වනවාය කියා. පෞද්ගලීකරණය කරන්නේ නැහැ කිව්වාට SriLankan Airlines, Sri Lankan Catering (Pvt.) Limited, Ceylon Electricity Board -

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමාගේ කථාවේදී කියන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මා ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහන්නේ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මේවා අදාළ නැති දේවල්. ඒවා තමුන්නාන්සේලා උපකල්පනය කර ගෙන. These people are called straw men. තමුන්නාන්සේලා පඹයෙක් හදා ගෙන ඒ පඹයාට ගහනවා. ඒක අපි බලමු. අනාගතය ගැන අපි දන්නේ නැහැ. රජය නොයෙක් සාකච්ඡා කරලා ප්‍රතිපත්ති හදනවා. දැන් මේවා කථා කරලා වැඩක් නැහැ නේ. දැන් මේ විවාදයේදී කථා කරන්නේ මම. තමුන්නාන්සේගේ අවස්ථාවේදී තමුන්නාන්සේ කථා කරන්න. මා කියන දේ කරුණාකර අහන්න. මේ රටේ මූල්‍ය ක්ෂේත්‍රයේ යම් යම් අඩු පාඩුකම් තිබුණාම ඒවා හදා ගෙන හොඳට සකස් කර ගෙන අපි ඉදිරියට යන්න ඕනෑ. එන අවුරුද්දේ සියයට 9ක ආර්ථික වර්ධනයක් අපි බලාපොරොත්තු වනවා. 2010 දී සියයට 8ක ආර්ථික වර්ධනයක් අපට ලැබුණා. තව අවුරුදු තුන හතරකින් double digits නැත්නම් සියයට 10ක ආර්ථික වර්ධනයකට යනවා. සෑම සාධකයක්ම ඒකට සම්බන්ධයි. ඒක කරන කොට තව ටික ටික ඉස්කුරුප්පු තද කරන්න ඕනෑ. හොඳ යන්ත්‍රණයක් හරි ගස්සන්න ඕනෑ. කරුණාකර ඒක තේරුම් ගන්න. මොකක් හරි කිව්වාම හැම වෙලාවේම ඒකේ වැරදි පැත්ත කියන්නේ නැතුව හොඳ පැත්ත කියන්න. තමුන්නාන්සේලා පත්තරේට, ඒ වගේම පිට ගියාම හොඳ පැත්ත කියන බව මා දන්නවා. අපේ රටේ දැන් හොඳ ආර්ථික වර්ධනයක් තිබෙනවා. කාටවත් නැහැ කියන්න බැහැ. ගිය අවුරුද්දේ වාර්තාගත ලෙස විදේශ විනිමය ආ එක ගැන කාටවත් තර්ක විතර්ක කරන්න බැහැ. ඒවා බැංකුවල තිබෙනවා. මහ බැංකුවේ සංඛ්‍යා ලේඛන තිබෙනවා වාගේම ඒ සල්ලි බැංකුවල තිබෙනවා. අපේ සංචාරකයෝ ආවා කියලා කිව්වාම තමුන්නාන්සේලා කොච්චර නැහැ කිව්වත් හෝටල් පිරුණු බව පෙනෙන්න තිබෙනවා නේ. අද දකුණුකරයේ හෝටලයක කාමරයක් ගන්න පුළුවන්ද? අද මධ්‍යම කඳුකරයේ හෝටලයක කාමරයක් ගන්න පුළුවන්ද? ගන්න බැහැ. අපි හැම පැත්තක්ම බලන්න ඕනෑ. මෙතැනදී අපි කරන්න හදන්නේ ඒ ව්‍යාපාරය කර ගෙන යන ගමන් එක පැත්තකින් අපේ අධිකරණයට වාණිජ කටයුතු ගැන වඩාත් හොඳ දැනුමක් ලබා දීමයි. අපට එක ප්‍රශ්නයක් තිබෙනවා. ඉතා සියුම් වාණිජ ප්‍රශ්න ගැන තීන්දු ගැනීමට වාණිජ අංශය ගැන තව දැනුමක් ඇතුළු කරන්න ඕනෑ.

මේ පරාටේ නීතිය ගෙනාවා ඉස්සර. පුංචි පුංචි ණය ගත්තු අයට ප්‍රශ්න තිබෙනවා නම් අපි ඒ අයට ඒ සහනය දෙන්න ඕනෑ. අපි ඒ සම්බන්ධයෙන් කටයුතු කර ගෙන යනවා. තමුන්නාන්සේලා දන්නවා මේ ණය ගත්තු හුඟක් අය අපේ රටේ ආර්ථිකයට සම්බන්ධ වෙච්ච අය බව. කුඩා වී මෝල් හිමියන්, කුඩා තේ වතු හිමියන් අරගෙන බලන්න. ඒ වාගේ අය- [බාධා කිරීමක්]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

සංශෝධනයක් විධියට අපි කියනවා දැනට පවතින නඩුවලට සම්බන්ධ උදවියටත් ඒ සහනය දෙන්න කියලා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඒ ගැන බලමු.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

So, give the same relief to the pending cases also.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

That will be up to the bank to take a decision with regard to any case that is pending. But, first, they must have legal provision. Once we give legal provision after passing this Bill, they will be able to take the decision that they want. My good Friend, obviously if anything is now under consideration, common sense dictates that this law will prevail once it is passed.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Why can you not note it down in the amendment itself?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

It is stated as Rupees five million.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Yes, Rupees five million is stated, but what about the pending cases?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

That is obvious. I will tell you about something with which you are more familiar. In criminal activities, once the law is there, the law will be applied. But, how can it be applied before the law is there? So, whatever reservations you have, kindly mention that. That is why I said, "The Opposition must have its say, the Government must have its way". That is our dictum. You are perfectly free to make all these suggestions. Yesterday, we were very flexible when some of your Members of Parliament made certain suggestions. We said "Okay, we will consider it". We may sometimes even change some of our own attitudes. That is normal Parliamentary democracy. But, I can assure you that once this Bill is passed, all the pending cases will also come under the purview of that, in respect of the banks. That is quite normal. If the banks come under the Ministry of Finance, we will certainly give them that clarification.

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

This statement alone is enough.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Yes, this statement alone is enough. We are trying to give some relief to the people. We are not trying to penalize the people. සමහර කට්ටිය ඉන්නවා ඒ සහනය ලබා දිය යුතු. අපි කියමු මැණික් ක්ෂේත්‍රයේ, තේ සහ රබර් ක්ෂේත්‍රයේ, වී ක්ෂේත්‍රයේ ආයෝජනය කරපු අය කියලා. ඒ අයට යම් යම් දුෂ්කරතාවන් තිබෙනවා නම් අප ඒ සහනය ලබා දෙන්න ඕනෑ. තමුන්නාන්සේට ඉතාම අවධාරණයෙන් මතක් කරන්න ඕනෑ දෙයක් තිබෙනවා. ඒ තමයි, මේ නීතිය නැතුව වුණත් යම් යම් සහන දීම සම්බන්ධයෙන් සලකා බලන්න බැංකුවට පුළුවන්ය කියන කාරණය. මේ පරාටේ එක එන්නේ අන්තිම මොහොතේ. කරන්නම දෙයක් නැති නම් විතරයි ඒක එන්නේ. බැංකුව පරාටේ එක ගෙනැල්ලා හැම කෙනාගේම ඔළුවට දමන්නේ නැහැ නේ. බැංකුව පුළුවන් තරම් සාකච්ඡා කරලා බලනවා. ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමනි, ඔබතුමාත් බැංකුවක සිටියා. ඔබතුමා ඒ ගැන දන්නවා. සමහර විට ඒවාට Case officers ලා ඉන්නවා, recovery officers ලා ඉන්නවා. ඉන්නවා නේද ගරු මන්ත්‍රීතුමා? ඒ අයත් එක්ක සාකච්ඡා කරනවා. පුළුවන් තරම් හොඳින් මේ වැඩේ කර ගන්න බලනවා. කවදාවත් බැංකුවක් කැමැතිත් නැහැ උසාවියකට යන්න. [*Interruption.*] That is what I said at the very beginning, my dear Friend, that this is a complex matter. You can be in the Opposition and raise that. As your great Leader said, it is only a matter of adding two noughts. I do not think that it is as simple as that. Then, your are reducing your votes also by noughts. So, what are you doing about those things? Let us not keep the Debate at that level. මා මුලින්ම කිව්වේ, මේක සංකීර්ණ ප්‍රශ්නයක් කියලා. මූල්‍ය ක්ෂේත්‍රය කියන්නේ ඔක්කෝටම ඇවිල්ලා ඇඟිලි ගහන්න පුළුවන් එකක් නොවෙයි. ඒක හොඳට කල්පනා කරලා කරන්න පුළුවන් දෙයක්. අපි හැම ක්ෂේත්‍රයක් එක්කම කථා කරලා දැන් මිලියන පහක් දුන්නා. So, be reasonable. එහෙම කරලාත් අඩු පාඩුකම් තිබෙනවා නම් they can come again.

ගරු කථානායකතුමනි, මම මීට වැඩිය කථා කරන්න කැමැති නැහැ. මේක සද්භාවයෙන් කරපු හොඳ යෝජනාවක්. තමුන්නාන්සේලාට මතක ඇති අප මේ සම්බන්ධයෙන් Consultative Committee එකේදී කථා කරන කොට මේ ගණන් හිලවු පිළිබඳව කථා කළ බව. තමුන්නාන්සේලා ඔක්කෝම කිව්වා, "මේක හොඳ දෙයක්. අපිත් මේකට සහයෝගය දක්වනවා" කියලා. [බාධා කිරීමක්] නැහැ, නැහැ, ඒ වෙලාවේ කට ඇරියේ නැහැ නේ. ඒ වෙලාවේ ඔක්කෝම අත උස්සලා බොහොම හොඳයි කියලා පිටට අත ගහලා ගියා. දැන් ඇවිල්ලා, හදිසියේ ඇවිල්ලා -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අපි ලිඛිතව දීලා තිබෙනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

නැහැ, නැහැ. Consultative Committee එකේදි කථා කරපු එක ගැනයි මා කියන්නේ. Consultative Committee එකේදී, you never mentioned "Rs. 50 million".

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

We have given in writing.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Did you say "Rs. 50 million"?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Of course, I said parate execution to be over Rs. 50 million.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Anyway, our position is that it is Rupees five million.

ඒ නිසා මම මීට වඩා කථා කරන්නේ නැහැ. දැන් අපේ ප්‍රතිපත්තිය බැංකු ක්ෂේත්‍රය තවත් ස්ථාවර කරන එකයි. තමුන්නාන්සේලා තමයි කිව්වේ මේවා කඩා ගෙන වැටෙනවා කියලා. තමුන්නාන්සේලා කිව්වා -තමුන්නාන්සේලාගේ මුදල් ඇමති, අගමැති, ජනාධිපති, එයාම කිව්වා- මේවා කඩා ගෙන වැටිලාය කියලා. ඊට පස්සේ පත්‍රවල වැටුණොත් ලොකු ප්‍රශ්නයක් ඇති වෙයි කියලා තමුන්නාන්සේලාම ගිහිල්ලා මේවා කියන්න එපා කියලා ඉක්මනට එයාගේ කට වැහුවා. මේවා ගරු ජෝන් අමරතුංග මැතිතුමාට හොඳට මතක ඇති. එතුමාත් ගිහිල්ලා ඕවා කියන්න එපා කියලා කට වහපු කෙනෙක්. එහෙම කරපු අයත් එකපාරටම දැන් ශාන්තුවරයෝ වෙලා තව බින්දු දෙකක් එකතු කරන්න කියනවා. ඒවා ගැන මේ පාර්ලිමේන්තුවේ වාද විවාද ගැන අපි හොඳට දන්නවා. විශේෂයෙන්ම අපේ ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා මේවා හොඳට දන්නවා. අපි ඒවා අමතක කරලා මේකට සහයෝගය දෙන ලෙස -

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ආර්ථිකය එච්චර හොඳ නම් රජයේ සේවකයන්ගේ පඩිය වැඩි කරන්නේ නැත්තේ ඇයි?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

තමුන්නාන්සේට අර්ථ ශාස්ත්‍රය ගැන පහළ බාලාංශයේ පන්තියක් දෙන්න වෙලා තිබෙනවා. කමක් නැහැ, මේවා පොදු ප්‍රශ්න. අපි සුහදව සාකච්ඡා කරලා විසඳා ගැනීම සඳහා තමුන්නාන්සේලාගේ සහයෝගය ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

[අ. භා. 2.17]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, thank you very much for giving me the opportunity not only to respond to the Hon. Senior Minister, a former Minister of Finance but also to contribute with the knowledge of the United National Party in order to ensure that the borrowers are put in a more safer point, and as to how we can further improve the legislation that you are bringing in, which is not to protect the consumer but the banker.

ගරු කථානායකතුමනි, දැනට තිබෙන ආර්ථික ප්‍රවණතාව, එහි තිබෙන වර්ධනය ගැන හිටපු මුදල් ඇමතිතුමා බොහොම ඕනෑකමින් විග්‍රහ කළා. නමුත් එතුමා කියන මේ බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත තුළින් කෙරෙන්නේ බැංකුවලට තිබෙන රැකවරණය ස්ථාපිත කිරීමයි. ඒ හැර ණය ගන්නා ණයකරුවා ගැන මේකෙන් මොකුත් කථා කරලා නැහැ. මොකද, රුපියල් ලක්ෂ 50කට අඩුවෙන් ණය ගන්න අය ගැන තමයි ආණ්ඩුව අවධානය යොමු කරන්න අවශ්‍ය වෙලා තිබෙන්නේ. අද බැංකුවලින් ඊට වඩා මුදල් ගන්න අය ආරක්ෂා කරන්නේ කොහොමද කියන එකටයි මේ සංශෝධනය ගෙනැල්ලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, අපි මේ සම්බන්ධයෙන් අවුරුදු ගණනාවක් තිස්සේ කියලා තිබෙනවා. යම් විධියකට බොරු, වංචා, සොරකම් මඟින් ආණ්ඩුවේ බැංකුවලින් ණය ගන්න හදනවා නම් ඒවා හෙළිදරවු කරන්න; ප්‍රසිද්ධ කරන්න කියලා අපි කියා තිබෙනවා. නමුත් මෙවැනි දෙදෙනෙක්, තුන් දෙනෙක් හතර දෙනෙක් නිසා මේ බැංකු ක්ෂේත්‍රය කඩා වැටීමේ ප්‍රවණතාව නැති කරන්න ඕනෑ කියන එක අපි එදා සිටම කථා කරලා තිබෙනවා. දැන් ඔබතුමාගේ තර්කවලින් ඉදිරිපත් කරලා තිබෙන්නේ මොනවාද? ආර්ථිකය හොඳයි; ආර්ථිකය හොඳ නිසා මෙවැනි පනත් ගේන්න අවශ්‍යයි කියනවා. මේ ගේන්න අවශ්‍ය වන්නේ ආර්ථිකය හොඳ කරපු කට්ටියට ද, නැත්නම් ණය දීලා ඒවා ගන්න අමාරු වෙලා තිබෙන කට්ටියටද? ඒ කොටස ගැන තමයි කියලා තිබෙන්නේ. අද රුපියල් ලක්ෂ 50කට අඩුවෙන් ණය අර ගෙන තිබෙන කට්ටිය තුළින් රටේ ආර්ථිකය උඩට තල්ලු කර ගෙන යන ක්‍රමයක් ඇති කරන්න ලෙහෙසි වන්නේ නැහැ නේ. ඒ නිසා ගරු ඇමතිතුමනි, මම මේ අවස්ථාවේ දී අහන්නේ මේකයි. Now, what does the Statement of Legal Effect in the Bill say? I quote:

> "Clause 2: The clause inserts new section 5A in the Recovery of Loans by Banks (Special Provisions) (Amendment) Act, No. 4
>
> of 1990 ........ the principal sum borrowed is over rupees five million..."

It basically stipulates that what you are trying to do through this piece of legislation is to fortify the bank and say, "Without fear you give over Rupees five million and we will ensure that your parate execution is made easy." So, what we are basically saying is, Rupees five million today -

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Hon. Member, that is already there in the law.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I know that. If it is there in the law, as the Hon. John Amaratunga mentioned to you very clearly, why did you not make it Rs. 50 million? What is Rupees five million today. This law was brought in when Mr. N.U. Jayawardena was the Governor of the Central Bank to satisfy his ego in the banking sector, but nobody spoke of the consumer. But, there is a necessity for the person who is lending and the borrower both, to be protected. But, what happens here is, actions of the Government alone defeat the purpose because on one side, you are saying that you are protecting them from parate execution. On the other, you have a 26 per cent inflation two years ago. Now, let us assume a person borrows Rupees five million today. Of course, it is not Rupees five million; it has to be Rupees six million because you say Rupees five million or above. The Government brings in a legislation. This happened to a helicopter company. This happened to a domestic airline company. They brought in Rs. 100 million or Rs. 200 million. Suddenly you said that they cannot fly in Sri Lanka. What happened to those companies? All went bankrupt. Now, if the same thing is utilized in this particular lending aspect also, then the deceitful attitude that has got to be taken is owing to the activities of the Government. Now, what I am basically saying here is, either it has to be increased to Rs. 50 million or index it to the inflation because three years later the purchasing power of Rupees five million reduces and you will be basically looking at Rupees one million or Rupees two million worth of loans.

The former Finance Minister was very arrogant. His generous disposition seems to have been somewhat perturbed today. His arrogance was that the Opposition must have their say and the Government must have their way. So, if that is the case, why do you want to bring this to Parliament? If we are just coming here and going to speak and waste our time here, then why do you want to do this? That sense of arrogance has come from the executive down to Parliament now. The Deputy Minister, Hon. Faiszer Musthapha went to court and appeared on behalf of a client. What is going on? This sense of arrogance must stop somewhere. Who is this Deputy Minister who has God-given rights?- [*Interruption.*] Sir, for God's sake, ask these MPs just to keep their mouths shut a little. What is this? - [*Interruption.*] All we have seen is, interruption in this House. This type of nonsense must stop. This sense of arrogance comes from two MPs who went to that side and they are now singing hosannas for their dinner. [*Interruption.*]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

What is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, the Hon. Chief Opposition Whip raised this matter without mentioning the name.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒ නම කියන්න එපා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Now, he is referring to the conduct of the Deputy Minister of whom we have no knowledge and you have no knowledge. Therefore, Sir, he is talking nonsense. It must be expunged. I think, Sir, as far as I am informed, Ministers cannot appear -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒ ගැන තීන්දුවක් දෙනකම් නම සඳහන් නොකර ඉන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම වග කීමකින් කියනවා. අපේ හිටපු ඇමතිතුමා ජෝන් අමරතුංග මැතිතුමා - අපේ Chief Opposition Whip - කියනවා, ෆයිසර් මුස්තාපා මෙහෙම උසාවියට ගිහිල්ලා තිබෙනවා කියලා. [බාධා කිරීම්] මම කියනවා, ගිහිල්ලා තිබෙනවා කියලා. මම මෙතුමා විශ්වාස කරනවා. එතුමා කියන එක මම විශ්වාස කරන්නේ නැහැ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

එතුමා කිව්වේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම දන්නවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහරගම නාගරික මන්ත්‍රීවරයෙක් ඒ නගර සභාවේ අය වැයට විරුද්ධව ඡන්දය දුන් නිසා එතුමාව නෙරපීම සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නයකට එතුමාව ආරක්ෂා කරන්න ආණ්ඩුව නියෝජනය කරන්න මෙතුමා ගිහිල්ලා. මොකක්ද මේ විහිළුව.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

බලපෑම් කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

බලපෑම් කරනවා. මේ වාගේ විහිළු කරන එක නවත්වන්න. ගරු කථානායකතුමනි, විපක්ෂ මන්ත්‍රීවරුන්ට හරි ආණ්ඩු

[ගරු රවි කරුණානායක මහතා]

පක්ෂයේ මන්ත්‍රීවරුන්ට හරි පොඩ්ඩක් හරි ඒ තිබෙන නිදහස, රැකවරණය ලබා දෙන්න මේ අවස්ථාවේදී ඔබතුමා බොහොම වෙහෙස මහන්සි ගන්නවා. ඒක මම දන්නවා. [බාධා කිරීම්] කරුණාකරලා මේ විහිළුව නවත්වන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
විහිළු කරන්නේ ඔබතුමා නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

So, Hon. Minister, while certainly the Government must have their way to do their job, they must also do what they are saying. What they are saying is, do what I say but do not do what I do. Where is good governance in the Government? You are basically telling that a company or an individual that borrows Rupees five million must ensure that they pay in due time and agree to all the conditions of the bank. But, look at what has basically happened to the Government. Look at the Ceylon Petroleum Corporation. The Ceylon Petroleum Corporation lost Rs. 18 billion last year. Now, this has an impact on the macroeconomy. Then, look at Mihin Air. They invested Rupees five billion and lost Rs. 4.5 billion. That money is part of the macroeconomy. Then, look at the CEB. I must say that the Hon. Minister of Power and Energy is making a valiant effort to resurrect the CEB from a very professional point of view. I must concede that if there are certain benefits that need to be given, they have to be given. But, what does the Minister say? He says, "We have Rs.150 billion long-term loans; we have Rs. 75 million medium-term loans and we are losing Rs. 20 billion a year". Is that a healthy statement? That basically shows that the CEB is bankrupt. If it is bankrupt and if banks are lending to such a Government institution, which is a part of the macroeconomy, where is the good governance that is being implemented? It is the same with the Paddy Marketing Board.

ගරු කථානායකතුමනි, ඊයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඉදිරිපිටට වී අලෙවි මණ්ඩලය ආවා, ගිණුම් සාකච්ඡා කරන්න. ඒ අවස්ථාවේ ප්‍රශ්නයක් ඇහුවා, "කොයි කාලයේද, මේ වී අලෙවි මණ්ඩලය වැහුවේ?" කියලා. එතැනදී දුන්න උත්තරය තමයි, "2000 අවුරුද්දේ" කියන එක. කවුද, එතකොට හිටපු ඇමති? වර්තමාන අගමැති. කවුද? ඩී.එම්. ජයරත්න. නමුත් හැම තැනම දාලා තිබ්බේ එක්සත් ජාතික පක්ෂයේ නම. මම ඒ පිළිබඳව බොහොම ඕනෑකමින් දැනුවත් කළා, "මේක වහලා තිබෙන්නේ චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ ආණ්ඩුව කාලයේ, 2000 වර්ෂයේ, මෙන්න වැහුව දවස" කියලා. ඒකේ තිබුණ ණය ප්‍රමාණය කොතරම්ද කියලා බැලුවා. අධික අලාභයක් තිබුණ තැනක්. කොහේද, යහ පාලනයක් තිබෙන්නේ ඒක තුළින්? මේවාට බැංකුවලින් ණය රුපියල් බිලියන ගණනින් දීලා තිබුණා. ලක්ෂ පණහක ණයක් ගත්ත අහිංසක එක් කෙනකුගෙන් parate execution යටතේ තිබෙන වත්කම් ඔක්කොම ගන්නවා. නමුත් ආණ්ඩුවේ ඇමතිවරයකුට, ඒ ඉන්න ලේකම්වරයකුට මෙලෝ දෙයක් කරනවාද? එතුමාව අන්තිමට ඊට වැඩිය උසස් තැනකට තල්ලු කරලා යවනවා. දැන් නම් ඉතින් යවන්න පුළුවන් ජ්‍යෙෂ්ඨ ඇමති වශයෙන්. ඊට පස්සේ ඉතින් ජ්‍යෙෂ්ඨ අගමැතිද, ඊට වඩා අඩුවෙන් වැඩ කරන අගමැතිද මොනවාද වන්නේ කියන්න මම දන්නේ නැහැ. ඉතින් මේවා සම්බන්ධයෙන් මම කියන්නේ මේකයි.

I totally agree with you that these laws should not be made for saints but for sinners. But, in doing that, Hon. Minister, you must ensure that it has a commercial sense. Today's Rupees five million in three years' time will be worth Rupees one million. So, what we are saying is, when there is a fast inflationary-tendency type of economy, you must ensure that you have a realistic figure. What is this Rupees five million? This is what we are saying as the United National Party on behalf of the minority borrowers who are transacting with the commercial banks. If you look at how many people borrow less than Rupees five million, your statistics will not go beyond 5 per cent of the total lending. So, whom is this law going to help? You are only going to help the bankers to recover the delinquent debts. That fact must be accepted. So, do not think that you are trying to help the consumer in any way. If you want to help the consumer, follow the way we are telling you; ensure that you make the loan Rs. 50 million or Rs. 75 million or link it with the rate of inflation. With the rate of inflation, you will get Rupees five million plus, the next year. In five years' time, this Rupees five million will be worth only Rupees one million according to the way the Sri Lanka Freedom Party runs this economy. There was a 26 per cent inflation in the year 2008 and 31 per cent in the year 2007. That would basically mean that the purchasing power has reduced. Therefore, Hon. Minister, what is your answer to this? These are not impracticable, these are easily attainable. But for that, you must have the wherewithal and the courage to think outside the box.

Yesterday, you were very magnanimous in saying that there were very good suggestions that came from the United National Party and as a result you postponed yesterday's vote for today. I hope the same will follow today. You made a big noise saying that the Hon. Leader of the Opposition was making five into fifty. Obviously, you have to add a nought to five to make it fifty and two noughts to make it 500. So, what we are saying is that that zero makes the difference. We are saying this to help the consumer, who is in the small-medium category and is borrowing desperately.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Hero from zero.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

That is right. That is what has happened today. We also have got "zeroes" who are trying to be heroes. The necessary answer will come from those type of persons who come mostly from outstations. You can see how they

try to distract the little that is there within the fortified area of the commercial structure in the country today. So, Hon. Minister, all I would like to say is this. You know what a mess the world is in and I would love to see that the Government accepts this reality. You need not say, Sri Lanka's economy is the best in the world. We are a nation of poverty in an ocean of prosperity but we need to get on to the status of a prosperous nation. That is the phrase that you have been using and I really admire it because it is useful. But, unfortunately it is only a rhetoric today. You are unable to walk the talk owing to the fact that the Government's policy is, look left and turn right. That is the problem. This is where we must ensure that we have a corporate culture that helps build a stronger economy. A stronger economy is necessary to bring in a strong monetary system in this country.

Look at the Budget Speech. The Hon. Dinesh Gunawardena's pet subject is the Budget Speech and he says, "Get on to the Budget speech". You say you gave the benefit of the VAT reduction to the consumer in respect of lending. But, what is the bank that has reduced its rate of lending on that basis, Hon. Minister? No bank has done such a thing. They come and just read out the Budget Speech. Last year they gave a 20 per cent benefit on savings but nobody got that benefit. This time they reduced VAT from 20 per cent to 12 per cent on financial services. Tell me one bank that has done that. The profits of the commercial banks are Rupees six billion in the last year and for a quarter of this year, it is projected at Rupees two billion. All these banks are making a profit of Rupees six to eight billion at the expense of the customer. You need a stronger banking system and I would be the happiest to see that because then only, there will be a surplus which can be utilized to lend at a lower rate. But, are the bankers doing that?

Today, the Central Bank says that the inflation rate is at 5.2 per cent. But, what is the lending rate, Hon. Minister? You are lending to blue-chip companies at 16 to 17 per cent. What is the rationale? You have a figure of 5 per cent as inflation and you lend to blue-chip companies at 16 to 17 per cent. So, there is a 12 per cent gap and where does it go? Assuming that the administration cost is 2 per cent and 3 per cent goes for other activities, there is a balance of 11 per cent. A spread of 6 per cent profit is for these banks. I am talking about State-owned banks. Private Banks are much sleeker and leaner in their management that you get a profit of 8 to 9 per cent. So, Hon. Minister, these unconscionable profits should be reduced and that benefit needs to be given to the customer who is borrowing. So, on that basis do not think you have been magnanimous in giving a cover, a safety net, for the borrower which is from zero to Rupees five million because that does not help at all. It is not enough for any businessman today to start a small enterprise or a medium enterprise unless he sells string hoppers or *bulath* on pavement.

සුළු සහ මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයාට අද ලක්ෂ 50ක් කියන එකෙන් බුලත් කඩයක් දමා ගන්නවා හැරෙන්න වෙන මොනවාද කරන්න පුළුවන්? ඔබතුමන්ලා ආර්ථිකය කඩා වට්ටලා තිබෙන නිසා මේ ලක්ෂ පණහ කියන්නේ අවුරුදු විස්සකට ඉස්සර වෙලා තිබුණු රුපියල් 100ක් වාගේ ගණනක්. ඉතින් ඒ සම්බන්ධයෙන් තමයි මම මේ කියන්නේ. මීට වැඩිය ප්‍රායෝගික රැකවරණයක් දිය යුතුව තිබෙනවා. මේක ලක්ෂ 500ක් වෙනකම් වැඩි කළා නම් මා හිතන්නේ අඩු ගණනේ ඒ ණය ලබා ගන්නාට යම් විධියකින් සෙතක් ලබා ගන්න පුළුවන් වන බවයි.

ගරු කථානායකතුමනි, මොනවාද parate executionවලින් කියන්නේ? තමන්ගේ ජීවිතයේ රැකවරණය ලබා ගන්න අමාරුවෙන් ගොඩ නඟා ගෙන තිබෙන ගෙදරක් හරි කාර් එකක් හරි -ඒ මොනවා හරි- ඒකේ අයිතිය බැංකුවට පවරා ගැනීමේ හැකියාව. ඉතින් මොකක්ද මේ කියන්න හදන්නේ? නිකම් මේ ලොකු දෙයක් කරලා තිබෙනවා වාගේ නේ කියන්නේ. නැහැ. මේ ඔක්කොම ණය දෙන අය ආරක්ෂා කරන්න හදන්නේ. මේ හාල්මැස්සන්ට අමාරු කරලා මිරිකලා මරන්න හදනවා. තල්මසුන් යනවා net එක ඇතුළෙන් දන්නේත් නැතිව. ඕවා නේ, කරන්න හදන්නේ. ඉතින් අපි මේවා කිව්වාම අපි "දේශ ද්‍රෝහියෝ" කියලා කියනවා.

දැන් මොනවාද හෙජින් සූදුව සම්බන්ධයෙන් වන්නේ? අද මෙතැන ඇමතිවරයෙක් නිශ්ශබ්දව සිටිනවා. අවුරුදු දෙකහමාරකට ඉස්සර වෙලා මමත්, ගරුතර පාලිත ස්වාමීන් වහන්සේත් පාරිභෝගිකයා වෙනුවෙන් උසාවි ගියා. එදා තෙල් මිල රුපියල් 152ට තිබුණු එක රුපියල් 75කට අඩු කරන්න ඕනෑය කියලා අප උසාවි ගියා. අපි ඒකෙනුත් ඉල්ලුවා හෙජින් සූදුවේ පිට රට සුද්දන්ගේ බැංකුවට ගෙවන්න එපාය කියලා. මොනවාද කළේ? "මේ බැංකුව තුළත් දේශ ද්‍රෝහී ක්‍රියාවක්, මේ ආර්ථිකය කඩා වට්ටන්න හදනවා" කියලා කිව්වා. අද මොනවාද වෙලා තිබෙන්නේ ගරු කථානායකතුමනි? අද බිලියන 88ක් හා බිලියන 111ක් අතර contingent liability එකක් තිබෙනවා. මම දන්නා විධියට Citi Bank එක arbitration case එක පැරදිලා තිබෙන්නේ. ඉන් පසුව ආණ්ඩුව මේක ගෙවන්න තිබෙනවා. අපි එදා උසාවි ගිහින් Supreme Court එකෙන් නියෝගයක් ගත්තා නම් අද ඒ බිලියන 111 සංවර්ධන වැඩ පිළිවෙළවල්වලට පාවිච්චි කරන්න පුළුවන්. නැත්නම් අපේ අහිංසක පාරිභෝගිකයාට පෙට්‍රල් රුපියල් 75ට විකුණන්න තිබුණා. එදා මොනවාද කළේ? රූපවාහිනියේ, අයිටීඑන් එකේ දමලා "මෙන්න දේශ ද්‍රෝහියෝ" කියලා අපිව පෙන්වන්න පටන් ගත්තා. අද ඒක කරපු ඇමතිවරු දේශ ද්‍රෝහියෝ බවට ඔප්පු වෙලා තිබෙනවා. කවුද මේකට වග කියන්න ඕනෑ? මම බොහොම අගය කරනවා අපේ කථානායකතුමාව. හම්බන්තොට එතුමාගේ දිස්ත්‍රික්කය. ඒ වුණාට එතුමා බොහොම ප්‍රායෝගිකව උත්තර දීලා තිබෙනවා. මම ඒවා යොදා ගෙන මේක දේශපාලන උපක්‍රමයක් ලෙස පාවිච්චි කරන්නේ නැහැ. නමුත් අන්න ඒ -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මෙහේ මුරුංගා නැහැ. ඒ දකුණේ මුරුංගා වැඩියෙන්ම කැවෙන්නේ. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ආ, ඔව්. දකුණේ මේ සැරේ හුඟක් වැඩ වෙනවා. අපි දන්නවා. හැබැයි ඒ වාගේ දකුණේ බඩුවක් නොවෙයි මේ කථානායකතුමා. [බාධා කිරීමක්] එතුමා මොනවාද කිව්වේ? "ජීවන වියදම බොහොම අධිකයි" කිව්වා. අපි කිව්වා නම් කියයි විපක්ෂයෙන් කෑ ගහනවා කියලා. අපේ කථානායකතුමා එහෙම කිව්වාම අපි ගරු

[ගරු රවි කරුණානායක මහතා]

කරන්න අවශ්‍යයි. මොකද එතුමා කියන්නේ සත්‍ය දේ. අපේ කාලයේ පාන් ගෙඩියක් රුපියල් 12යි. අද ඒක 55යි. අපේ කාලයේ හාල් කිලෝ එක රුපියල් 26ට, 27ට තිබුණා. අද ඒක 75යි, 80යි. ස්ථාවර මිලක් දමනවා. සතොසේ රුපියල් 60ට විකුණනවා කියලා කියනවා. සතොස ඇතුළේත් විකුණන්නේ රුපියල් 65ට. මොනවාද කථා කරන්නේ? සතොස ගැන කියලා අපේ චරිත ඝාතනය කරනවා. මොනවාද කළේ? ඔබතුමාට මම තවමත් ගරු කරනවා. මම ඒක හැම අවස්ථාවකදීම කියනවා. මේ රාක්ෂයෝ පහකින් එකෙක් නැති කිරීමට අපිට හැකියාව ලැබුණා. ඔබතුමා ස්තුති කළා. මා අගය කරනවා. මොනවාද කළේ? පට්ටපල් හොරු ටිකක් හිටියා සතොසේ. චන්ද්‍රිකා කුමාරතුංග පාන් 3.50ට විකුණන්න ගිහිල්ලා සතොස කෑවා. එක්සත් ජාතික පක්ෂය 1994 දී රට හොඳට සංවර්ධනය කරලා භාර දෙන කොට වත්කම මිලියන 1,100ක් තිබුණේ. අගෝස්තු මාසයේ 25 වැනි දා චන්ද්‍රිකා ආවා. සැප්තැම්බර් මාසයේ ඉඳලා පාන් රුපියල් 3.50ට වික්කා. සතොස බංකොලොත් වුණා, මිලියන 15,800ක් අවුරුදු එකහමාරකින්. අන්තිමට අපි 2001 දී ඇවිල්ලා ඒක සුද්ද කරලා හොඳට හැදුවා. මංගල බෝයගොඩ ඉතාමත් දක්ෂ පුද්ගලයෙක්. මේක revamp කරලා, restructure කරලා, special provision vehicle එකකට දමලා හදලා බැංකුවලට විකුණලා අන්තිමට ඒක හැදුවාට පසුව මොනවාද කළේ? ඒ හදපු ආයතනය අන්තිමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මහත්මයා 2005 දී වැහුවා. එතකොට ඇඟිල්ල දික් කළේ අපි වැහුවා කියලායි. පාන්වලට තිබුණු හෙණය නැති කරලා, බැංකු ආරක්ෂා කරලා වැඩ කරපු අපිට අන්තිමට අද මොනවාද වෙලා තිබෙන්නේ? එදා කිව්වේ සතොස වහපු නිසා ජීවන වියදම වැඩි වුණා කියලායි. අද ආයතන 250ක් ඇරලා. මොනවාද අඩුවට තිබෙන්නේ? එදා තිබුණු මිල ගණන්වලට වඩා සියයට 500කින් වැඩි වෙලා තිබෙන්නේ.

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
ඔබතුමා අසත්‍ය ප්‍රකාශ කරන්න එපා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කරුණාකරලා ඉඳ ගන්න. ඔබතුමා දන්න දෙයක් ගැන කථා කරන්න. අර කැගල්ලේ මුස්ලිම් පල්ලි කැඩුවා වාගේ කරුණාකරලා මේ තිබෙන ආර්ථික ශක්තියත් කඩා ගෙන යන වැඩ කරන්න එපා. මේ දන්නා ඇමතිවරු කථා නොකර සිටිනවා. ගරු කථානායකතුමා හම්බන්තොට කිව්ව දේ නිසා තමයි අද මේ පාර්ලිමේන්තුවේ ඔබතුමාගේ පැත්තේ අය නිශ්ශබ්දව සිටින්නේ. අපි අගය කරනවා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අද ලක් සතොසෙන් රාජ්‍ය සේවකයන්ට අඩු මිලට බඩු ගන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අනේ, ගන්න පුළුවන්! ඔය ලක් සතොසවල් 250කින් ලක්ෂ 210ක ජනතාවට ගිහින් බඩු ගන්න තිබෙනවා? දන්නා ආර්ථිකයක් ගැන කථා කරන්න.

අද සැබෑ තත්ත්වය නම් ගරු කථානායකතුමනි, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ඔබතුමාගේ තිස්සමහාරාම ආසනයේ තිබෙන පොල් ගෙඩියක් රුපියල් 55යි. ඩුබායිවල ගිහිල්ලා පොල් ගෙඩියක් ගන්න පුළුවන්, රුපියල් 45ට. මොන හෙණ ගහන දෙයක්ද මේක! මොනවාද මේ කථා කරන්නේ? ඉතින් මේ වාගේ රටක, මේ වාගේ දූපතක ඉන්න පාරිභෝගිකයා අද පොල් ගෙඩියකට -අපි අපනයනය කරන කර්මාන්තයක්- රුපියල් 55ක් ගෙවනවා; ඩුබායිවල ගිහිල්ලා රුපියල් 45කට ගන්න පුළුවන්. හෙණ ගහන වැඩක් නේ!

ගරු කථානායකතුමනි, අපි මේ සම්බන්ධයෙන් කථා කරන්නේ-

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අර එතුමාත් මහප්පා කියපු දේ සනාථ කරන්න නැඟිට්ටා. මම මේ කියන්නේ අපි කොහොමද රටේ ආර්ථිකයක් හදන්නේ කියලායි. අපි මෙතැන කියන්නේ අද රටේ අවශ්‍යතාව වෙලා තිබෙන්නේ රටේ ආර්ථිකයක් හදන්න. මේකේ නිල් පාට, කොළ පාට, රතු පාට, දම් පාට කියලා දෙයක් නැහැ. නමුත් අපි කියන දේත් අහන්න. අද ඉදිරිපත් කරනු ලබන මේ පනත් කෙටුම්පතේ සඳහන් වන මේ රුපියල් මිලියන පහ කියන එක රුපියල් මිලියන පණහ කරන්න. කාටවත් මේකෙන් හානියක් සිදු වන්නේ නැහැ. මේකේ හානියක් වනවා නම් වන්නේ බැංකුවට නීතිමය පැත්තෙන් තව පොඩ්ඩක් අමාරු වනවා විතරයි. නමුත් ණය ගන්න අයට ඒක ලොකු නිදහසක් වනවා කියන එක මම මේ අවස්ථාවේදී ඉතාමත් බැගෑපත්ව ණය ගන්නා අය වෙනුවෙන් මතක් කරන්නේ. නැත්නම් තව අවුරුදු හතර පහකදී මේ රුපියල් මිලියන පහ කියන එකේ තුට්ටු දෙකක වටිනාකමක් නැහැ. ඒ කියන්නේ purchasing power එක අඩු වනවා.

Now, look at the world today. The United Kingdom is slashing Sterling Pounds 180 billion off their State expenditure. Ireland is slashing US Dollars 114 billion, Greece - US Dollars 89 billion, Portugal - US Dollars 121 billion and Spain - US Dollars 117 billion off their State expenditure. I am only mentioning these figures to show that the world is in chaos. So, we do not need to be shameful to say that we have a problem. We must accept that we have a problem, but we are a small part of the titanic movement that is taking place in the world. So, Hon. Minister, be magnanimous. Do not say, "We have our say and you do what you want, but we have our way". We have a say as well as a way because what you are unable to attain today, we will attain tomorrow. But, ensure that the passage is made comfortable.

Hon. Minister, another thing we would like to know is whether the law is retrospective. You said it will be practically retrospective because the bankers will realize that tomorrow's borrower will have a Rupees five million guarantee and today's borrower has no guarantee and as a result, they would think, "Let that benefit come in". That means you are leaving it to the discretion of the banking officer. But, that type of society does not exist. When you go there, if you wear blue colour, you will get one kind

treatment and if you wear green, you will get another or else, you will be transferred to Jaffna or Vavuniya. So, I think you have to be much more clearer .

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Hon. Member, I want to clarify this issue. If this is passed, then that becomes the law with which all the banks must comply; they must submit to that.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

The question that was put forward by the Hon. John Amaratunga -

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Anything that is being discussed now, will be finalized in terms of our decision today.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Minister, laws cannot be retrospective in effect. So, what you could do is, you could convert the loans into today's loans and make it prospective from today.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

The Hon. Member wanted to know what was going to happen to the cases which are pending, under discussion. Those will be finalized in terms of the law that we are going to pass.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

But, according to this particular Statement on the Legal Effect, it would not happen, because it is prospective. It would be effective immediately after the Speaker gives his assent to this Bill this evening.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Hon. Member, it applies in terms of the final decision because there are a large number of cases which are pending in these banks. Now, they will be able to decide in terms of the Bill that is going to be passed in Parliament today.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

For how many Members of Parliament from the Opposition, have banking loans being utilized as a basis for jumping from this side to that side? These are the cheap-scale political landscape that is there today. So, what I am saying is to stop these types of things that are going on. Ensure that we head towards a more magnanimous society. That is what we have got to do. What we have got to do for the benefit of the country's economy is to withstand all vicissitudes.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

You may be right. But, that has nothing to do with what we are discussing here.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

But, certainly, we are passing a law today. This is Parliament. So, we are debating this Bill today. We have got to talk here what we need to do tomorrow. You cannot talk about these things in the Colombo Municipal Council.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Hon. Member, if you can talk anything under the sun, then what is the purpose of going through all these procedures of bringing a Bill, tabling it and discussing and all that? You are limited as I am limited, to discuss this Bill before the House.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

That is why I am saying that you are not limited.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

From the beginning of the Parliamentary system, that has been the convention.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

That is why I am saying that you are not limited.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Your favourite style of oratory is cherry-picking. You take one little thing from somewhere and then present it. Of course, that is up to you. But, today, please confine yourself to what we are discussing here.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා මෙහෙම කථා කරන කොට ගරු කථානායකතුමා කියනවා, මට නියමිත වෙලාවත් සීමා වෙලා තිබෙනවාය කියලා. Do not think that you are stymied. You have all the powers to accept with generosity and to ensure

that the lenders are protected up to Rs. 50 million and go forward, because I believe a Rs. 50 million borrower is well beyond the small and medium sector and that he does not need additional precautions. I am telling you one thing - the Government's business policy also affects a borrower. Suppose you start a business today and you bring in a 10 per cent tax, then it affects his cash flow by 10 per cent. If by chance, if it is a company that is having a lot of competition, then it affects his cash flow and in a year or two he may have this problem of parate execution. There is another issue. If you give a loan of Rupees five million, there is no issue. If you give a loan of Rupees six million and pay in one year, then there is no issue. At what point do you do it? You pay interest plus capital. Is it on a loan that is above Rupees five million or is it the principal capital that is left behind?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
You must read the Bill. It is very clear.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
It is not clear. According to the Bill, it excludes the interest. But, here it does not clearly say. When the loan is paid, first the interest component is paid and the capital is left behind.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
That is very clear.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
You and I are talking here, but the banks are utilizing it. We first take the interest and the capital is kept till the end. At the end of the day interest is taken off and the capital component remains.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
That is precisely why they are precluded from doing that in terms of this law. That is why they brought in this law. Do you want me to read that again? I do not want to take your time.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
No, I do not need that. But, the problem is that you and I are basically looking at it from a macro picture. But, that is not implemented by a bank officer down there.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
You are talking about -

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Let it go to the Hansard. Then, at least someone who goes to court will basically say at least there was a Member of Parliament from the Opposition who spoke on behalf of them at that particular moment. So, let it be on record at this particular moment.

Then, the other matter is regarding going into the CRIB. At what point do you send him to the CRIB? Now, today you have not ensured that you protect the CRIB because the CRIB is a very draconian piece of legislation that is there. As soon as a banker finds that he is not able to deal with a borrower, he goes into the CRIB. Now, that is not there with some of the State patronage people. But, the normal man - hoi polloi - who is borrowing is living through the CRIB. So, Hon. Minister, this is another area that you need to rectify because there is no point saying, "Okay, we protect you from zero to Rupees five million on parate execution". You put the same fellow back into the CRIB which is worse than parate execution, because the little he can resurrect himself by getting another loan from another bank is precluded, is prevented owing to the fact that his name is there in the CRIB. So, these are the areas regarding which we said, "Do not bring piecemeal legislation". If you are bringing, ensure that you bring in a wholesale approach, that the borrower is protected from this type of thing. That is why I went even further to state that for anybody who borrows more than Rupees 500 million, ensure that his banking secrecy is taken off and he is named if he has been a delinquent payer. Otherwise, ensure that we protect these people and give the comfort factor because at the end of the day you are basically living off that innocent person who is not even 5 per cent of the total lending of those banks.

I will take another classic example of Kabool Lanka (Pvt.) Limited which was having loans to the tune of Rs. 5.5 billion with two banks. One was the HNB and the other was Bank of Ceylon. Rs. 5.5 billion was owed to those banks - one was a State bank and other was a private bank. Then, the Board of Investment through the Minister in charge in 2004, decided to give Kabool Lanka (Pvt.) Limited to a private sector company. What did he do? He sold it at Rupees one billion. The balance Rs. 4.5 billion was left it in the hands of the Government. Now, who is to be held responsible? Is it the Government? Is it the bank? No, the banks were told, "You find your own way". The Government seized the asset from the person who was having a loan that was fully covered by their asset and said "No, I am sorry, we are taking this asset and we are selling it for Rupees one billion, you take the rest of Rs. 4.5 billion".

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Are you talking about the HNB?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I am talking about both HNB and Bank of Ceylon.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Now, they have got their money.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
No. they have not. They had to have a haircut of almost about 40 per cent.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
"Haircut" means that both parties agreed?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
No, the Government seized that asset. They thought that it was better to get a rupee rather than not getting anything. But, if they had the asset in their hands, if they had the collateral in their hands -

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
If the bank is satisfied ,why are you worried?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Minister, that is why I said that if you say that the Opposition must have their say, listen to what we are saying. What I said was that the Bank of Ceylon had Rs. 2.5 billion and HNB had Rs. 2.5 billion. They had a fully secured loan of about Rs. 6 billion. But, when you take the asset away, they have no asset to cover the loan that was there. Then, what are you expected to do? The Government came and forcefully took it off and said "You go and get the money from Kabool". Where is it? If they had the asset, they could have sold the asset and got it. The Government did not give the Bank of Ceylon and the HNB their right to collect the money. Now - [*Interruption.*]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Why not? That asset was given to MAS Holdings.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
It was given to MAS Holdings for Rupees one billion. What happened to the Rs. 4.1 billion that was outstanding through Kabool? That is why I am telling that good governance is not there in this Government. You are telling us, "Do what we say but do not do what we do". We are trying to highlight that type of a government. You think that we, the United National Party, are traitors when we mention this, but those who implement this are nice statesmen.

So, Hon. Minister, all what we are saying is, please be more merciful to the people who borrow less than Rs. 50 million and ensure that this comfort factor is given, so that they can do a decent business borrowing from banks, without a fearful tomorrow that their houses will be robbed by these banks, they will feel that the economies are run down not by the people who have borrowed the money but by the Government owing to certain conditions, maybe within their control or completely outside their control.

ගරු කථානායකතුමනි, අපි ඉතාමත් ඕනෑකමින් කියන්නේ, රටේ ආර්ථිකය නිසියාකාරව ක්‍රියාත්මක වනවා නම් මේ ප්‍රශ්නය එතරම් අමාරු කාර්ය භාරයක් නොවෙයි කියලායි. රටේ උද්ධමනය සියයට එකේ, සියයට දෙකේ සැබෑ ප්‍රායෝගික මට්ටමට වනවා නම් මේක ප්‍රශ්නයක් නොවෙයි. මේක දේශපාලන රැකවරණයක් පාවිච්චි කරලා, මේ පැත්තේ ඉඳලා ඒ පැත්තට ඡන්දය දෙන්න, මේ පැත්තෙන් ඒ පැත්තට පනින්න, එහෙම නැත්නම් අපි parate execution කරනවාය කියා කියනවා වාගේ වාතාවරණයක් නැත්නම් ප්‍රශ්නයක් නැහැ. නමුත් අපි නීති හදන්න ඕනෑ, පවුකාරයාට මිසක් ශාන්තුවරයාට නොවෙයි. ඒ ණය ගන්න අය වෙනුවෙන් එක්සත් ජාතික පක්ෂයේ අපි ඉතාමත් වග කීමකින් ඉල්ලනවා, කරුණාකරලා මේ මුදල රුපියල් මිලියන 50 දක්වා වෙනස් කරන්න කියලා. CRIB එකට යන ගණනත් රුපියල් මිලියන 50 දක්වා වැඩි කරන්නය කියා ඉතා බැගෑපත්ව ඉල්ලා සිටිනවා. මෙම පනත් කෙටුම්පත ගෙන ඒම පිළිබඳව එක්සත් ජාතික පක්ෂය වශයෙන් අපි ඉතාමත් අගය කරනවා. නමුත් එහි සඳහන් ගණන කරුණාකරලා රුපියල් මිලියන 50 දක්වා වැඩි කරන්නය කියලා මා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි. ඊ ළඟට ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා.

[අ. භා. 2.51]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු කථානායකතුමනි, බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත මඟින් රුපියල් මිලියන 5ක් දක්වා වන ණය නිදහස් කරමින්, "පරාටේ" නීතිය යටතේ දේපොළ අත් පත් කර නොගෙන, ණය ගෙවීමට අපොහොසත් වන අය නිදහස් කර ගැනීම සඳහා සාමාන්‍ය බැංකු රීතිය පමණක් පාවිච්චි කිරීමට හැකි වනවා. එම නිසා අපි මේ සංශෝධනය ඉතා අගය කරන්නට ඕනෑ.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

මා පළමුවෙන් සඳහන් කරන්න කැමැතියි, 1990 අංක 4 දරන මේ පනත 1990 වර්ෂයේ ඉදිරිපත් කරන ලද්දක්. එය අද දින තවත් සංශෝධනයකට ලක් වනවා. ගරු විපක්ෂ නායකතුමා නැඟිට යැමට පෙර එතුමා සඳහන් කළා, රුපියල් මිලියන පහේ සීමාව රුපියල් මිලියන 50 දක්වා වැඩි කරන්නය කියලා. ගරු කථානායකතුමනි, මා ළඟ තිබෙනවා, එදා 1990 ජනවාරි මාසයේ 23 වන දා හා 30 වන දින, බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත ඉදිරිපත් කළ අවස්ථාවේදී විරුද්ධ පක්ෂ නායකතුමාගේ කථාව සඳහන් හැන්සාඩ් වාර්තා. ඒ වන විට තිබුණු රුපියල් 1,50,000ක සීමාව වැඩි කරන්න කියලා මගේ කථාවේදී මා කරපු ඉල්ලීම ප්‍රතික්ෂේප කළ බව 1990 ජනවාරි මස 30 වන දින හැන්සාඩ් වාර්තාවේ 1680 වන තීරුවේ සඳහන් වනවා. රුපියල් 1,50,000ක සීමාව වැඩි කරන ලෙස කළ ඉල්ලීම විරුද්ධ පක්ෂයේ නායකතුමා එදා ප්‍රතික්ෂේප කළා. එහෙමයි විරුද්ධ පක්ෂයේ නායකතුමා එදා මේ parate execution ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පිළිවෙත පිළිබඳව කටයුතු කළේ.

අද අපි බොහෝ දුර ඇවිත් තිබෙනවා. බැංකු ක්‍රමයේ වාසි බොහෝ අය අරගෙන තිබෙනවා. එක්සත් ජාතික පක්ෂය දකින ආකාරයට නොවෙයි, බැංකු ක්‍රමය පුළුල් වෙලා තිබෙනවා. අප නියෝජනය කරන ජනතා අපේක්ෂාව මේ රටේ බැංකු ක්‍රමය කඩාකප්පල් කිරීම නොවෙයි. අද මේ රටේ ජනතාවට බැංකු ගැන කථා කරන්න පුළුවන් නම් ඒ කථා කරන්න පුළුවන් වන්නේ ගරු කථානායකතුමනි, ප්‍රගතිශීලී ආණ්ඩු නිසායි. ලංකා බැංකුව ජනසතු කළේ අපේ ආණ්ඩුවයි. මහජන බැංකුව ඇති කළේ අපේ ආණ්ඩුවයි. ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමාගේ කාලයේ ජාතික ඉතිරි කිරීමේ බැංකුව ඇති කළා. එම නිසා මේ බැංකු ක්‍රමය ජනතාවගේ ජයග්‍රහණයක් බවට අද පත් වෙලා තිබෙන්නේ මේ ප්‍රගතිශීලී ආණ්ඩු නිසායි කියන එක මා පළමුවෙන් මතක් කරන්න ඕනෑ.

නමුත් අපි සහනයන් ඇති කරන්න ඕනෑ. ගරු ආචාර්ය සරත් අමුණුගම ඇමතිතුමා මේ සම්බන්ධයෙන් සඳහන් කළා. "පරාටේ" නීතිය යටතේ ඇති වී තිබෙන මේ භයානක වගන්තියට 1990 දී මේ ගරු සභාවේ විපක්ෂයේ ඉඳ ගෙන අපි විරුද්ධ වුණා. මෙය වැරදි විධියට පාවිච්චි වන්න පුළුවන්. ණය ක්‍රමයේ ගනුදෙනුවලට අවතීර්ණ වන අය ණය ගැනීමේ ඕනෑකම නිසා සමහර විට අනවබෝධයෙන් කොන්දේසිවලට යටත් වනවා. මේ වාගේ ණය ක්‍රමවල නීති රීති, සහනයන් ඇති අපේ ආර්ථිකයේ පහළ ආදායම්ලාභීන්ට ජාතික නිෂ්පාදනයට උදවු වන්න මේ සීමාව වැඩි කරන්න ඕනෑ. එම නිසා මේ සීමාව අද රුපියල් මිලියන 5 දක්වා වැඩි කිරීමෙන් අපි විශාල ප්‍රගතියක් දකිනවා. මේ රටේ ගොවි ජනතාව මෙයින් සහන ලබනවා. ගරු කථානායකතුමනි, අද කුඩා අත් ට්‍රැක්ටරයක් වුවත් ණයට ගැනීමේදී මුහුණ දෙන තත්ත්වය ඔබතුමා දන්නවා. එසේ නැත්නම් ගමේ ජීවත් වන තමන්ගේ අස්වැන්න ණයට තියලා සල්ලි ගන්න ගොවීන්ට මෙවැනි දෙයකින් නිදහස් වෙන්න පුළුවන්. ඒවා ගැන එක්සත් ජාතික පක්ෂය කතා කරන්නේ නැහැ. වැඩ කරන කම්කරුවන් බොහෝ දෙනා තමන්ට ගෙයක් හදා ගන්නට ණය ගැනීමේ ක්‍රමවලට අවතීර්ණ වෙනවා. ඒ අයට සහන දිය යුතුයි. මේ ක්‍රමය අනුව මේ සීමාව රුපියල් මිලියන 5 දක්වා වැඩි කර තිබෙන නිසා කම්කරු ජනතාවට විශාල සහනයක් ලැබෙනවා. සාමාන්‍ය ජනතාව මේ ණය ක්‍රමය යටතේ සහනයක් ලබනවා. මේ ණය ක්‍රමය යටතේ මේ සෑම බැංකුවක්ම අක්‍රිය ණය, බොල් ණය සඳහා යම් මුදලක් වෙන් කරනවා. ලංකා බැංකුව 2008 දී මිලියන 13,816ක් වෙන් කළා. 2009 දී මිලියන 15,542ක් සහ 2010 දී මිලියන 12,000ක් වෙන් කළා. මේ ණය දීම හා ණය ගෙවීමේ අපහසුතාවන්ට පත් වන පහළ මට්ටමේ අයට මේ තුළින් විශාල සහනයක් ලැබෙනවා. සුළු ව්‍යාපාරිකයන්ට, කුඩා කර්මාන්තකරුවන්ට, ස්වයංරැකියාවලට අවතීර්ණ වන අයට කිසිම බියක් නැතුව යම් කිසි දුරකට ඒ නිෂ්පාදන ක්‍රියාමාර්ගවලට එන්නටත් මේ තුළින් සහනයක් ලැබෙනවා. ණය ගෙවනවා නම් ණය ගැනීමට අපි බය වෙන්න ඕනෑ නැහැ. "සණස" වාගේ බැංකුවල ණය නොගෙවීම සියයට 5ටත් අඩුයි. "සණස" සාමාජිකයන් බොහොම හොඳින් ණය ගෙවනවා. ඒ විශ්වාසය මත ගනුදෙනුව ඉතා හොඳින් කෙරෙනවා. ඒක තමයි බැංකු ක්‍රමයේදී අවශ්‍ය වන්නේ. ආර්ථික කටයුතුවලදී බැංකු ක්‍රමය පළල් වෙන්න ඕනෑ. අපි ණය සඳහා දේපොළ ඉල්ලපු කාලය එන්ට එන්ටම අඩු වෙන්න ඕනෑ. ගරු කථානායකතුමනි, ඔබතුමාත් මේ ගැන එකඟ වෙනවා ඇති. කුඩා පරිමාණයේ ණය ගන්නා අයගේ දේපොළ ඉල්ලන ප්‍රමාණය අඩු කරලා ණය දෙන්න පුළුවන් වෙනවා නම් තමයි අපේ බැංකු ක්‍රමය වඩාත් දියුණු තත්ත්වයකට පරිවර්තනය වන්නේ. බැංකු ක්‍රමය සමග සම්බන්ධ වෙමින්, බැංකු ක්‍රමය කෙරෙහි තිබෙන විශ්වාසය වැඩි කරමින් කටයුතු කළොත් තමයි අන්න ඒ ඉලක්කයට ගමන් කිරීමට අපට පුළුවන්කම ඇති වන්නේ.

ආර්ථික වශයෙන් බැලුවොත් අපේ රටේ වැව්ලි ආර්ථිකයට සම්බන්ධ ගොවි ජනතාව අතිමහත් බහුතරයක් ඉන්නවා. කම්කරු ජනතාව අතිමහත් බහුතරයක් ඉන්නවා. අඩු ආදායම් ලබන විවිධ ශිල්පවල යෙදී ඉන්න ජනතාව එකතු කළොත් මේ රටේ ජනතාවගෙන් අතිමහත් බහුතරයක් ඉන්නවා. ඒ අයගේ ණය ගැනීමේ උත්සාහයට අපි අවහිර වෙන්න හොඳ නැහැ. ඒ අයට ණයක් අරගෙන ගෙවීමට තිබෙන ඉඩකඩ ලිහිල් කරන්න ඕනෑ. එවැනි ලිහිල් කිරීමක් තමයි අද මේ සංශෝධනය තුළින් කෙරෙන්නේ. මෙකේ වාසිය ගන්න පුළුවන් ලොකු ව්‍යාපාරිකයෝත් ඉන්නවා. ඒ වාසිය අරගෙන තමන්ගේ වත්කම් වැඩි කර ගන්න පුළුවන්. නමුත් අපි ප්‍රධාන වශයෙන් සඳහන් කරන්න ඕනෑ, මෙහි සහනය දිනා ගැනීමට අපේ පොදු ජනතා කොට්ඨාසවලට හැකියාව ඇති වන බව. විශේෂයෙන් අද කුඩා පරිමාණ ස්වයංරැකියා ක්ෂේත්‍රය අපේ රටේ ආර්ථිකයට සුවිශේෂ ක්ෂේත්‍රයක් ලෙස ඇතුළු වෙනවා. බියකින් තොරව ණයක් ගන්න පුළුවන්ය කියා ණය ලබා ගැනීමට තිබෙන ක්‍රියා මාර්ගය ගැන අප ඒ අය තුළ විශ්වාසය ජනිත කරන්න ඕනෑ.

රවි කරුණානායක මන්ත්‍රීතුමා හෘදය සාක්ෂියට එකඟව මේ පරාටේ නීතිය ගැන එක වචනයක් කිව්වා; මේක එන්.යූ. ජයවර්ධන මැතිතුමාගේ නිර්මාණයක්ය කියා. අපි එදා 1990 දී විපක්ෂයේ ඉඳ ගෙන කිව්වා, මේක පෞද්ගලික බැංකු ක්‍රමය නොවෙයි, finance companies සඳහා හදපු නීතියක්ය කියා. එතුමා එදා ප්‍රසිද්ධියේ කතා කළා මේ නීතිය ඕනෑය කියා. ගරු කථානායකතුමනි, අද අපි මේකට සංශෝධනයක් ගෙනෙනවා. දැන් ඒ සංශෝධනය බෙදා හරිනු ලැබුවා. ගරු කථානායකතුමනි, මේ සම්බන්ධ අර්ථ නිරූපණයේ බැංකුව යන්නෙන් 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව සඳහන් වී ඇති යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් අදහස් වෙනවාය කියා තිබෙනවා. ඒ නිසා ඒ තුළින් බැංකු ක්‍රමය සම්පූර්ණයෙන් ආවරණය වෙනවා. මේ බැංකු ක්‍රමය පළමු කොටම එළිදැක්කේ එසේ නොවෙයි. පසුකාලීනව එය සංශෝධනය වුණා. අද ඒකට ඊටත් වඩා පැහැදිලි අර්ථයක් ලැබී තිබෙනවා. සෙලාන් බැංකුවට වෙච්ච දේ බලන්න. විරුද්ධ පක්ෂය අද ඒ ගැන කථා කරනවාද? සිද්ධ වුණේ මොකක්ද? ඒක බේරා ගන්න පුළුවන් වුණේ මධ්‍යම බැංකුව මැදිහත් වුණු නිසා. සෙලාන් බැංකුවෙන් බැට කාපු අය කොච්චරද? සෙලාන් බැංකුව කඩා වැටෙන කල්ම දන්නේ නැහැ. නමුත් ඒ හැම කෙනෙකුගෙන්ම මේ පරාටේ නීතිය යටතේ දේපොළ ගන්න ඕනෑ කියලා තීරණයක් තිබුණා. මේ නිසා සල්ලි දාපු පොඩි මිනිස්සු කුඩා ණය ගත්තු මිනිස්සු අද මෙයින් මුදා හරින්න පුළුවන් අවස්ථාවකට පැමිණෙනවා. මා හිතන්නේ ගරු ආචාර්ය සරත් අමුණුගම මැතිතුමා මෙයින් මතු වන තවත් ගැටලුවකට ඉතා පැහැදිලි ප්‍රතිඥාවක් දුන්නා. දැනට ණය අරගත්ත අය මේ නීතිය යටතේ සහන ලබනවාද? මේ නීතිය යටතේ සහන ලබා දෙන්නයි

මේ මුදල් ප්‍රමාණය මිලියන 5 දක්වා වැඩි කරන්නේ. ඒ සහනය ලබා ගනිමින් බැංකු ක්ෂේත්‍රය සමඟ කටයුතු කරන්නට පුළුවන්කමක් ඇති කරන්න ඕනෑ. එහෙම නැත්නම් සිද්ධ වන්නේ මොකක්ද, ගරු කථානායකතුමනි? අප්‍රකාශිත මූල්‍ය ක්‍රමයක් ලංකාවේ වැඩ කරන්න පටන් ගන්නවා. බැංකු තිබෙනවා, මූල්‍ය ආයතන තිබෙනවා, නමුත් වෙනත් වෙනත් තැන්වල කළු සල්ලි බැංකු වැඩ කරන්න පටන් ගන්නවා. මේ තත්ත්වය වෙනසකට පරිවර්තනය කරන්න අද මේ සංශෝධනයෙන් තවත් ශක්තියක් ලබා දෙනවාය කියන එකයි අපි දකින්නේ.

මා දීර්ඝ වේලාවක් කථා කරන්න උත්සාහ දරන්නේ නැහැ. එක් පැත්තකින් අපි මේ රටේ ආර්ථිකය පළල් කර ගෙන යන කොට, මේ ආර්ථිකය පළල් කරන මහින්ද චින්තන වැඩසටහනට අනුව අලුත් අයට ආර්ථිකයට ඇතුළු වෙන්න ඉඩ ප්‍රස්ථාව දෙන්න ඕනෑ. ඒ අලුත් අයට ආර්ථිකයට ඇතුළු වෙන්න ඉඩ ප්‍රස්ථාව දීමට නම් පුළුවන් තරම් බැංකු ක්‍රමයෙන් දමන කොන්දේසි ක්‍රමානුකූලව අපි ලිහිල් කරන්න ඕනෑ. එසේ ලිහිල් කරන විට ඊට අලුතෙන් ඇතුළු වෙන්න ඉන්නේ කවුද? අපේ කුඩා පරිමාණ අය. අපේ බර එතැනයි. අපේ ගොවීන්ට ඔවුන්ගේ ආයෝජනයන් කරන්න, තවත් ක්‍රියා මාර්ගවලට අවතීර්ණ වන්න ණයක් ගන්න, අපේ කුඩා කර්මාන්ත කරන ස්වයං රැකියා කරන අයට කුඩා ණයක් ගන්න, කරදරයකින් තොරව, බියකින් සැකයකින් තොරව ණයක් අරගෙන වැඩ කරන්න, තමන්ගේ යන්ත්‍රෝපකරණ උස්සා ගෙන ගිහිල්ලා විකුණා දමයි කියන බියෙන් මිදිලා ණයක් අරගෙන වැඩ කරන්න පුළුවන් වුණොත් තමයි ලංකාවේ විවිධ ක්ෂේත්‍රවලට මේ කටයුතු සඳහා ඇතුළු වෙන්න ලැබෙන්නේ. අපි මහා පරිමාණ අය දිහා බලමු. මහා පරිමාණ අය ගැන කථා කරන්න පුළුවන්. මහා පරිමාණ අය තමයි අද අපේ මේ ආර්ථිකයේ ප්‍රධාන අංශ දුවවන්නේ. ඒක ඇත්ත. නමුත් ඒ මහා පරිමාණ අංශ නියෝජනය කරන අය හැම දාම කථා කළේ මහා පරිමාණ අය නියෝජනය කිරීමයි. මහා පරිමාණවල කිසිම ආකාරයකින් ණයක් නොගෙවා හැරීමට හේතුවක් මතු වන්නේ නැහැ, ගරු කථානායකතුමනි. ඒ අය සුවිශේෂ ගණකාධිකාරින්, විගණනාධිකාරින්, ආයෝජක උපදේශකයන්, මූල්‍ය උපදේශකයන් ලබා ගෙන තමයි තමන්ගේ ආයතන දුවවන්නේ. ඉතින් ඒ අයට වරදින්නේ කොහොමද? ඒ අයට වරදින්නේ තමන්ගේ ලාභය උපයා ගන්න බැරි සීමාව අඩු වුණොත් පමණයි. තමන්ගේ ලාභය උපයා ගන්න බැරි සීමාව අඩු වුණොත් පමණයි ඔවුන් අද කථා කරන්නේ. එසේ නොවෙයි, සාමාන්‍ය ව්‍යාපාරිකයන්. එසේ නොවෙයි, කුඩා ව්‍යාපාරිකයන්. එසේ නොවෙයි, තනි ගෙයකට සීමා වෙච්ච පවුලක ව්‍යාපාරිකයන්. ඒ කිසි විශේෂඥ සහයෝගයක් නැතිවයි ඒ අය ආර්ථිකයේ නිෂ්පාදන ක්ෂේත්‍රවලට, සේවා අංශවලට ඇතුළු වන්නේ. ඒ නිසා මේ අවස්ථාව උදා කර දීම ගැන මා විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමාටත් මුදල් අමාත්‍යාංශයටත් යළිත් ස්තුතිවන්ත වෙනවා. ගරු සරත් අමුණුගම ඇමතිතුමා මෙහි අරමුණු පැහැදිලි කළා.

ගරු කථානායකතුමනි, මම මේ අවස්ථාවේදී මේ කාරණයත් සිහිපත් කරන්න ඕනෑ. මේ බැංකු ක්‍රමය හරි භයානකයි. මොකද, මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය මුදල් ඇමතිවරයා හැටියට ඉන්නේ ගීතාංජන ගුණවර්ධන මැතිතුමායි. එතුමාගෙයි, මගෙයි පියාට 1959 දී මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුවෙන් ගෙදර යන්න වුණේ මහජන බැංකුව කියලා බැංකුවක් ඇති කරන්න ගිහිල්ලායි. එදා වැඩ වර්ජනයක් තිබුණා. ඔබතුමාගේ ආදරණීය පියා ඒක සමථයකට පත් කරන්න විශාල උත්සාහයක් දැරුවා. එතුමාට අපේ ගෞරවය දක්වනවා. මේ ලොකු මිනිස්සු විරුද්ධ වුණා, පොඩි මිනිස්සු වෙනුවෙන් බැංකුවක් ඇති කරන්න. අමාත්‍ය මණ්ඩලය වැඩ වර්ජනයක් මෙහෙයවලා, "පිලිප් ගුණවර්ධන මහතාව එළවන තුරු අපි එන්නේ නැහැ"යි කියලා කැබිනට් මණ්ඩලයට කිව්වාම එතුමාට සිද්ධ වුණා, අයින් වෙලා යන්න. ඒ, මේ බැංකු ක්‍රමය නිසා. ධනපති පන්තිය සීමා සහිතව තමන්ගේ සම්පත වැඩි කර ගැනීම පමණයි අපේක්ෂා කරන්නේ. ඒ අය ආර්ථිකය පළල් කරමින් පළල් වූ ජනතාවකට ආර්ථිකයට ඇතුළු වෙන්න ඉඩ දෙන්නේ නැහැ. අපි එසේ දකින්නේ නැහැ. පළල් වූ ජනතාවකට අලුත් අවස්ථාවලින් ආර්ථිකයට ඇතුළු වීමට ඉඩකඩ ඇති කරන ආර්ථික වැඩ පිළිවෙළක් සඳහා මේ රජයට අතිගරු ජනාධිපතිතුමා නායකත්වය දෙනවා. ඒ සඳහා ආරම්භයක් වශයෙන් මේ රුපියල් මිලියන 5ක සහනය ඉතාම වැදගත් ශක්තියක් ජනිත කරනවා. අද හිර වී, ණය වී, කොටු වී සිටින අයගේ ෆයිල් ගණන් බැංකුවල තිබෙන බව මම දන්නවා. මම අද උදෙත් කථා කරන කොට කිව්වා, "සර්, මෙතැන තිබෙන ෆයිල් ගණන මට කියන්න බැහැ. ෆයිල් පිරිලා. මේවාට පරාටේ නීතිය ක්‍රියාත්මක කරන්න." කියලා. නමුත් අපි මෙහෙම අල්ලා ගෙන ඉන්නේ ඇයි? මේ පුංචි මිනිසුන්ට වදින එක නවත්වන්නයි. එය අපි ඉතාම ගෞරවයෙන් සිහිපත් කරන්නට ඕනෑ. මේ ලිහිල්භාවය ඇති කළාට පසුව බැංකු ණය ක්‍රමය යටතේ ජනතාවට තවත් සෙත සලසන, ආර්ථිකයට ශක්තිය දෙන, අලුත් අයට ඇතුළු වෙන්න පුළුවන් විශ්වාසය බැංකු එක්ක ගනුදෙනු කිරීමෙන් ජනිත වෙනවා කියන ටික සඳහන් කරමින් මා නවතිනවා.

[අ. භා. 3.06]

**ගරු චන්දිම වීරක්කොඩි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)**

(மாண்புமிகு சந்திம வீரக்கொடி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)

(The Hon. Chandima Weerakkody - Deputy Speaker and Chairman of Committees)

ගරු කථානායකතුමනි, 1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතට ජනතාවාදී සංශෝධනයක් ගෙන එන මේ මොහොතේ මේ ගරු සභාව අමතා කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වනවා. විශේෂයෙන්ම බැංකු නඩුවලට පෙනී සිටි නීතිඥවරයෙක් වශයෙන් සහ බැංකුවක හිටපු සභාපතිවරයෙක් හැටියට මේ පිළිබඳව යම් දැනුමක්, අවබෝධයක් මා සතුව තිබෙනවා කියා මා විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, මේ සංශෝධනයේ අරමුණ කුමක්ද කියන එකවත් එක්සත් ජාතික පක්ෂයේ නායකතුමා තේරුම් ගන්නේ නැතිව කථා කිරීම පිළිබඳව මම කනගාටු වනවා. එදා 1990 මේ රටේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රේමදාස ජනාධිපතිතුමා, -එක්සත් ජාතික පක්ෂයේ ඉතිහාසයේ හිටපු, ගමක ඉපදුණු එකම නායකයා- එතුමාගේ කාලයේ තමයි කිසිම සීමාවකින් තොරව මේ භයානක නීතිය මේ රටට හඳුන්වා දුන්නේ. නීතිඥවරයෙක් හැටියට කථා කරන විට නීතිය අනුව අපි කියනවා, "නීතිය නොදැනීම සමාවට කාරණයක් නොවෙයි" කියලා ගරු කථානායකතුමනි. නමුත් අපේ ගම්වලට ගියාම අදටත් ප්‍රායෝගික තත්ත්වය තමයි, ණයක් ගන්න ගියාම ගමේ මිනිසුන් දන්නේ නැහැ මොකටද මේ අත්සන් කරන්නේ කියලා. ඒ මිනිසුන් ණයක ඕනෑකමට, තමන්ට ගොඩ නැඟෙන්නට ඕනෑ නිසා, තමන්ට ඉදිරියට යන්න වෙන විධියක් නැති නිසා ඕනෑම කොළයකට අත්සන් කරලා, දෙන තැනකින් ණයක් අර ගෙන ගොඩ එන්න හදනවා. එහෙම උත්සාහ ගත්ත මිනිසුන් විවිධ හේතූන් මත තාවකාලිකව යම් පසු බෑමකට පත් වුණ අවස්ථාවක පවා ඒ අයගේ බලාපොරොත්තු සියල්ලම විනාශ කරමින් ඉතිහාසයේ මේ පනත ක්‍රියාත්මක වුණ අවස්ථා පිළිබඳව අපි දන්නවා.

එක්සත් ජාතික පක්ෂයේ නායකතුමා කියනවා මේක රුපියල් මිලියන 50 කරන්නලු. ගරු කථානායකතුමනි, ලක්ෂ 50ක ණයක් ගත්තොත් අවම මාසික වාරිකයක් රුපියල් 50,000ක් හැටියට ගෙවලා, ණය විතරක් ගෙව්වත් අවුරුදු 13ක් ගෙවන්න ඕනෑ. පොලිය නැතිව ණය විතරක් ගෙව්වත් අවුරුදු 13ක් ගෙවන්න ඕනෑ. ගරු කථානායකතුමනි, එක පුද්ගලයෙක් හැටියට මාසිකව රුපියල් 50,000ක වාරිකයක් තමන්ගේ ආදායමෙන් ගෙවන්න

[ගරු චන්දිම වීරක්කොඩි මහතා]

පුළුවන් මේ රටේ කීයෙන් කී දෙනාටද? එහි අරමුණ මේ රටේ බහුතරය වුණ, ගොඩ නැඟෙන්නට අත් වැල ඉල්ලන ජනතාව ගොඩ නැඟීම සඳහා වූ වැඩ පිළිවෙළක් ආරම්භ කිරීමයි. අපේ අතිගරු ජනාධිපතිතුමා, ගමේ ජීවත් වුණ, ගැමියන්ගේ ප්‍රශ්න හඳුනන, ගමකින් ආව රාජ්‍ය නායකයෙක් හැටියට මුදල් ඇමතිවරයා හැටියට පත් වෙලා මේ සංශෝධනය පිළිබඳව සාකච්ඡා කරන්න ආරම්භ කළ මොහොතේ මේ සංශෝධනය ගෙන ආ යුත්තේ ඇයි කියන එක පිළිබඳව තමන්ට තිබෙන, එතුමාණන්ට තිබෙන පෞද්ගලික අත් දැකීම පිළිබඳව කථා කළා මට මතකයි. ගරු කථානායකතුමනි, එතුමා කිව්වා, එතුමාගේ ආදරණීය පියාණන් වන, ඒ වාගේම ඔබතුමාගේත් ආදරණීය පියාණන් වන මේ රටේ එදා හිටපු ශ්‍රේෂ්ඨ දේශපාලන නායකයකු වූ ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා, එතුමාට පරම්පරාවෙන් ලැබුණු ඒ සුවිශාල දේපොළ ඡන්දය කරන්නට මාතර ප්‍රදේශයේ නීතිඥයෙකුට උකස් තැබුවා කියලා. එතුමාගේ පියා ඡන්දය දිනලා ගෙදර එන කොට එදා කුඩා දරුවන් හැටියට සිටි එතුමන්ලාට තමන්ගේ ගෙදරින් එළියට යන්නට සිදු වුණු සංවේදී අවස්ථාව ගැන එතුමා කිව්වා. එතුමා එදා පැහැදිලිව කිව්වා, කුඩා දරුවෙකු හැටියට මට, කුඩා දරුවන් හැටියට මගේ සහෝදරයන්ට අත් විඳින්නට සිදු වුණු ඒ ඉරණම, අත් විඳින්නට සිදු වුණු ඒ කනගාටුදායක තත්ත්වය මේ රටේ මම ජනාධිපතිවරයා හැටියට සිටින කාලයේ මේ රටේ ගම්වල ජීවත් වන දුප්පත් මිනිසුන්ගේ දරුවන්ට අත් විඳින්නට හැකි නොවන ආකාරයට බැංකු නීති සංශෝධනය කළ යුතුයි කියලා. ජනතාවාදී අරමුණ තේරුම් ගත යුතුයි. මේක මේ බින්දුව එකතු කිරීමකින් ඉතාම සැප පහසු විධියට කොල්ලුපිටිය, කොළඹ හතේ ජීවත් වුණු, හැදුණු, අපේ රනිල් වික්‍රමසිංහ මහත්මයාට මේ තත්ත්වය -

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
කොල්ලුපිටිය, කොළඹ 07 නොවෙයි.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
නැහැ, මම දන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මම ගමේ නේ. මට ඒවා තේරෙන්නේ නැහැ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඒ වුණාට ඉන්නේ කොළඹ.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
කොල්ලුපිටිය, කොළඹ 07 හැදුණු වැඩුණු එතුමාට ඒක නොතේරීම ගැන අපි කනගාටු වනවා. අද අපේ අරමුණ මේ රටේ පොදු ජනතාවට සහනයක් සලසා, පොදු ජනතාව අතුරෙන් ව්‍යාපාරිකයන් ගොඩ නංවලා, පොදු ජනතාවට භය නැතිව ණය දෙන්න පුළුවන් ආකාරයට, භය නැතිව ණය ලබා ගන්න පුළුවන් ආකාරයට අවශ්‍ය කරන වපසරිය, අවශ්‍ය කරන පරිසරය සකස් කිරීමයි.

ගරු කථානායකතුමනි, ත්‍රස්තවාදය නිමා වීමත් සමඟ අපිට රටක් හැටියට එම තත්ත්වය ක්‍රමක්‍රමයෙන්උදා වෙමින් පවතිනවා කියන එක මහ බැංකුවේ වාර්තා දිහා බලන කොට අපිට ප්‍රකාශ කරන්නට පුළුවන්. ගරු කථානායකතුමනි, බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දෙන ණය ප්‍රමාණය 2009ට සාපේක්ෂව 2010 දී රුපියල් බිලියන 265කින් -සියයට 23කින්- වැඩි වෙලා තිබෙනවා. මේක ඉතාම සතුටුදායක තත්ත්වයක්. අද අපිට සතුටු වන්නට පුළුවන්, ජනතාව ණය ගන්නට පෙලඹෙනවා; ජනතාව ආයෝජනයන් කරන්නට පෙලඹෙනවා. එදා සියයට 27ට තිබුණු ණය පොලී ප්‍රතිශතය අද සියයට 11කට, සියයට 10කට අඩු වන මට්ටමක තිබෙනවා. එක අංකයකට - single digit - අඩු කරලා ණය ලබා දෙන යුගය දැන් උදා වෙමින් පවතිනවා. මේ ආයෝජනය වැඩි වීම තුළ, නිෂ්පාදනය වැඩි වීම තුළ අපේ ආර්ථිකය ඉදිරියට ගෙන ගිහින්, මේ රට ගොඩ නැඟෙන වැඩ පිළිවෙළ අද ක්‍රියාත්මක වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මා නියෝජනය කරන ආසනයට අදාළ ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් කථා කළොත්, හය ලක්ෂයකට වැඩි සංචාරකයන් ප්‍රමාණයක් පසු ගිය වර්ෂයේ මේ රටට ඇවිල්ලා තිබෙනවා. පසුගිය වර්ෂය හා සංසන්දනය කර බැලුවාම සංචාරකයන්ගේ පැමිණීම සියයට 45.7කින් වර්ධනය වෙලා තිබෙනවා. ඒ වාගේම පැමිණෙන සංචාරකයන්ගේ වියදම් කිරීමේ ශක්තිය, එහෙම නැත්නම් සංචාරකයන් නිසා උත්පාදනය වන ලාභය ඊට වඩා වැඩි වෙලා තිබෙනවා. සංචාරකයන්ගේ පැමිණීම පසු ගිය වර්ෂයේ සියයට 45කින් වර්ධනය වන කොට සියයට 61.4කින් ආදායම වැඩි වීම වර්ධනය වෙලා තිබෙනවා. එහෙනම් අද ලංකාවට එන්න, ලංකාව දිහා බලන්න පෙලඹිලා තිබෙනවා, වියදම් කළ හැකි, අප රටට වැඩදායක, අප රටට ආදායම උත්පාදනය කරන සංචාරකයන්. පසු ගිය දෙසැම්බර් 31 වැනි දා රෑ උණවටුන ප්‍රදේශයේ පිටකොටුවේ වාගේ සෙනඟ හිටියා ගරු කථානායකතුමනි. එච්චරට විදේශික සංචාරකයන් හිටියා. අපේ ප්‍රදේශවල හෝටලයක කාමරයක් මේ මොහොතේ කිසි කෙනකුට ලබා ගන්න බැහැ. දහහතරදහස් හත්සියයක කාමර ප්‍රමාණය තවත් වැඩි කරලා සංචාරක කර්මාන්තය තවදුරටත් ගොඩ නැඟෙමින් පවතිනවා. ඒ අනුව තවදුරටත් මේ රටේ ආර්ථිකය ගොඩ නැඟිලා මෑත ඉතිහාසයේ ප්‍රථම වතාවට උද්ධමනය සියයට 5.7ක් ලෙස අඩු වෙච්ච වර්ෂය හැටියට මේ වර්ෂය ඉතිහාස ගත වෙමින් ආයෝජකයන්ගේ විශ්වාසය ගොඩ නැඟී තිබෙන යුගයකයි අද අපි මේ කටයුතු කර ගෙන යන්නේ. විශේෂයෙන්ම එදා පෞද්ගලීකරණය කළ යුතුයි කියපු රාජ්‍ය බැංකු දියුණු කිරීම තුළ මේ මොහොත වන විට හැම රාජ්‍ය බැංකුවක්ම විශාල ලාභ ලබන බැංකු බවට පත් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි ගරු කථානායකතුමනි. පසු ගිය වර්ෂය තුළදී හැම බැංකුවකම ශාඛා විවෘත වීම විශාල වශයෙන් වර්ධනය වෙලා තිබෙනවා. මේ මොහොත වන විට බැංකු ශාඛා ප්‍රමාණය දැවැන්ත විධියට වර්ධනය වෙලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් අවසන් කළා නම් හොඳයි.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම උතුරු නැඟෙනහිර ප්‍රදේශවල ව්‍යාප්ත නොවුණු බැංකු අද ශීඝ්‍රයෙන් ඒ ශාඛා ඒ ප්‍රදේශවල විවෘත කරමින් යනවා. ඒ නිසා මුදල් ඇමතිවරයා හැටියට අතිගරු ජනාධිපතිතුමාට මම විශේෂ ස්තුතියක් කරනවා, මේ රටේ දක්ෂතාව තිබෙන, දියුණු වීමට අවශ්‍යතාව තිබෙන ගම් මට්ටමේ දුප්පත් ජනතාවට ණයක් ලබා ගෙන විශාල ව්‍යවසායකයන්, ව්‍යාපාරිකයන්, කර්මාන්තකරුවන් හැටියට ගොඩ නැඟෙන්නට අවස්ථාව සැලසෙන ආකාරයට මේ ජනතාවාදී සංශෝධනය ගෙනැල්ලා කටයුතු කිරීම පිළිබඳව; ඒ වාගේම එදා එක්සත් ජාතික පක්ෂයෙන් ගෙනාපු ජනතාව විනාශ කරන පනතට මානුෂික මුහුණුවරක් ලබා දීම සඳහා කටයුතු කිරීම පිළිබඳව. බොහොම ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

The next speaker is the Hon. M.A. Sumanthiran. You have 20 minutes.

Before he starts, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Hon. Member, you can commence your speech.

[අ. භා. 3.19]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Thank you, Sir. Before I commence my speech, may I request the Minister to make a clarification? I have been handed a copy of the Amendments to be moved at the Committee Stage of the Bill just a moment ago and I find that you are going to move an Amendment on the Interpretation Clause, Section 22, as well. It states, I quote:

> "22. 'bank' means a licensed commercial bank or a licensed specialised bank within the meaning of the Banking Act, No. 30 of 1988."

දැන් අපේ බැංකුවලට ඒ නිසා මිලියන පහට අඩු ණය නොදී ඉඳීමට පුළුවන්ද කියලා අපේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ඇහුවා. මිලියන පහට අඩු ණය එහෙම නම් නොදී ඉඳීමට පුළුවන්ද? ඒක කරන්න බැහැ. රාජ්‍ය බැංකුවල ප්‍රතිපත්ති හසුරුවන්නේ රජයයි. නියමිත ලෙස සුරැකුම් ඉදිරිපත් කරන අයට මිලියන පහට අඩුවූ ණය දීමට තිබෙන රාජ්‍ය බැංකුවල බැඳීම ක්‍රියාත්මක කරන්න රජය බැඳී ඉන්නවා. එහෙම වන කොට පෞද්ගලික බැංකුවලට ඒ තරගයට මුහුණ නොදී ඉන්න බැහැ. පෞද්ගලික බැංකුවලටවත් මේ පරාටේ නීතිය නැති කරපු නිසා - ඒ ගොල්ලන් කොහොමත් ඔය මිලියන පහේ ගනුදෙනුවල නැහැ. ඒ ගොල්ලන් ඉන්නේ මිලියන පණහේ, සීයේ, දහසේ ගනුදෙනුවලයි. අපේ දුප්පත් රාජ්‍ය බැංකු තමයි මේ අඩු මට්ටමේ ණය ගනුදෙනුවල ඉන්නේ. අර කිව්වා වාගේ සියයට 35ක් මිලියන පහට අඩු ණයයි. ඒ කියන්නේ මේ රටේ අඩු ආදායම් ලබන, නැත්නම් පහළ මැද මට්ටමේ -පහළ තලයේ- මිනිසුන්ගේ ණය ගනුදෙනු.

දැන් බලන්න, අපේ නන්දසිරි ගමගේ මහතා විසින් ආරම්භ කරපු "කාන්තා බැංකුව" කියලා එකක් තිබෙනවා වනාතමුල්ලේ. ඒකේ අද වන කොට සාමාජිකයන් 60,000ක් ලංකාව පුරාම ඉන්නවා. ඒ අය කුඩා කණ්ඩායම් හදලා ඒ ගොල්ලෝ බැංකු බවට පත් කරලා තිබෙනවා. මේ ක්ෂුද්‍ර ණය ක්‍රමය පටන් ගත්තේ ඔහු. මේක පටන් ගත්තේ දැනට අවුරුදු විස්සකට පෙරයි. ඒ ක්‍රමය තුළ ඔහු කියා සිටිනවා සියයට 98ක් ආපසු ණය ගෙවනවා කියලා. ඒ බැංකු ඔක්කොම පාලනය කරන්නේත් කාන්තාවෝ. කුඩා බැංකු ශාඛාවන් හැම තැනම තිබෙනවා. හැම කාන්තාවන් දහ දෙනෙකුගේම බැංකුවක් තිබෙනවා. අන්න ඒ බැංකුව ණය දෙනවා. අය කර ගන්නවා. දවසේ ණය දෙනවා. සුමානයේ ණය දෙනවා. අය කර ගන්නවා. ඉතා අඩු පොලියක් තමයි අය කරන්නේ. දැන් මේ ණයක් දීර්ඝ කාලීන වන කොට තමයි ඒකට ඉහළ රේට්ටු දමා ගන්න වෙන්නේ. කෙටි කාලීන වන කොට පහළ රේට්ටු දැම්මත් ඒකේ අලාභයක් නැහැ. මොකද ඒකේ turnover එක වැඩියි; පිරිවැය වැඩියි. ඕනෑම එකක පිරිවැය වැඩි වන කොට ලාභ රේට්ටුව අඩු කරන්න පුළුවන්. ඉතින් මේවා මේ මූලික බැංකු ක්‍රමයේ සහ මූල්‍ය ක්‍රමයේ "අ" යන්න "ආ" යන්න වාගේ අප දන්නා දේවල්. මෙන්න මේ ඉන්නවා මූල්‍ය සමාගම්; මිනී මෝරු සමාගම්. මෙන්න මේ මිනී මෝරු සමාගම් පාලනය කරන වැඩ පිළිවෙළක් අවශ්‍යයි. අන්න ඒ පැත්තට යන්න. සාමාන්‍ය මිනිසුන්, මැද මට්ටමේ ව්‍යාපාරිකයෝ විනාශ කරන මේ මිනී මෝරුන්ගේ මූල්‍ය සමාගම් -මෙන්න මේවා- පාලනය කළ යුතුයි. ඒක මම පිළිගන්නවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමනි, මා දන්නේ නැහැ, මා කියන එක ඔබතුමාට තේරුණේ නැද්ද කියලා. මා කියන්නේ, දැන් ඔබතුමන්ලා මේ ක්‍රමය සද්භාවයෙන් ක්‍රියාත්මක කරන්න මෙම ගරු සභාවේදී යෝජනා කළත්, බැංකුව ක්‍රියාත්මක වන්නේ බැංකුවේ ආරක්ෂාව පැත්තෙනුයි. එතකොට වන හුටපටය තමයි තේරෙන සිංහලෙන් කිව්වොත් බැංකු action එක ගත්තේ ණය දෙන්න නොවෙයි, ණය නොදෙන්නයි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු මන්ත්‍රීතුමා, රාජ්‍ය බැංකුවල ප්‍රතිපත්ති තීන්දු කරන්නේ රජයයි. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඔය ඔහු යවලා තිබෙන කතාව -ඒ චක්‍රලේඛය මඟින් කියා තිබෙන කථාව- වැරැදි නැහැ. ඒකෙන් කියා තිබෙන්නේ, "ප්‍රවේශම් වන්න. ගෙවීමේ හැකියාව අනුව ණය දෙන්න" කියලායි. ඉතින් ගෙවීමේ හැකියාවක් නැත්නම් ණය අරගෙන ඒක ගෙවන්නේ කොහොමද? ගෙවන්නේ නැතුව ඉන්න ගන්න ණයද ඉල්ලන්නේ? [බාධා කිරීමක්] ඒ ජේවීපී බැංකු ක්‍රමය.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඔබතුමා කියනවා නේ පොඩි මිනිස්සු ණය ගෙවනවාය කියලා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඔව්, මම කියනවා. ඒ මිනිස්සු ණය ගෙවනවා. සියයට 98ක් ගෙවනවා. ඒ මිනිස්සු ඉතා කුඩා මුදල් ගන්න අයයි. එම නිසා තමයි, "පරාටේ" නීතිය ඕනෑ නැහැයි කියන්නේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Hon. Minister, please wind up now.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

හොඳයි. මගේ කථාව අවසන් කිරීමට මා කැමැතියි. මේ රජය ජනතාවාදී රජයක් හැටියට මේ ගත්ත පියවර, මේ රටේ මූල්‍ය ක්ෂේත්‍රයේ -බැංකු ක්ෂේත්‍රයේ- තිබුණු මං කොල්ලය නවත්වන්නට ගත්තු පියවරක් හැටියට මා දකිනවා. "පරාටේ" නීතිය ඇති කිරීමෙන් බැංකු මඟින් ගෙන ගිය මං කොල්ලය නවතිනවා. අපේ රටේ රාජ්‍ය බැංකු දෙකටම පරාටේ බලය තිබුණා. මේ ක්‍රමයේ තිබෙන්නා වූ ඉතාමත්ම කුරිරු ස්වභාවය නිසා රාජ්‍ය බැංකුවලට තිබුණු පරාටේ බලය ක්‍රියාත්මක කළේ නැහැ. පෞද්ගලික බැංකු "පරාටේ" නීතිය ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. පෞද්ගලික අංශයෙන්ම තමයි ඔය "පරාටේ" නීතිය ආවේ. අන්තිමට ඒ තත්ත්වය තුළ අපේ රාජ්‍ය බැංකුවලටත් තරගකාරිව මුහුණ දෙන්න සිද්ධ වුණා. විශේෂයෙන්ම අපේ රාජ්‍ය බැංකු දෙක විනාශ කරන්න එදා යූඑන්පී එක කුමන්ත්‍රණයක් ගෙන ගියා. දැන් අද ඒ චක්‍රය අපි ආපසු හරවා ගෙන එනවා. මේක තමයි පළමුවන පියවර. ස්තුතියි.

[අ. භා. 5.21]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදයේදී ආණ්ඩුවේ ඇමතිවරු සහ මන්ත්‍රීවරු බොහෝ විට අදහස් දැක්වූවේ මේ "පරාටේ" ක්‍රමය එක්සත් ජාතික පක්ෂය විසින් හඳුන්වා දුන් ආකාරයටයි. හැබැයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ක්‍රමයේ විකාශනය සහ අතීතය සලකා බැලුවාම, parate execution කියන වචනයේ තේරුම වශයෙන් දක්වන්නේ, වහාම, එහෙම නැත්නම් ක්ෂණිකව කියන අර්ථයයි. මා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මා වැරදි නම් නිවැරදි කරන ලෙසට. පළමුවෙන්ම 1939 දී මේ ක්‍රමය රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට හඳුන්වා දුන් අතර පසුව රජයේ බැංකු වන ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ මහජන බැංකුව, ජාතික සංවර්ධන බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවලටද මේ ක්‍රමය හඳුන්වා දුන්නු බවටයි මට ලැබී තිබෙන තොරතුරුවල සඳහන් වන්නේ. ඒ පනතට 1990 දී කළ සංශෝධන මඟින් රටේ තිබුණු අනිකුත් වාණිජ බැංකුවලටත් මේ අයිතිය ලබා දෙන්න ඒ රජය කටයුතු කරලා තිබෙනවා.

දේශපාලන පක්ෂ වශයෙන් අපි කොයි පක්ෂයේ සිටියත්, මේ නීතියේ අර්ථය මොකක්ද, මේ නීතිය ගෙනාවේ කුමකටද යන්න සම්බන්ධයෙන් පොඩ්ඩක් සෝදිසි කරලා බලන්න ඕනෑ. මා දන්නවා, එක පක්ෂයක ඉන්න කොට යම් දෙයක් එක විධියකට පෙනෙන බවත්, තවත් පක්ෂයක ඉන්න කොට එය තවත් විධියකට පෙනෙන බවත්. ඒ අනුවයි, බොහෝ විට දේශපාලනඥයෝ තමන්ගේ අදහස් හුවමාරු කර ගන්නේ. හැබැයි මේ ගරු සභාවේ අදහස් දැක්වූ සියලුම මන්ත්‍රීවරු -හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා, ආණ්ඩුවේ ඇමතිවරු, විපක්ෂයේ මන්ත්‍රීවරු- සඳහන් කළ ආකාරයට විශේෂයෙන්ම වාණිජමය ව්‍යාපාර සඳහා විශාල වශයෙන් ණය ගන්න ආයතනවලට වාගේම සමාගම්වලටත්, තමන්ගේ හොර ජාවාරම්වලට ණය ලබා ගැනීමේදී ඒ ණය ආපසු නොගෙවීම වළක්වන්න මේ "පරාටේ" නීතිය විශාල ආකාරයෙන් ඉවහල් වනවා.

ගරු සරත් අමුණුගම අමාත්‍යතුමා, එතුමාගේ කථාවේ මුල් අවස්ථාවේදීම පැවසුවා, "The Government must have its way and the Opposition must have its say" කියා. එතුමා අප අගය කරන, ඒ වගේම ගෞරව කරන ඇමතිවරයෙක්. ජනතාව නියෝජනය කළත්, බොහෝ වෙලාවට ජනතාව ගැන කථා කළත් කථාවට පමණක් සීමා වන නිසා "People can have their way and the Opposition can have their say" කියා කිව්වා නම් වඩා හොඳයි. ජනතාව නියෝජනය කරන, ජනතාව වෙනුවෙන් පත් වී තිබෙන ආණ්ඩුව තමන්ට බලය තිබුණත් තමන්ගේ සුඛ විහරණය සඳහා නොව, ජනතාව වෙනුවෙන් කටයුතු කරන ආණ්ඩුවක් බවට පත් වන්නට ඕනෑ. ගරු ඇමතිතුමා සඳහන් කළ ආකාරයට මේ පරාටේ ක්‍රමයේ යම් කිසි ආකාරයක සංශෝධනයක් සිදු වීම මා අගය කරනවා. මෙය ඇත්තටම බොහෝ දුරට ඉවහල් වන්නේ පෞද්ගලික ණය ගන්නා ජනතාවට වඩා කුඩා ව්‍යාපාරවලට සම්බන්ධ ජනතාවටයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙහිදී ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා අදහස් ප්‍රකාශ කරමින් කිව්වා, මිලියන 5ට වඩා ණය ගත් ණයකරුවෝ සියයට 35ක් ඉන්නවාය කියා. මට ලැබී තිබෙන වාර්තා අනුව -

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මිලියන 5ට අඩු.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

මිලියන 5ට අඩු. සමා වන්න. [බාධා කිරීමක්] මට ලැබී තිබෙන සංඛ්‍යා ලේඛන අනුව ඒ ප්‍රමාණය සියයට 21ක් බව තමයි වාර්තා වන්නේ. සාමාන්‍යයෙන් සියයට 20ක් කියන්නට පුළුවන්. [බාධා කිරීම්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

එක බැංකුවකද, ඔක්කොම බැංකුවලද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ඔක්කොම බැංකුවල. ලංකාවේ මිලියන 5ට වඩා වැඩි සියලුම ණය ගැන සලකා බැලුවොත් ණය ගත් ප්‍රමාණය සියයකට 80කට ආසන්න ප්‍රමාණයක් වනවා. එතකොට මෙතැන තිබෙන වැදගත්ම කරුණ වන්නේ මේ සංශෝධනය අදාළ වන්නේ සියයට 20කට පමණයි කියන එකයි.

ඊත් එක්කම ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා කිව්වා, 1990 වර්ෂයේදී එතුමා මේකට විරුද්ධත්වය ප්‍රකාශ කළාය කියා. එතුමාගේ පියා ගැනත්, එතුමාගේ සහෝදරයා -නියෝජ්‍ය අමාත්‍යතුමා- ගැනත් සඳහන් කර කිව්වා, ලක්ෂ එකහමාරක සීමාවක් දමන්නටය කියා එතුමන්ලා ඒ කාලයේ ඉල්ලුවාය කියා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාට වැටහෙනවා ඇති, 1990 වර්ෂයේ ලක්ෂ එකහමාරක් කියන්නේ අද අපේ සාමාන්‍ය මුදලේ අගයත් එක්ක සලකා බැලුවාම ලක්ෂ 12ක්, ලක්ෂ13ක් වාගේ ප්‍රමාණයක් බව. සමා වන්න. මිලියන ගණන්වලින් බැලුවොත්. අද මුදලේ අගය විශාල ලෙස ඉහළ ගිහින් තිබෙනවා. එතකොට සාමාන්‍යයෙන් distributor කෙනෙක් -වෙළඳ නියෝජිතයකු- ගත්තොත්, අඩුම ගණනේ ඒ වෙළඳ නියෝජිතයා සුළු පරිමාණයේ ව්‍යාපාරයක් කළත් මිලියන 7ක, මිලියන 8ක ව්‍යාපාරයක යෙදෙන ව්‍යාපාරිකයකු වනවා. මේ ලැබී තිබෙන දත්ත අනුව සියයට 20ක් කියන්නේ ඉතා අඩු ප්‍රමාණයක් බව ඔබතුමාට වැටහෙනවා ඇති. ඊත් එක්කම මේ මඟින් ඇති වන එකම වෙනස මොකක්ද? ගරු ඇමතිතුමනි, මේකත් හරියට හදිසි නීතිය වාගෙයි. අර කිව්ව විධියට යක්ෂ නීතියක් -draconian law- වශයෙන් හඳුන්වන මේ නීතියට මේ සංශෝධනයෙන් සිදු වන්නේ, ගරු වාසුදේව ඇමතිතුමා කිව්වා වාගේ තමන්ගේ නිදන ඇඳ, තමන්ගේ නිවස, තමන්ගේ ව්‍යාපාරයට යොදන සියලුම ආම්පන්න වුණත් බැංකුවට ගැනීමේ ක්ෂණික අයිතිය අහිමි වීමයි. යම් කිසි අවස්ථාවක උසාවියට ගියත් මේ දේවල් පවා අහිමි වන විධියට තීන්දුවක් ලැබෙන්නට පුළුවන්. කෙසේ වෙතත් එක්සත් ජාතික පක්ෂය මෙය මිලියන 50කට සීමා කරන්නය කිව්වා. 1990 දී අපි අනෙකුත් වාණිජ බැංකුවලට මේ අයිතිය ලබා දුන්නා. අද මේ නීතිය මඟින් විශේෂ බැංකුවලටත් මේ අවස්ථාව සැලසෙන බවයි මගේ අදහස වන්නේ. උදාහරණයක් ලෙස ගත්තොත් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව, ප්‍රමුඛ බැංකුව වාගේ නීතිය හරිහැටි ආරක්ෂා නොවන බැංකුවලට පවා යම් කිසි අවස්ථාවක ඒ වාසිය - මිලියන 5 ඉක්මවා යෑමේ අයිතිය- සැලසෙනවා. ගරු ඇමතිතුමනි, අප මෙය මිලියන 5කට අවම කළත් රාජ්‍ය ආයතනවලට මේ ණය ලබා දීමේදී මේ වාගේ පිළිවෙතක් මේ වාගේ නීතියක් නැති බව අප හිතේ තියා ගන්නට ඕනෑ. රාජ්‍ය ආයතනවලට ඕනෑම බැංකුවකින් ඕනෑම ණය ප්‍රමාණයක් ගන්නට පුළුවන්. කිසිම සහතිකයක් නැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sovereign debts.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
එහෙම sovereign debts ලෙස සැලකුවාට ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා බොහොමයක් රාජ්‍ය ආයතන බංකොලොත්භාවය පෙන්නුවාට පස්සේ ඒ ණය ආපසු ගෙවීමක් සිදු වන්නේ නැහැ කියා. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, sovereign debts හෝ මොන debt එක හෝ තිබුණත් අන්තිමට වැදගත් වන්නේ ඒ බැංකුව පවත්වා ගෙන යාමයි. බැංකුව පවත්වා ගෙන යන්න නම් ඒ ණය ආපසු ලබා ගැනීමේ හැකියාවක් තිබෙන්න ඕනෑ. ණය ගෙවන්නේ නැති අවස්ථා තිබෙනවා. විශේෂයෙන්ම මිහින් එයාර් ආයතනය ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් ලබා ගෙන තිබෙනවා. අද වන තෙක් ආණ්ඩුව ඒ සම්බන්ධයෙන් උත්තරයක් දීලා නැහැ.

විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය මේක පෞද්ගලික බැංකුවලට දීම සම්බන්ධයෙන් ඔබතුමන්ලා මේක වරද්දා ගත්තා නේ. එතකොට මේ අවස්ථාව අනිකුත් බැංකුවලට දෙන්න තිබෙන වුවමනාව මොකක්ද? ගරු ඇමතිතුමනි,එක්සත් ජාතික පක්ෂය යම් කිසි නීතියක් හැදුවා නම්, ඔබතුමන්ලා ඒකේ යම් කිසි අඩු පාඩු හෙව්වත්, ආපු ආණ්ඩු හැම වෙලාවේම ඒ නීති ඒ ආකාරයෙන්ම පවත්වා ගෙන ගිහින් තිබෙනවා. ඒක හරියට අපි වාහනයක් හැදුවාට පසුව ඒකේ යම් කිසි කොටස් වෙනස් කරනවා වාගෙයි. ඔබතුමන්ලාට පහසු ආකාරයට ඒකේ රෝදයක් මාරු කරන්න පුළුවන්. සුක්කානම වෙනස් කරන්න පුළුවන්. හැබැයි වාහනය එහෙමම තිබෙනවා. අපේ එක්සත් ජාතික පක්ෂයේ සියලුම ප්‍රතිපත්ති ඒ ආකාරයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඔච්චරටම ජනතාව අගයන, සමාජවාදය අගයන ඇමතිවරයෙක් නම් මේ නීතිය තනිකරම ඉවත් කරන්නය කියා ඔබතුමාට සටනක් කරන්න පුළුවන්. ඔබතුමන්ලා පියවර ගන්නවා විතරයි, ඔබතුමන්ලාගේ වයස යනවා විතරයි, කිසිම පියවරක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඔබතුමන්ලා කියන දේවල් සිදු වුණා නම් අද ආණ්ඩුවේ විශාල වෙනසක් දකින්න ඕනෑ. හැබැයි ඒ වෙනස ඇති වෙලා නැහැ. ඔබතුමන්ලා තවම ණය ගන්නේ සියයට හයේ, හතේ පොලියටයි. ඔබතුමන්ලා බටහිර රටවලින් නොවෙයි ණය ගන්නේ. කොයි රටෙන් ණය ගත්තත් සියයට හත, සියයට අට පොලිය ගෙවනවා නම් වාසුදේව නානායක්කාර ඇමතිතුමනි, සුද්දාගෙන් ගත්තත් එකයි, ඉන්දියාවේ කළු ජාතිකයාගෙන් ගත්තත් එකයි, චීනයේ චීනාගෙන් ගත්තත් එකයි. [බාධා කිරීමක්] සහනදායී ණයක් හම්බ වෙන්නේ නැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
සහනදායී ණය කියන්නේ මොකක්ද, දීර්ඝ කාලීන ණය කියන්නේ මොකක්ද කියා -

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමා ඊයේ මට ළපටියෙක් කියා කිව්වාට මම හොඳට දන්නවා, සහනදායී ණය කියන්නේ මොකක්ද, ක්ෂණික ණය කියන්නේ මොකක්ද කියලා. ඔබතුමාට ඒක වැටහෙන්නේ නැහැ. ඔබතුමාට වැටහෙනවා. හැබැයි ඔබතුමා ඒක හංගාගෙන ඉන්නවා. මොකද, ආණ්ඩුව අරගෙන තිබෙන්නේ සහනදායී ණය නොවෙයි. ඔබතුමා මට පෙන්වන්න, විදේශවලින් සහනදායී ණයක් ලැබී තිබෙන්නේ සංවර්ධන ව්‍යාපෘතිවල මොන යෝජනා ක්‍රමයටද කියා. ඩොලර් මිලියන -

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හම්බන්තොට වරාය හදන්න ගත්තු ණය සහනදායී ණයක් හැටියට classify කරනවාද, එහෙම නැත්නම් short-term ණයක් හැටියට classify කරනවාද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අන්න, ඔබතුමා නියම ප්‍රශ්නයක් ඇහුවා. ඔබතුමා දන්නේත් නැහැ කොහොමද ඒක ගත්තේ කියලා. ඔබතුමා මගෙන් අහනවා, මම විස්තර කරන්නේ කොහොමද කියලා. ඔන්න ඔතැන තමයි වාසුදේව නානායක්කාර ඇමතිතුමනි, ඔබතුමන්ලාට වැරදිලා තිබෙන්නේ. ඔබතුමන්ලා වාගේ සමාජවාදය අගයන, ඒ වෙනුවෙන් අවුරුදු ගණනක් තිස්සේ උගුර ලේ රහ වෙනකම් කතා කරපු ඔබතුමන්ලා අද මේ රජය මේ ආකාරයට එක්සත් ජාතික පක්ෂයටත් වඩා ධනවාදී ප්‍රතිපත්ති අනුගමනය කරන කොට ඒකට බොරුවට නම් දෙන්න හදනවා. ඔබතුමන්ලා කියන්න හදනවා, මේක සමාජවාදී ප්‍රජාතන්ත්‍රවාදී අලුත් ආණ්ඩුවක්ය කියා. හැබැයි ඇමතිතුමනි - [බාධා කිරීමක්] මම කියන දේ අහගන්නකෝ. ඔබතුමා ඊට පසුව උත්තර දෙන්නකෝ. වෙනස මොකක්ද කියා කියන්නකෝ. එක්සත් ජාතික පක්ෂයේයි, මේකෙයි වෙනස කියන්නකෝ. සමාජවාදී බව අපට පෙන්වන්නකෝ. අපිත් ආසයි දැන ගන්න. අපිත් ආසයි ඔබතුමන්ලාගෙන් මේ වෙනස දැන ගන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මේ වාගේ නීතියක් ගෙනෙන එක. තමුන්නාන්සේලා -

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මොන නීතියක්ද? ඇමතිතුමනි, දැන් ඔබතුමන්ලා මිලියන 5ක සීමාවක් ගෙනෙනවා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. මම කිව්වේ මේක ගෙනාවේ - [බාධා කිරීමක්] Let me speak first. Then, you speak. I did not disturb you. ඇමතිතුමනි, ඔබතුමන්ලා කියන්නේ- [බාධා කිරීමක්] මේක 1939 දී නේ ගෙනාවේ. [*Interruption.*] That was yesterday, not today. If you want, you can disturb. Hon. Vasudeva Nanayakkara, you are most welcome to disturb me. That shows your seniority, that shows your ignorance. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි වාසුදේව නානායක්කාරලා වාගේ බොරු කරන දේශපාලනඥයන් නොවෙයි. තමන්ගේ පවුලේ සාමාජිකයන් තනිකර බටහිර ක්‍රමයටයි ඉන්නේ. තමන්ගේ පුතාලා, තමන්ගේ භාර්යාව තනිකර බටහිර ක්‍රමයටයි ඉන්නේ. දේශපාලනය කරලා අද මේ සභාවට ඇවිල්ලා මෙතුමන්ලා තමන්ගේ සමාජවාදය ප්‍රකාශ කරන්න හදනවා. අපි ඔය සමාජවාදය දැකලා තිබෙනවා. පුත්තු ගියේ තනිකර බටහිර ඉස්කෝලවලට. සේවය කරන්නේ බටහිර රටවල ආයතනවලයි. හැබැයි රටට සමාජවාදයක් හදන්න හදන මේ වාසුදේව නානායක්කාරලාට අපි කියන්නේ රටට බොරු කරන්න එපාය කියායි. ඔබතුමන්ලා කරපු සමාජවාදය ඔබතුමන්ලාගේ ඇඟේ නැහැ. ඔබතුමන්ලා කරන ඔය සමාජවාදය තමන්ගේ බඩට විතරයි. අපි කියන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වාගේ දේශපාලන බොරුකාරයන්ට කිසිම අවස්ථාවක් දෙන්න එපාය කියායි. [බාධා කිරීමක්] 1939 දී රාජ්‍ය ආයතනවලට, රාජ්‍ය බැංකුවලට තමයි මේක ගෙනාවේ. අපි නොවෙයි ගෙනාවේ. එක්සත් ජාතික පක්ෂය තමයි පළමු වරට වාණිජ බැංකුවලට මේක හඳුන්වා දුන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එහෙම නම් වාසුදේව නානායක්කාරලා වාගේ නොවෙයි, අපි කියන දේ ප්‍රතිපත්ති අනුව හරියට ප්‍රකාශ කරලා තිබෙනවා. අපේ ප්‍රතිපත්ති හරියාකාර ප්‍රකාශ කරලා තිබෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please!

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඒ සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂයට ඒ ආඩම්බරය වාගේම ඒ ගෞරවය තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Vasudeva Nanayakkara, please sit down.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
පරාටේ ක්‍රමය කෙසේ වෙතත්, වාසුදේව නානායක්කාර ඇමතිතුමා කොච්චර යටි ගිරියෙන් කෑ ගැහැව්වත් එතුමා දන්නවා එතුමාගේ සමාජවාදය මොකක්ද කියලා. අපි කියන්නේ මේකයි. මෙතුමා දැන් මේ ඇමතිකමක් අරගෙන, ඒ වාගේම ධනවාදය, බටහිර ප්‍රජාතන්ත්‍රවාදය අකුරටම ඉටු කරන ආණ්ඩුවක් සමඟ එකතු වෙලා, අද තමන්ගේ නිර්වස්ත්‍රභාවය අපට ප්‍රදර්ශනය කරන්න හදනවා. ඒකයි අපට දුක. එතුමන්ලා මේ අනෙකුත් ඇමතිවරු වාගේ සමාජවාදය ගැන ලස්සනට කථා කරලා එක්සත් ජාතික පක්ෂයටයි මේ ආණ්ඩුවටයි සියලුම ආණ්ඩුවලටයි, මේ ප්‍රජාතන්ත්‍රවාදයටයි විරුද්ධව කථා කරලා සමාජවාදය, ඒ වාගේම දුප්පත් මනුස්සයාගේ දුක වෙනුවෙන් කථා කළා නම් අපි අදත් ගෞරව කරනවා. හැබැයි මොකක්ද වෙන්නේ? තමන් කඩේ යනවා තමන්ගේ වාසියට. මේ ආණ්ඩුව ණය ගන්න කොට ඩොලර්වලින් පොලිය සියයට 7යි සියයට 8යි. එතකොට රුපියල්වලින් බැලුවොත් ගෙවන්න ඕනෑ පොලිය සියයට 14යි සියයට 15යි. කවුද මේවා ගෙවන්නේ? එදා එක්සත් ජාතික පක්ෂය අවුරුදු තිහක කාලයකට ණයක් ගන්න කොට පොලිය සියයට 2.2යි, 1.8යි. එදා වාසුදේව නානායක්කාරලා කිව්වේ මොකක්ද? එදා කිව්වේ ධනවාදී පක්ෂයක්ය කියලා; ඒ වාගේම රට පාවා දෙන පක්ෂයක්ය කියලා. හැබැයි අතිගරු ජනාධිපතිතුමා කියලා ඒක මේ ආණ්ඩුව කරන කොට මෙතුමා ඇමතිකමක් අරගෙන, අද ඒ සමාජවාදය නැහැ. දුප්පත් මනුස්සයා වෙනුවෙන් ඉදිරිපත් වීමක් නැහැ. මේ පරාටේ ක්‍රමය හොඳ නැත්නම් - මේක හඳුන්වලා දුන්නේ එක්සත් ජාතික පක්ෂය නොවෙයි. මේක හඳුන්වලා දුන්නේ 1939 රාජ්‍ය බැංකුවලට - එහෙම නම් මෙතුමාට ශක්තියක් තියෙන්න ඕනෑ, සියලුම වාණිජ බැංකුවලට ඒ දීලා තිබෙන අයිතිය අයින් කරන්නය කියලා ජනාධිපතිතුමාට බල කරන්න. හැබැයි එක දවසක්වත් දුප්පත් ජනතාව වෙනුවෙන් මෙතුමා අදහස් ප්‍රකාශ කරලා තිබෙනවාද? නැහැ. එහෙම නම් මෙතුමන්ලා කරන්නේ තමන්ගේ බඩ වියත රැක ගන්නා දේශපාලනයයි. හැබැයි තරුණ දේශපාලනඥයෝ වශයෙන් අපි කියන දේ හරියට කියනවා; කෙළින් කථා කරනවා. එක්සත් ජාතික පක්ෂයේ තරුණ මන්ත්‍රීවරු වශයෙන් අපි එක්සත් ජාතික පක්ෂයේ ඒ ප්‍රතිපත්ති වෙනුවෙන් අද පෙනී සිටිනවා. අපි විවෘත ආර්ථිකය ගෙනාවා නම් ගෙනාවාය කියනවා. ඒ වාගේම පෞද්ගලීකරණය කළා නම් අපි කළාය කියනවා. අපි මේ ආණ්ඩුවට මුක්කු ගහන්නේ නැහැ. ඒ වාගේම අපි විශේෂයෙන්ම කථා කළා, [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Member, you have two more minutes.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සරත් අමුණුගම ඇමතිතුමා ගෙනෙන ලද මේ සංශෝධනය අපි අගය කරනවා. මම අර කිව්වා වාගේ අපි වාහනයක් හැදුවා නම් ඒකට alloy wheels දාන්න පුළුවන්; ඒකට lights දාන්න පුළුවන්. පස්සේ ඒ සම්බන්ධයෙන් පොඩි පොඩි වෙනස්කම් කර ගන්න පුළුවන්. අපේ ආණ්ඩුවක් ආවාට පස්සේ කාලයත් සමඟ අපටත් යම් කිසි අවස්ථාවක මේකට සංශෝධනයක් ගේන්න පුළුවන්. හැබැයි මේ නීතිය ගෙනැල්ලා ඔබතුමන්ලා මේ නීතිය වැරදියි කියනවා නම්, විවෘත ආර්ථිකය වැරදියි කියනවා නම් නවත්වන්න; පෞද්ගලීකරණය වැරදියි කියනවා නම් නවත්වන්න; මේ පරාටේ ක්‍රමය වැරදියි නම් නවත්වන්න. [බාධා කිරීමක්] පැරයෙටි නොවෙයි පරාටේ. පරාටේ ක්‍රමය වැරදියි නම් නවත්වන්න. [බාධා කිරීමක්] පැරයෙටි? ඔබතුමා පරාටේ එක දන්නේත් නැහැ. මොනවා කථා කරනවාද මම දන්නේ නැහැ. ඒක පරාටේ නොවෙයි රොටී. රොටී. ඒ රොටී ඇමතිතුමනි. කෙළින් කියන්න ඕනෑ. කෙළින් කියන්න පණ තියෙන්න ඕනෑ. අපි දන්නවා, වාසුදේව නානායක්කාර ඇමතිතුමා ඉතා සද්දෙන් කථා කරන ඇමතිවරයෙක් බව. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට ගිහිල්ලා කියන්න, මේ පරාටේ ක්‍රමය වාණිජ බැංකුවලින් අයින් කරලා දාන්න; දුප්පත් ජනතාවට ඒ අයිතිය ලබලා දෙන්නය කියලා. හැබැයි ඒ ශක්තිය අපේ ඇමතිවරුන්ට නැහැ. අද ආණ්ඩුවට කඩේ යනවා. සමාජවාදය අද මතකත් නැහැ. මට මතකයි මම පොඩි කාලේ මෙතුමන්ලා කථා කරපු සමාජවාදය. ඔය cotton shirt එක ඇඳ ගෙන එතුමා කරපු සමාජවාදය මම පොඩි කාලේ අගය කළා. හැබැයි අද මෙතුමන්ලා කථා කරන හැටි බැලුවාම ලජ්ජයි. මහත්මයෙක් වශයෙන් මෙතුමාව අදත් අගය කරනවා. හැබැයි එතුමාගේ දේශපාලනය සම්බන්ධයෙන් බලන විට ඉතාමත් බාල දේශපාලනයකට අද වැටිලා තිබෙනවා. [බාධා කිරීමක්] සමාජවාදය කරේ තියා ගෙන මෙතුමන්ලා අද මේ කරන ව්‍යාපාරය මුළු රටටම ලජ්ජාවක්. සාමාන්‍ය ජනතාවට පමණක් නොවෙයි සමාජවාදයේ බලකොටුවට විශාල පහරක්. ඒ වාගේම අවමානයක්. අන්තිමටම සමාජවාදයේ මිනී පෙට්ටියේ ඇණය ගැහැව්වේ මෙතුමායි. අද එතුමා මේ වැදි බණ කිව්වාට අපට වදින්නේ නැහැ. මේවා හොඳයි ගෙදර ගිහිල්ලා කථා කරන්න. හැබැයි එක්සත් ජාතික පක්ෂය මේ පරාටේ ක්‍රමය හඳුන්වලා දුන්නා නම් අද වුණත් අපි ආඩම්බර වෙනවා. මොකද, අමාත්‍ය මණ්ඩලයේ ඇමැතිතුමන්ලාත් ඒක අනුමත කරනවා. මේකේ වරදක් දකින්නේ නැහැ. හැබැයි එතුමන්ලා කියනවා, මිලියන 5කට අඩු සුළු ව්‍යාපාරිකයන්ට යම් කිසි අවස්ථාවක් ලබා දෙන්න ඕනෑය කියලා. අපිත් ඒ සම්බන්ධයෙන් අදහස් දක්වනවා. හැබැයි අපි කියන්නේ පුළුවන් නම් මේක මිලියන 10 දක්වා වැඩි කරන්නය කියලායි. මම ඇමතිතුමාගෙනුත් ඒ ඉල්ලීම කරනවා. මොකද සුළු ව්‍යාපාරිකයන්-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඉදිරියේදී අපට මේ මුදල් ප්‍රමාණය වැඩි කරන්න වෙයි. මොකද, අද ගෙනෙන නීතිය තව අවුරුදු 10කට බලපාන්න පුළුවන්. ඒ අවස්ථාවේදී මේ මුදල් ප්‍රමාණයේ අගය තව වැඩි වෙන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, ඒ නිසා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා - ඉතා හොඳ සංශෝධනයක් - මේක පුළුවන් නම් මිලියන 10කට වැඩි කරන්න කියලා. ඒ වාගේම පවතින නඩු සම්බන්ධයෙන් මේක බලපවත්වන්නේ නැහැ. මා ඉතා ගෞරවයෙන් පවසන්නේ. මේකේ සංශෝධනයට යම් කිසි

වගන්තියක් ඇතුළත් නොවුණොත් ඒක මහ බැංකුවේ සභාපතිටවත්, උසාවියටවත් ලබා දෙන්න බැහැ. මේක ලබා දෙන්න පුළුවන් ශ්‍රේෂ්ඨාධිකරණයට පමණයි. මේකේ යම් කිසි පැහැදිලි කිරීමක් කරනවා නම් ඒ විධියට පමණයි කරන්න පුළුවන්. ඊට වැඩිය හොඳයි ඔබතුමාට පුළුවන් නම් මේ සංශෝධනය ඇතුළත් කරලා, පවතින නඩුවලටත් ඒ අවස්ථාව ලබා දෙන්න. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Thilanga Sumathipala. You have eight minutes.

[අ. භා. 5.39]

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විපක්ෂයේ ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාගේත්, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේත්, ගරු වාසුදේව මැතිතුමාගේත් කථාවන්වලට පසුව කථා කරන්නට ලැබීම ගැන මම සන්තෝෂ වනවා. විශේෂයෙන් රුපියල් මිලියන 5ක් දක්වා මෙම පරාටේ බලය - parate execution කියන එක - ක්‍රියාත්මක කිරීම වැළැක්වීමට ගෙනෙන මෙම යෝජනාව සම්බන්ධයෙන් බහුතරයක් හැටියට බැලුවාම ප්‍රධාන විපක්ෂය වන එක්සත් ජාතික පක්ෂයේ එකඟතාවක් තිබෙනවා. ඒ අය කියන්නේ පුළුවන් නම් ඒක රුපියල් මිලියන 50 දක්වා වැඩි කරන්න කියලායි. රුපියල් මිලියන 10 දක්වා වැඩි කරන්න කියලායි. ඒ නිසා ප්‍රතිපත්තිමය වශයෙන් රජය අරගෙන තිබෙන මේ ක්‍රියාදාමයට ඒ අය එකඟ වීම ගැන අපි සන්තෝෂ වනවා.

අපි ව්‍යාපාරිකයන්ගේ පැත්තෙන් බැලුවොත් සුළු ව්‍යාපාරිකයන්ට ව්‍යාපාර පවත්වා ගෙන යෑමේ හැකියාවක් තිබුණු යුගයක නොවෙයි අපි ගිය අවුරුදු හතර, පහ ගත කළේ. පසු ගිය අවුරුදු 25 ගැන කථා කිරීම කෙසේ වෙතත් අන්තිම අවුරුදු හතර, පහ ගැන බැලුවොත් එවැනි යුගයක් තමයි තිබුණේ. ව්‍යාපාරයක් කියන්නේ යම් කිසි සේවාවක් කරනවා වෙන්න පුළුවන්, භාණ්ඩ නිෂ්පාදනයක් කරනවා වෙන්න පුළුවන්. ඒ වාගේ නොයෙකුත් කර්තව්‍යයන් සඳහා ණය ගන්න කොට බැංකුවලින් අධ්‍යයනය කරලා තමයි දෙන්නේ. ඒ දෙන කොට ඒ අය කොටස් වශයෙන් ණය දෙනවා. තමන්ගේ යන්ත්‍ර ලබා ගන්න, නැත්නම් මොනවා හරි ගොඩනැඟිල්ලක් නිර්මාණය කරන්න ණය දෙනවා. ඒ වාගේම ප්‍රාග්ධනයට අමතරව ව්‍යාපාර කර ගෙන යන්නත් ණය දෙනවා. මේ සියලු දේවල් බැලුවාම, සුළු හා මධ්‍යම ව්‍යාපාරිකයන් තමයි - රුපියල් ලක්ෂ 50කට වඩා අඩුවෙන් ණය ගන්න අය - රටේ තිබෙන තත්ත්වය නරක් වුණොත් ඉක්මනටම අමාරුවේ වැටෙන්නේ. අපට මතකයි, අපේ රටේ දවසට පැය හය, හත විදුලිය නැති වෙලා තිබුණු බව. කොළඹ මහ බැංකුවට - Central Bank එකට - ගැහුවා. ලංකාව පුරාම යුද්ධය විසිරී ගිය අවස්ථාවක - පසු ගිය වකවානුවේ - තමයි ව්‍යාපාරිකයන් හිටියේ. ඒ අයට දෙන්න පුළුවන් සහනයක් දීම අපේ යුතුකම සහ වග කීමයි. මෙතුමා කිව්වා 1939 ආපු නීතිය 1990 එක්සත් ජාතික පක්ෂය හඳුන්වා දුන්නා කියලා. නමුත් 1990 මේ නීතිය ගේන කොට විමලරත්න කමිටුව කියලා විශේෂ කමිටුවක් තිබුණ බව කියන්න එතුමා අමතක කළා. ඒ කමිටුව නිර්දේශ කළේ මේක රාජ්‍ය බැංකු අතර විතරක් ක්‍රියාත්මක කරන්න, මේක පෞද්ගලික බැංකුවලට විවෘත කරන්න එපා කියලායි. ඒක එහෙම කළා නම් මෙතරම් විශාල ප්‍රමාණයක් අය අමාරුවේ වැටෙන්නේ නැහැ.

කෙසේ වෙතත් අද තත්ත්වය අනුව පැහැදිලිවම ආරම්භයක් හැටියට රුපියල් මිලියන 5ක්, ඒ කියන්නේ රුපියල් ලක්ෂ 50ක් දක්වා මේක ගෙනත් තිබෙනවා. එහිදී අපි දැක්කා රුපියල් ලක්ෂ 20ක්, 25ක් වාගේ මුදලක් ණය අර ගත්ත අයට පොලිය එකතු වෙලා, නීතිඥයන්ට ගෙවිව මුදල් දාලා, නඩු ගාස්තු දාලා රුපියල් ලක්ෂ 70, 80 වෙලා තිබෙන බව. ඒ අවස්ථාවලදී ඒ අයගේ සුරක්ෂිතයක් සඳහා දීපු නිවාස, නැත්නම් තමන්ගේ පෞද්ගලික දේපොළ - ඒවා සමහර විට රුපියල් මිලියන15ක් 20ක් වටිනවා වෙන්න පුළුවන්. සමහරවිට රුපියල් මිලියන 3, 4ක් වෙන්න පුළුවන්. - සම්පූර්ණයෙන් නැති වන යුගයක් අපි දැක්කා.

ව්‍යාපාරිකයන් සඳහා බැංකුවකින් ණයක් දෙනවා නම්, බැංකුවත් කරන්නේ ව්‍යාපාරයක්. ඒ අය සමහර විට සියයට 7ට, 8ට අර ගෙන සියයට 10ට 12ට ණය දෙනවා. සමහර අවස්ථාවල සියයට 4ක, 5ක ලාභයක් තිබෙනවා. නමුත් සමහර මුදල් දෙන්නේ සියයට 8ක, 10ක ලාභයක් තියා ගෙන. ඒ අය ව්‍යාපාරයක් කරනවා. ඒ අයට යම් කිසි අවදානමක් - risk එකක්- ගන්න තිබෙනවා.ඒක ව්‍යාපාරිකයා ව්‍යාපාරයක් සඳහා ආයෝජනය කරන විට තිබෙන අවදානම - risk එක - වාගේම ඒ බැංකුවත් ඒ risk එක ගන්න ඕනෑ. ඒ නිසා තමයි අධ්‍යයනය කරන්න ඕනෑ. අධ්‍යයනය කරන්න කණ්ඩායමක් යොමු කරලා මේ මුදල මේ පුද්ගලයාට ගෙවන්න පුළුවන්ද කියලා බලන්න ඕනෑ. ගෙවන්න පුළුවන් කෙනෙකුට තමයි ණය දෙන්නේ. ගරු වාසුදේව නානායක්කාර මහත්මයා ඉතාම පැහැදිලිව කියා සිටි පරිදි මේ දෙන්නේ ණයක්; මේක grant එකක් නොවෙයි; මේක ගෙවන්නේ නැතිව ඉන්න දෙන එකක් නොවෙයි. ඒ නිසා මේ ණය ලබා ගන්නා අයට ණය ගෙවන්න පුළුවන්ද කියලා අධ්‍යයනයක් කරලා දෙන කොට රාජ්‍ය හෝ පෞද්ගලික බැංකුව අනුගමනය කළ යුතු ක්‍රමවේදයක් තිබෙනවා.

ඒ වාගේම සුළු ව්‍යාපාරිකයින්ට විශේෂයෙන් වෙන් වුණ ගණකාධිකාරිවරු, research officers ලා නැහැ. ඒ වාගේම feasibility report කරන්න මිනිසුන් නැහැ. ඒ අය බොහොම සරල ව්‍යාපාරිකයෝ. ඒ අයට යම් කිසි විඥානයක්, අවබෝධයක් තිබෙනවා ක්ෂණිකව මේ ව්‍යාපාරයට ඇතුළත් වෙලා, මුදලක් සොයලා, මේක අළෙවි කරලා දියුණු වෙන්න. ලෝකය සංවර්ධනය වන කොට, දියුණු වන කොට ව්‍යවසායකයා - entrepreneur - තමයි අත්‍යවශ්‍ය වන්නේ. නැත්නම් කෝටි ගණන් ව්‍යාපාර කරන ලොකු ව්‍යාපාරිකයින් තුළින් පමණක් රටේ මුදල් අත මාරු වෙන්නේ නැහැ. ඉතින් මුදල් අත මාරු කරද්දී, රාජ්‍ය අංශයේ ව්‍යාපාරවලින් මුදල් අත මාරු කරන්නත් බැහැ. මේ අයට ගිය අවුරුදු 15ක්, 20ක් තිස්සේ සිදු වුණු අකරතැබ්බ, එහෙම නැත්නම් මුහුණ පාන්න සිද්ධ වුණු දේ නිසා රජය ආරම්භයක් විධියට රුපියල් ලක්ෂ 50ක් දක්වා ගත් ඒ මුදල්වලට parate execution යටතේ ඒ දේපොළ පවරා ගැනීම විතරක් තහනම් කරනවා. ඒ වුණාට, ණයක් දීලා තිබෙනවා නම් බැංකුවේ යන්ත්‍රණය තුළින් ඒ ණය මුදල ආපසු ලබා ගැනීමේ ක්‍රමවේදය කර ගෙන යෑමේ කිසිම තහංචියක් මෙහි නැහැ. කෙනෙක් ණයක් අරගෙන තිබෙනවා නම්, බැංකුවෙන් ණයක් දීලා තිබෙනවා නම් ඊට අදාළ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේ හැකියාව අදටත් තිබෙනවා; ඊයේත් තිබුණා; හෙටත් තිබෙනවා.

මේකෙන් අපි උනන්දු කරවන්නේ මොකක්ද? ඒ තමයි අපේ ව්‍යවසායකත්වය. අද විශාල ඉල්ලුමක් තිබෙනවා, සුළු ව්‍යාපාර ආරම්භ කර ගන්න. ඔය micro-finance sector එක තිබෙනවා. සුළු ව්‍යාපාරවලට පොඩි පොඩි මුදල්, රුපියල් 50,000ක්, රුපියල් 1,00,000ක් දක්වා දෙන්න පුළුවන්. සුළු ව්‍යාපාරය ස්වයං රැකියාවක් නොවෙයි. යම් කිසි නිර්මාණශීලී කර්මාන්තශාලාවක් කුඩාවට ආරම්භ කරන ව්‍යවසායකයෙකුට ලක්ෂ 25ක්, 30ක් අඩුම තරමින් අවශ්‍යයි. ලක්ෂ 50කට අඩුවෙන් යොදලා ව්‍යාපාර ආරම්භ කරන අය තමයි මේ රටේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම ඉදිරියට ගෙන යන්නේ. විශාල වශයෙන් ලොකු ව්‍යාපාරිකයන් බිහි වුණත් කුඩා ව්‍යාපාරිකයාත් ශක්තිමත් කළ යුතුයි. මුදල් අත මාරු වන

[ගරු තිලංග සුමතිපාල මහතා]

කොට ගම් මට්ටමේ ව්‍යවසායකයන්ට තමයි තමන්ගේ ප්‍රදේශවල සිටින දහස් ගණනක් අයට ක්ෂණිකව රැකී රක්ෂා ලබා දෙන්න පුළුවන් වෙන්නේ. ඒ අයගේ නිර්මාණශීලිකම අනුව ගම් මට්ටමින් නොයෙකුත් කර්මාන්තවල නියැලෙන්න ඒ අයට පුළුවන්. හැබැයි ඉස්සර වාගේ රුපියල් 50,000කට, රුපියල් 1,00,000කට ව්‍යාපාරයක් ආරම්භ කරන්න බැහැ. ලක්ෂ 25ක්, 30ක් වාගේ ප්‍රමාණයක් අවම වශයෙන් අවශ්‍යයි. ප්‍රාග්ධනයක් අවශ්‍යයි. යන්ත්‍රෝපකරණ ගන්න ඕනෑ. ගොඩනැගිල්ලක් අවශ්‍යයි. ප්‍රවාහනයට වාහනයක් අවශ්‍යයි. මේ සියලු දේවල් එක්ක ගම් මට්ටමින් ඉන්න ඉතා අඩු පහසුකම් තිබෙන, ඒ වාගේම ඉතා අඩු දැනුමක් තිබෙන ඒ දරුවන්ට පවා රැකී රක්ෂා අවස්ථාවන් ලබා දෙන්න ඒ කුඩා ව්‍යාපාරිකයන්ට පුළුවන්. ඒ රැකී රක්ෂා අවස්ථා පුළුල් වීම තුළින් තමයි අපේ මුදල් අත මාරු වෙලා මේ යන්ත්‍රණය ඉදිරියට යන්නේ.

ගරු ඇමතිතුමනි, ඒ නිසා මා හිතනවා මෙය ඉතාම කාලෝචිත, අවස්ථාවට සුදුසු, ජනතාව අපේක්ෂා කරන යෝජනාවක් කියලා. මෙම විවාදයට සහභාගි වන්නට ලැබීම ගැන අපි සන්තෝෂ වනවා. ඒ වාගේම විපක්ෂයේ බහුතර දෙනාගේ කැමැත්ත මෙයට ලැබීම ගැනත් අපි සන්තෝෂ වනවා. ඉදිරියේ දී මේ මුදල් ලබා ගැනීම ගැන සොයා බලා, රුපියල් මිලියන 5ක් මදි නම්, ඒ යන්ත්‍රණය ක්‍රියාත්මක වන විධිය බලලා නැවත ඒ ගැන හිතන්න අපට පුළුවන්. පසු ගිය කාලයේ අපේ සතොස වෙළෙඳ සැල් පැය 24ම විවෘත කර තැබුවා. අවසානයේ ඒ ලයිට් බිල් ගෙවා ගන්න පවා බැරි වුණා. ඒ මුළු ලංකාවේම CWE විවෘත කර තබපු නිසා. ඒක සාර්ථක නැහැ. අපි ඒ ගැන අත් දැකීමෙන් දන්නවා. ආරම්භයක් හැටියට මේ යෝජනාව ඉතාම හොඳයි. මේ ඉදිරිපත් කර තිබෙන සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳව සන්තෝෂ වෙමින්, මට මේ අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

[අ. භා. 5.47]

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත විවාදයට ලක් කර තිබෙන අවස්ථාවේ, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයෙන් සහභාගි වුණු සියලුම නිලධාරින්ටත්, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ සහ නීතිපති දෙපාර්තමේන්තුවේ සියලු දෙනාටත් අපේ ස්තුතිය පළමුකොට පුද කරන්න ඕනෑ. ඒ වාගේම මේ විවාදයට සහභාගි වුණු සියලුම මන්ත්‍රීවරුන්ට අපේ ස්තුතිය පුද කරන්නට ඕනෑ. ඒ වාගේම ඊයේ දිනයේ විවාදයට ගත් රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පතත් ඒ ආකාරයෙන්ම විවාද කරලා, අද කාරක සභා අවස්ථාවට යොමු කරලා තිබෙනවා. මම ඒ කරුණු ටික පළමුව මතක් කරනවා.

විශේෂයෙන්ම අද දින මෙම විවාදය බැංකු පිළිබඳවත්, ඊයේ විවාදය රක්ෂණය පිළිබඳවත් පවත්වන්නට පරිසරය හැදුණේ කොහොමද කියන ටික අපි කවුරුත් හඳුනා ගත යුතුයි කියලා මම හිතනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා, මහින්ද චින්තන ඉදිරි දැක්ම තුළ විශේෂයෙන්ම මෙම සංශෝධනය ඉදිරිපත් කරලා තිබෙන්නේ සමස්ත ආර්ථික ක්‍රියාවලිය තුළම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්වය සහ කුඩා ව්‍යාපාරිකයන් සඳහා වූ සහන වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යෑම සඳහායි. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා හැටියට මෙම පනත් කෙටුම්පත් දෙක ඉතාම ඕනෑකමින් ඉදිරිපත් කරපු පනත් කෙටුම්පත් දෙකක් කියන ටිකත් මා මතක් කරන්ට ඕනෑ. බැංකු ගැන අද අපට මෙතැන විවාද කරන්නට පුළුවන් අවස්ථාව ලැබිලා තිබෙන්නේ ලංකාවේ බැංකු කඩා වැටුණේ නැති නිසායි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අද යුරෝපයේ බැංකු කඩා වැටෙනවා. අයිස්ලන්තයේ, අයර්ලන්තයේ, පෘතුගාලයේ, ස්පාඤ්ඤයේ, ග්‍රීසියේ බැංකු කඩා වැටෙනවා. ඇමෙරිකාවෙන් ආරම්භ වුණු ආර්ථික අවපාතය තුළ ඇමෙරිකාවේ වුණත් මේ පරාටේ ක්‍රමය නොවෙයි තිබෙන්නේ. වාහනය පාරේ යන කොට උස්සා ගෙන යනවා, නිවසේ ඉන්න මිනිස්සු එළියට දානවා ණය ලබා ගන්න බැරි නිසා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ රටවල ඒ ක්‍රමය තුළ කඩා වැටුණු ආර්ථිකයක් තිබුණත්, ලංකාවෙහි අපේ බැංකු පද්ධතියත් අපේ ආර්ථිකයත් මෙලෙස සියයට අටක වර්ධන වේගයකින් ඉදිරියට ගමන් කරන්නට පුළුවන් අවස්ථාව රැක දුන්නේ මේ මහින්ද චින්තන වැඩ පිළිවෙළ තුළ වූ ආර්ථික කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය නිසාය කියන ටික අපි මතක් කරලා දෙන්නට ඕනෑ. ඒ නිසායි බැංකු සම්බන්ධ මෙවැනි සංශෝධනයක් ගැන විවාද කරන්නට පුළුවන් අවස්ථාව අද අපට ලැබිලා තිබෙන්නේ. එලෙස බැංකු කඩා වැටිලා මේ ආර්ථිකය කඩා වැටිලා තිබුණා නම් මෙතැන මෙලෙස අපට සාකච්ඡා කරන්නට පුළුවන් අවස්ථාවක් නැහැ. අද පරිසරය තුළ ආර්ථිකය පිළිබඳ අලුත් බලාපොරොත්තුවක් ඇති වී තිබෙනවා. බැංකුකරුවන්ට මෙන්ම ණය ගන්නන්ට අලුත් බලාපොරොත්තුවත් ඇති වෙලා තිබෙනවා, තමන්ගේ නිවසට ණයක් ගන්නට පුළුවන්, තමන්ගේ කර්මාන්තයට ණයක් ගන්න පුළුවන් කියලා. ඒ වාගේම බැංකුකරුවන්ටත් විශ්වාසය ඇති වෙලා තිබෙනවා, අපට ඔවුන්ට ණයක් දෙන්නට පුළුවන් කියන එක පිළිබඳව. ඒ පරිසරය අද මේ ආර්ථික ක්‍රියාදාමය තුළ ගොඩ නැඟිලා තිබෙනවාය කියන ටික අපි මතක් කරලා දෙන්නට ඕනෑ.

ඊයේ අපි රක්ෂණය ගැන කථා කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාත් උතුරේ මන්ත්‍රීවරයෙක්. අතිගරු ජනාධිපතිතුමා 2005 දුන්නු පොරොන්දුව අනුව මේ රටේ උතුරේත්, නැඟෙනහිරත් අලුත් පරිසරයක් ගොඩ නැඟුණා. අවුරුදු 30ක ව්‍යසනය අවසන් කළා. ප්‍රභාකරන්ගේ නායකත්වයෙන් තිබුණු එල්ටීටීඊ ත්‍රස්තවාදය අවසන් කළා. මේ ගරු සභාවේ ඊයේ යෝජනා කළේ ජීවිත රක්ෂණ ක්‍රමයයි, සාමාන්‍ය රක්ෂණ ක්‍රමයයි වෙන් කරලා අවුරුදු පහක් තුළ ඒ කර්මාන්ත දෙක වෙනම දියුණු කරන්නයි. නමුත් ජීවිතය පිළිබඳ උපරිම රක්ෂණ සහතිකය ලබා දුන්නේ අතිගරු ජනාධිපතිතුමා යටතේ මේ ත්‍රස්තවාදය පරාජය කිරීම තුළයි කියන ටික අපි මතක් කරලා දෙන්නට ඕනෑ. ඒ නිසායි අපිට ජීවිත රක්ෂණ පිළිබඳ බලාපොරොත්තුවකින් සහ විශ්වාසයකින් යුතුව කටයුතු කරන්නට පුළුවන් වුණේ. එදා ජීවිතය පිළිබඳ රක්ෂණය තිබුණේ, අර නන්දිකඩාල් කළපුවේ එහා පැත්තේ හිටපු එල්ටීටීඊ නායක ප්‍රභාකරන්ගේ අතේ තිබුණු බොත්තමේ. ඒ තිබුණු අවදානම, ඒ අන්තරාව අයින් කරපු නිසා තමයි අද ජීවිත රක්ෂණය ගැන අපට කථා කරන්නට පුළුවන් වාතාවරණය හැදිලා තිබෙන්නේ. සේනාධි නායකයා හැටියට එතුමා දුන්නු නායකත්වයත්, රණ විරුවන් ඒ වෙනුවෙන් කළ මහා කැප වීමත් නිසායි මේ රක්ෂණය ගැන අපට කථා කරන්නට පුළුවන් පරිසරය අද ගොඩ නැඟිලා තිබෙන්නේ. මේ දෙකම එකතු කරපු පරිසරයයි අපේ ආර්ථික වර්ධනයට හේතු වෙලා තිබෙන්නේ. අද පිට රට ආයෝජකයන්ට ලංකාවට ඇවිල්ලා අපේ සංවර්ධනයට එකතු වෙන්න පුළුවන් අවස්ථාව ලැබිලා තිබෙන්නේ ඒ තුළයි කියන ටික මම මතක් කරන්න ඕනෑ. මා දීර්ඝව කථා කරන්නේ නැහැ. අපේ හිටපු නියෝජ්‍ය ඇමතිතුමා මේ ගැන කථා කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අනෙක් කාරණය මේකයි. 1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත එදා 1989 පාර්ලිමේන්තුවට ගෙනාපු වෙලාවේ පාර්ලිමේන්තුවේ අපේ ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාත් හිටියා. අපේ ගරු අස්වර් මන්ත්‍රීතුමාත් හිටියා. අපේ සභානායක ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා, ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා, අපේ ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා ඇතුළු අපි විරුද්ධ පක්ෂයේ හිටියේ. අපි වැඩි දෙයක් ඉල්ලුවේ නැහැ. එක්ලක්ෂ පණස්දහසක සහනය, ඒ ප්‍රමාණය පරාටයෙන් නිදහස් කරන්න කියලායි ආණ්ඩු පක්ෂයේ හිටපු එක්සත් ජාතික පක්ෂයෙන් අපි ඉල්ලුවේ. "මේ පනත් කෙටුම්පත පාස් කරන්න එපා. හරකා බාන විතරක් නොවෙයි, ඒ තිබෙන වත්කම් සියල්ලම ගෙන යන්නටයි මේ එක්ලක්ෂ පණස්දහසෙන් අඩුවට මේක ගෙන යන්න හදන්නේ" කියන ටිකයි අපි එදා කිව්වේ. ණය වෙනුවට ධීවරයින්ගේ බෝට්ටුව, ගොවියාගේ ට්‍රැක්ටරය ගෙන යන්නට ඉඩ දෙනවාද නැද්ද, ගෙදර තිබෙන අනෙක් බඩු ටික ගෙන යන්නට ඉඩ දෙනවාද නැද්ද කියන එක තමයි අපි එදා ප්‍රශ්න කළේ. "රුපියල් එක්ලක්ෂ පණස්දහසට වැඩි ණය සඳහා පමණයි" කියන ටික පනත් කෙටුම්පතට ඇතුළත් කරන්නය කියලා මේ අපේ ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා ඉල්ලුවාම, රනිල් වික්‍රමසිංහ මහත්මයා කියාපු දේ 1990 ජනවාරි 30 හැන්සාඩ් වාර්තාවේ 1671 තීරුවේ අන්තිම ඡේදයේ සඳහන් වනවා. එක්ලක්ෂ පණස් දහසක සහනය දෙන්න බැහැයි කියන ටික ඒ ප්‍රකාශයේ තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතිහාසයේත් අපි එකම ස්ථාවරයකයි හිටියේ. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා, ගරු අතාවුද සෙනෙවිරත්න ඇමතිතුමා, -අපි- එදා එකම ප්‍රගතිශීලී ස්ථාවරයක සිටියේ. ඒ ස්ථාවරයේ ඉඳ ගෙනයි අදත් මේ සහනය ලබා දෙන්න කටයුතු කරන්නේ. ධීවරයින්ට, කෘෂිකර්මයේ යෙදී සිටින අයට, ගොවි කර්මාන්තයේ යෙදී සිටින අයට, transport bus එක අරගෙන ස්වයං රැකියාව කරන අයට, බෝට්ටුව අරගෙන මහ මුහුදේ යන අයට මේ සහනය දෙන්නයි අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් මේ ඉටු කරන්න කටයුතු කරන්නේ. ඒ අයටයි මේ ලක්ෂ පණහක අවමයකට යටත්ව මේ පරාටේ බලය ක්‍රියාත්මක කිරීමේ අවස්ථාව ඇති කළේ. ඒ කියන්නේ, ලක්ෂ පණහ වෙනකම් කෙනෙකුට ඒ අවදානම එන්නේ නැහැ. ගෙදර ඉන්න කොට එළියට දමන්නේ නැති රක්ෂණයක්, පාරේ යන කොට වාහනය seize කරන්නේ නැති ආවරණයක් තමයි මේ තුළ තිබෙන්නේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Now, please wind up.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
සාමාන්‍ය නීතිය තුළ ගමන් කරන්න. ඒ සඳහා අවස්ථාව තිබෙනවා. අන්න, එයයි අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටින්නේ. ඒකට සහයෝගය දෙන්න කියන ටිකයි අපි මතක් කරන්නේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ස්තුතියි.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
මා ඊට වඩා දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අපේ ඇමතිතුමා මේ පිළිබඳ සංශෝධනත්, ඒ වාගේම රක්ෂණ කර්මාන්තය පිළිබඳ සංශෝධනත් ඉදිරි පැය තුළ ඉදිරිපත් කරනවා. ඒ සඳහා වූ සහයෝගය අපි බලාපොරොත්තු වනවා. මේ රටේ ඉන්න දේශීය කර්මාන්තකරුවන් වෙනුවෙන්, දේශීය ව්‍යවසායකයන් වෙනුවෙන්, මධ්‍ය පරිමාණ, කුඩා පරිමාණ ව්‍යවසායකයන් වෙනුවෙන්, මේ සාමාන්‍ය ජනතාව වෙනුවෙන් මේ පනත් කෙටුම්පතට සහයෝගය දෙන්න.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, please wind up now.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
මේක බෙදීමකින් තොරව සම්මත කරන්න. එදා බෙදීමකින් නොවෙයි අපිව එළියට දාලා තනිවමයි මේවා සම්මත කළේ. තමුන්නාන්සේලාටත් මේ රටේ ජනතාව පිළිබඳව කැක්කුමක් තිබෙනවා නම් මේක සහයෝගයෙන් සම්මත කරන්න කියලා අපි අද ඉල්ලා සිටිනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please!

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
අන්න ඒ මහින්ද චින්තන වැඩ පිළිවෙළේ ඉදිරි දැක්මට සහයෝගය දෙන්න කියලා ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා. ඔබ සියලු දෙනාට ස්තුතියි.

[අ. භා. 5.56]

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாபிட்டிய - தொலைத் தொடர்புகள், தகவல் தொழில்நுட்பவியல் அமைச்சர்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of Telecommunication and Information Technology)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා විශේෂයෙන් සතුටු වනවා, මේ සුවිශේෂී ප්‍රගතිශීලී සංශෝධනය -පොදු ජනතාව වෙනුවෙන් වූ සංශෝධනය- ගැන ආණ්ඩු පක්ෂය වෙනුවෙන් අවසාන කථාව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මා දකිනවා, මේ මුළු සභාවම මේ සංශෝධනයට එකඟ බව. මේ ගරු මන්ත්‍රීතුමන්ලා කථා කරනවා මා අසා සිටිය වේලාව බැලුවොත් විපක්ෂයේ කිසිවකු මා දැක්කේ නැහැ මේකට-

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
අපි සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ඔබතුමා වාඩි වන්න, වාඩි වන්න. කලබල වන්න එපා. සංශෝධන පමණයි එතුමන්ලා ඉදිරිපත් කරන්නේ. මොකද මේක ප්‍රගතිශීලී සංශෝධනයක්. මේකට කාටවත් විරුද්ධ වන්න බැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මූලට යන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් අපි කථා කරපු දේ ගැන

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

සංක්ෂිප්ත කරුණු කිහිපයක් මා ඉදිරිපත් කරන්න කැමැතියි. 1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත එක්සත් ජාතික පක්ෂ රජය කාලයේයි ගෙනාවේ. ඒකේ කිසි තර්කයක් නැහැ. ඒ ගෙනාපු පනත මඟින් තමයි පරාටේ බලතල සියලුම බැංකු ආයතනවලට ලැබුණේ. සමහර බැංකුවලට ඒවා ස්ථාපනය කළ පනත් මඟින් ඒ බලතල පැවරුණා. පෞද්ගලික බැංකු ඇතුළු සියලුම බැංකුවලට මේ අයිතිවාසිකම මේ පනතෙන් ලැබුණා. අද අපි උත්සාහ කරන්නේ රුපියල් ලක්ෂ පණහට වඩා අඩුවෙන් ණය ගත් අය සම්බන්ධයෙන් ඒ පරාටේ බලතල ඉවත් කරන්නයි. මූලික ණය මුදල රුපියල් ලක්ෂ 50ට අඩු නම් -අඩු කරන එම ණය මුදල මත අය කරනු ලබන පොලිය සහ ඒ මත පනවා ඇති දඩ මුදල හැර- ඔවුන්ට මේ පරාටේ බලතල නැත්නම් ක්ෂණිකව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීන්දු කරමින් ඔවුන්ගේ උකසට තැබූ දේපොළ පවරා ගැනීමේ බලතල ඉවත් කිරීම මේ තුළින් බලාපොරොත්තු වනවා. දැනට තිබෙන පනත යටතේ, ඕනෑම කෙනෙකු එක ණය වාරියක් නොගෙවා සිටියත්, ඔහු උකසට තැබූ දේපොළ අධ්‍යක්ෂ මණ්ඩලයේ පත්‍රිකාවක් මඟින් පළමුවැනි සතියේම පවරා ගන්න පුළුවන්කම තිබුණා. අද අප කියන්නේ ලක්ෂ 50ක් දක්වා වූ මූලික ණය මුදලක් ගත්ත අය -ඔහුගේ පොලිය එතැන නැහැ. දඩ මුදලක් තිබෙනවා නම් ඒකත් එතැන නැහැ.- මේ පරාටේ බලතලවලින් නිදහස් වනවාය කියායි. හැබැයි උකස් පනත යටතේ බැංකුවට තිබෙන බලතල, එනම් උසාවියට ගොස් කරුණු දක්වලා තමන්ට තිබෙන අයිතිවාසිකම නැත්නම් ඒ දේපොළ අයිති කර ගැනීමේ අයිතිය පැහැර ගැනීමක් මෙතැන සිදු වන්නේ නැහැ. බැංකුවත් ආරක්ෂා වනවා. මේක ඉතාමත් ප්‍රගතිශීලී, විශේෂයෙන් මේ රටේ පොදු ජනතාව වෙනුවෙන්, ඒ වාගේම කුඩා ව්‍යාපාරිකයන් වෙනුවෙන් ගත්ත තීරණයක්. අපි "මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැහැදිලිව කිව්වා, මේ රටේ ඉදිරි ආර්ථික ගමනේ කොඳු නාරටිය වන්නේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයාය කියලා. ඒ නිසාම අතිගරු ජනාධිපතිතුමාට අවශ්‍ය වුණා, ඔවුන් ආරක්ෂා කරන ක්‍රමවේදයක් හැම විටකම හදන්න. මා නියෝජ්‍ය මුදල් ඇමතිවරයා විධියට ඉන්න කාලයේ අපි මේ පනත් කෙටුම්පත ගෙනාවා. න්‍යාය පත්‍රයේ අවුරුදු ගණනාවක් මේක තිබුණා. මට මතකයි ජනතා විමුක්ති පෙරමුණ අපිත් එක්ක හිටපු කාලයේ පැය ගණනක් අපි මේ ගැන තර්ක කළා, මේක ප්‍රගතිශීලී වෙනස් කිරීමක්ය මේකට ඉඩ දෙන්න කියලා. එතුමන්ලා අද වාගේමයි එදාත්. එදාත් එතුමන්ලා මේකේ කොරහේ කිඹුල්ලු දැක්කා. එතුමන්ලා කිව්වේ මේක බැංකු කඩා වට්ටන්න හදන මහා වැඩ පිළිවෙළක්ය කියායි. මේකෙන් සිදු වන්නේ රාජ්‍ය බැංකු කඩා වැටීම කියන මහා තර්කයක් ගෙන ඒම නිසා අපට මේ ප්‍රගතිශීලී පනත් කෙටුම්පත කල් දාන්න සිද්ධ වුණා. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු ඉන්නවා නම් එතුමන්ලාට ඒ ගැන මතක් කර දෙන්න මා කැමැතියි. අදටත් එතුමන්ලා වෙනස් වෙලා නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එකම වෙනසයි ඇති වෙලා තිබෙන්නේ. එදා 39ක්ව හිටපු සාමාජිකයන් අද තුනක් නැත්නම් හතරක් දක්වා අඩු වෙලා තිබෙනවා. මම හිතනවා මේ වාගේ දේවල්වලට විරුද්ධ වීම නිසා සාමාජික සංඛ්‍යාව තවත් වෙනස් වෙයි කියලා. අදත් ඒ තර්කයම දමා කථා කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි කිසි දවසක මේ රටේ බැංකු අනාරක්ෂිත කළේ නැහැ. එක්සත් ජාතික පක්ෂ යුගයේ බැංකු විකුණන්න කථා කරපු ඒ ක්‍රමවේදය අපි සපුරා වෙනස් කළා. ඒ බැංකු සියල්ල අද ශක්තිමත් බැංකු. එපමණක් නොවෙයි පෞද්ගලික බැංකුත් අපි ආරක්ෂා කළා. ලෝකයේ බැංකු කඩා ගෙන වැටෙද්දි අපේ බැංකු ශක්තිමත්ව ඉදිරියට ගියා. අපි හැම විටෙකම බැංකු පද්ධතියත් ආරක්ෂා කර ගෙන අපේ අරමුණු කරා ගියා. මේ රටේ සමස්ත ජනතාව වෙනුවෙන් අපට අරමුණක් තිබෙනවා. නිවසක් සාදා ගන්න කුඩා ණය මුදලක් ගන්න ණය ගැතියා සමහර විට අපේ රටේ තිබෙන ඇප පනත කියවා නොවෙයි ගිවිසුමේ අත්සන් කරන්නේ. ඔහු ණයක් ලබා ගැනීම මහ වරප්‍රසාදයක් හැටියට සිතා අත්සන් කර ගෙන, අත්සන් කර ගෙන යනවා; අවශ්‍ය නම් කෙටි අත්සන ගහනවා, දිග අත්සන ගහනවා. අවසානයේ යම් කිසි සාධාරණ ප්‍රශ්නයක් නිසා ඔහුට ණය ගෙවා ගන්න බැරි වන අවස්ථාවක, පළමුවැනි වාරිකය හිඟ වන විටම කිසිම සාධාරණ කරුණු දැක්වීමකට ඉඩ නැතුව තමන්ගේ නිවසෙන් ඔහුට දොට්ට බහින්න සිද්ධ වනවා නම් එතැන ප්‍රශ්නයක් තිබෙනවා. රජයක් හැටියට අපි සූදානම් මෙතැනදී මැදිහත් වන්න. ඒක තමයි මේ වෙනස අපි කරන්නේ. කුඩා ව්‍යාපාරිකයෙක් වන්න පුළුවන්, වී මෝල් හිමියෙක් වන්න පුළුවන්, කුඩා ගොවියෙක් වන්න පුළුවන්, සත්ව පාලකයෙක් වන්න පුළුවන් අපට ඒ අය ගැන වග කීමක් තිබෙනවා. විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා මුදල් අමාත්‍යවරයා හැටියට මීට අවුරුදු ගණනාවකට පෙරයි මේ පනත් කෙටුම්පත ගෙනෙන්න සූදානම් වුණේ. ජනතා විමුක්ති පෙරමුණ අද වාගේම එදාත් මේකට විරුද්ධ වුණා. මේ න්‍යාය පත්‍රය බලන්න කියලා මම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට දිගින් දිගටම මේ පනත් කෙටුම්පත ඇතුළත් වුණා. දැන් අපි ඒ පනත් කෙටුම්පත නැවතත් ගෙනැල්ලා තිබෙනවා.

මෙහි සඳහන් රුපියල් මිලියන 5 වෙනුවට රුපියල් මිලියන 50 දක්වා එම මුදල වැඩි කරන්න කියලා එක්සත් ජාතික පක්ෂය ඉල්ලා සිටිනවා. අපි මේ බැංකු පද්ධතියත් ආරක්ෂා කළ යුතුයි. හැබැයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ නොගෙවන ණය සංයුතිය දිහා බැලුවාම එතුමන්ලාගේ තර්කය මොකක්ද කියලා පැහැදිලි වනවා. අදටත් බැලුවොත් මේ රටේ නොගෙවන රාජ්‍ය ණයවලින් වැඩි ප්‍රමාණයක් තිබෙන්නේ 1994ට පෙර ගත්ත ණයයි. 1994ට පෙර අතීතයට ගොනු වන නොගෙවන ණය ප්‍රමාණයෙන් සියයට සියයකට කිට්ටු ප්‍රමාණයක් තිබෙන්නේ රුපියල් මිලියන 5කට වඩා වැඩි ණයයි. ඔබතුමන්ලා මේ රුපියල් මිලියන 5 මදි වෙලා මේ ගරු සභාව දෙවනත් කරන්නේ ඇයි කියන රහස එතැන තිබෙනවා. අපි එතැනදී බලන්න ඕනෑ නොගෙවන ණය සංයුතියයි. නොගෙවන ණයවලින් වැඩි ප්‍රමාණයක් -සියයට 50කට වැඩි ප්‍රමාණයක්- අදටත් තිබෙන්නේ 1994ට පෙර දේශපාලන බලපෑම් මත ලබා දුන් ණයයි. ඒ ගැන මහජන බැංකුවෙන් අහන්න පුළුවන්; ලංකා බැංකුවෙන් අහන්න පුළුවන්. එතැනයි රහස තිබෙන්නේ. එයින් සියයට සියයක් බැලුවොත් තිබෙන්නේ රුපියල් මිලියන 5ට වඩා වැඩි ණයයි. මෙන්න මේකයි අද අලුත් කරුණාවක් ඇති වෙලා තිබෙන්නේ. මේ රුපියල් මිලියන 5 සීමාව මදී, මේක රුපියල් මිලියන 50 දක්වා වැඩි කරන්න කියලා අලුත් ඉල්ලීමක් ඇති වී තිබෙන්නේ ඇයි කියන එකේ රහස තිබෙන්නේ එතැනයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපට අවශ්‍ය නැහැ එහෙම. අපට අවශ්‍ය මේ රටේ පොදු ජනතාව වෙනුවෙන් බැංකුව උදවුකාරයෙක් බවට පත් කරන්නයි. ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා චක්‍රලේඛයක් අරගෙන මහා විශාල අලුත් කථාවක් කියන්න උත්සාහ කළා. නැහැ. බැංකුවක් ණය ලබා දිය යුත්තේ ණය ගැතියා උගසට තබන දේපළ අයිති කර ගැනීමේ පරමාර්ථයෙන් නොවෙයි. ඒක අමතර කාරණාවක්. ප්‍රධාන පරමාර්ථය විය යුත්තේ, විශේෂයෙන්ම ජාතික බැංකුවක ණය ලබා දීම තුළින් ණය ලබා ගන්නා තැනැත්තා ඒ අරමුණ කරා මෙහෙයවීමයි. ඒකයි බැංකුවේ උපදේශකවරු ඉන්නේ. ණය ලබා ගන්නා තැනැත්තාව ඒ ඉලක්කය කරා ගෙන යෑමේ වග කීමත් අරගෙන ඔහුගෙන් තමන් ලබා දුන් මුදල ආපසු ලබා ගැනීම තමයි බැංකුවක වගකීම වන්නේ. එහෙම නැතුව පළමුවැනි වාරිකය හිඟ වන කොටම අර මනුස්සයා උගසට තැබූ දේ ඒ මනුස්සයාගේ ඇඳි වස්ත්‍රයත් එක්ක උදුරා ගැනීම නොවෙයි ජාතික බැංකු පද්ධතියක කාර්ය භාරය විය යුත්තේ. අද අපි ඒ සඳහා මේ රටේ මූල්‍ය පද්ධතියට මඟ පෙන්වන්න තමයි සූදානම් වෙලා තිබෙන්නේ. ඒකයි මේකේ ඉතාම පැහැදිලි කාරණාව. ඒ නිසා අපි ඉතාම වග කීමෙන් කියනවා, අපි බැංකු පද්ධතියත් ආරක්ෂා කරන බව. මොකද, රුපියල් මිලියන 5ට අඩු ණය ගැතියන් වෙනුවෙනුත් බැංකුවට තිබෙන උගස් පනතේ බලතල අද අපි ගෙනෙන මේ සංශෝධනය නිසා කිසි සේත්ම අඩු වන්නේ නැහැ. බැංකුවට පහසුවෙන් පුළුවන් ඒ කාරණා ටික ඉෂ්ට කරන්න. බැංකුවක් කියන්නේ විශාල ක්‍රියාදාමයක් තිබෙන, නීති උපදේශකයින් සිටින, බොහොම පළපුරුදු නිලධාරින් සිටින, පැහැදිලි යන්ත්‍රණයක් තිබෙන ආයතනයක්. මේ කුඩා ණය ගැතියා මම කිව්ව ආකාරයට ඊට වඩා

හුඟක් වෙනස්. සමහර විට ඔහුගේ ප්‍රධාන අවශ්‍යතාව නිවස සාදා ගැනීමේ සිහිනය වන්න පුළුවන්. ඒ නිසා ඔහු මේ මුදල ණයට ගැනීමේදී කිසිම අවබෝධයකින් මේ වගන්ති කිසි සේත්ම කියවා බලන්නේ නැහැ. අපි ඒක අත් දැකීමෙන් දන්නවා. සමහර විට ඒ අත්‍යවශ්‍ය කාරණයට යොමු වෙච්ච ජනතාව ණය මුදල අනුමතයි කියලා ලැබෙන පණිවුඩයෙන් නොමිලේ විශාල මුදලක් ලබනවා වාගේ සතුටක් ලබනවා. අපේ වග කීමයි අප අද ඉෂ්ට කරන්න යන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මා මේ කාරණය පැහැදිලි කිරීම අවශ්‍යයි. මේ රටේ විදේශ ණය පොලිය ගැන මේ ගරු සභාවේ කථා බහට ලක් වුණා. අද අපේ රට ශක්තිමත්ව ඉදිරියට යන මැද කාලීන ආර්ථිකයක් තිබෙන රටක්. අපේ අද ඒක පුද්ගල ආදායම ඩොලර් 2,000 ඉක්මවා ගිහින් තිබෙනවා. එම නිසා අපට ණය ගන්නට වෙලා තිබෙන්නේ විවෘත වෙළඳ පොළෙන්. විවෘත වෙළෙඳ පොළෙන් ණය ගන්නා හැම විටකම අපට ලෝක මූල්‍ය පද්ධතියත් එක්ක, මූල්‍ය සැපයුම්කරුවන් එක්ක තරග කරන්න, ගනුදෙනු කරන්න, කේවල් කරන්නට සිද්ධ වෙලා තිබෙනවා. අපට මීට අවුරුදු තිහකට ඉස්සෙල්ලා අප ආර්ථික වශයෙන් නැඟිටින්නට සූදානම් වන වෙලාවේ ලැබුණු ප්‍රමාණයට අද අපට ණය ලබා ගන්නට බැහැ. එම නිසා ඒක අරගෙන, අප මහා විශාල පොලී අනුපාතයකට ණය ගන්න යනවාය කියා විශාල කතන්දරයක් කියන්නට උත්සාහ කරනවා නම් එයත් විපක්ෂය විසින් මේ රටේ ජනතාවට දෙන්නට යන වැරදි පණිවුඩයක්. මා ඒ පිළිබඳව විශේෂයෙන් ප්‍රකාශ කරනවා. මා විපක්ෂයෙන් මේ කාරණය ඉල්ලා සිටිනවා. ඔබතුමන්ලාට හිතට එකඟව නම් මේ ප්‍රගතිශීලි සංශෝධනයට විරුද්ධ වන්නට බැහැ. මෙය මේ ගරු සභාවටත් ගෞරවයක්. අප සියලු දෙනාගේම එකඟත්වය මත මේ සුවිශේෂී ජනතාවාදී වෙනසට, මේ පනතට ඇති කරන සංශෝධනයට සියලු දෙනාගේ සහයෝගය ලබා දෙන්නටය කියා ඉල්ලා සිටින අතර ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." [ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]***
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா ]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." [The Hon. Nimal Siripala de Silva]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
[MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *in the Chair.]*

***1 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1 ordered to stand part of the Bill.*

## 2 වන වගන්තිය.- (1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතට 5අ යන අලුත් වගන්තිය ඇතුළත් කිරීම)
## வாசகம் 2.- (1990ஆம் ஆண்டின் சட்டமூலம் 4ஆம் இலக்க வங்கிகளால் வழங்கப்பட்ட கடன்கள் அறவிடுதல் (விஷேட ஏற்பாடுகள்) சட்டத்தில் 5அ என்னும் புதிய பிரிவை உட்புகுத்துதல்.
CLAUSE 2.- (*Insertion of new section 5A in the Recovery of Loans by Banks (Special Provisions) Act, No. 4 of 1990.*)

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "1 වන පිටුවේ, 26 වන පේළියේ සිට 29 වන පේළිය දක්වා වූ පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න :

'(2) යම් බැංකුවක් මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමට අදාළ විධිවිධානවල කුමක් සඳහන් වුවද, තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ සාදන ලද සංස්ථාගත කිරීමේ නියමයක් මඟින් පිහිටුවන ලද යම් බැංකුවක් සම්බන්ධයෙන් මේ පනතේ 5අ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය.' "

(2) "2 වන පිටුවේ, 1 වන පේළියේ සිට 11 වන පේළිය දක්වා වූ පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:

'අර්ථ නිරූපණය

22. බැංකුව යන්නෙන් 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව සඳහන් වී ඇති දැනටත් පරාටේ බලය ඇති යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් අදහස් වේ.' "

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman )

Yes, Hon. John Amaratunga.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

We have not got that Amendment.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

It has been distributed.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

I do not think any of us have got that Amendment. [*Interruption.*] I am sorry, others have received it. But, I did not receive it.

Sir, we have also given notice for our Amendment.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

Amendment to which Clause?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Clause 2. 5A.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman)

Hon. John Amaratunga, you can move your amendment now.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

Under Clause 2, are you moving an amendment to 5A?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Yes.

Under Clause 2. 5A, I move,

"(1) Amend the proposed Section 5A by deleting the words 5 million and substituting there for the words fifty million in subsections (1) and (2) thereof.

(2) Add another proviso at the end of the provisio in Section 5A of the amendment to read as follows:

'Provided also that these provisions shall apply to all pending and or proposed actions by any Bank'."

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman )

So, those are the two Amendments that you are proposing?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Yes.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

We are not prepared to accept those Amendments.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

If you are not accepting, then we are against this; we have to vote against this.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

එම විරුද්ධත්වය සටහන් කර ගන්නවා.

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*2 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2, as amended, ordered to stand part of the Bill.*

***3 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*3 ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 3, ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendment.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

Sir, any typographical errors will be corrected by the Legal Draftsman.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Third Reading. Hon. Minister-

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන් වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Item No. 2. Regulation of Insurance Industry (Amendment) Bill. We have to start the Committee stage.

## රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත
## காப்புறுதித் தொழிலை ஒழுங்குபடுத்தல் (திருத்தம்) சட்டமூலம்
## REGULATION OF INSURANCE INDUSTRY (AMENDMENT) BILL

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." [ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament."* - *[The Hon. Nimal Siripala de Silva.]*

***කාරක සභාවේදී සලකා බලන ලදී.***
***[නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
[MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *in the Chair.]*

***1 සිට 4 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 4.ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 4 ordered to stand part of the Bill.*

### 5 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම)
### வாசகம் 5.- (முதன்மைச் சட்டவாக்கத்தின் 12 ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 5.- (*Amendment of section 12 of the principal enactment.)*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"2 වන පිටුවේ, 13 සිට 17 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

'(1අ) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මඟින් පිහිටුවන ලද ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට,-

(අ) ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරය කරගෙන යෑම සඳහා මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද තැනැත්තෙකු ලෙස; සහ

(ආ) රක්ෂණ ව්‍යාපාරය කරගෙන යෑම සඳහා මේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරන ලද රක්ෂකයෙකු ලෙස සැලකිය යුතු ය.

(2) එහි (2) වන උපවගන්තියේ 'දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා හෝ සාමාන්‍ය හා දීර්ඝ කාලීන යන දෙවර්ගයේම රක්ෂණ ව්‍යාපාර සඳහා' යන වචන වෙනුවට 'දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා' යන වචන ආදේශ කිරීමෙන්;

(3) එහි (3) වන උපවගන්තියේ '1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත මඟින් පිහිටුවන ලද සමාජ ආරක්ෂණ මණ්ඩලය සහ 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මඟින් පිහිටුවන ලද ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය' යන වචන සහ ඉලක්කම් වෙනුවට 'සහ 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද සමාජ ආරක්ෂණ මණ්ඩලය.' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*5 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 5, as amended, ordered to stand part of the Bill.*

***6 වන සහ 7 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*6 ஆம் 7.ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 6 and 7 ordered to stand part of the Bill.*

### 8 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට 15අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම)
### வாசகம் 8.- (முதன்மைச் சட்டவாக்கத்தின் 15அ என்னும் புதிய பிரிவை உட்புகுத்துதல்)
CLAUSE 8.- (*Insertion of new section $15_A$ in the principal enactment.*)

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"3 වන පිටුවේ, 16 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමෙන් වසර තුනක' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***8 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*8 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 8, as amended, ordered to stand part of the Bill.*

***9 සිට 27 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*9 ஆம் வாசகத்திலிருந்து 27ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 9 to 27 ordered to stand part of the Bill.*

## 28 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය සංශෝධනය කිරීම)

## வாசகம் 28.-( முதன்மைச் சட்டவாக்கத்தின் 84 ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 28.- (*Amendment of section 84 of the principal enactment.*)

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"13 වන පිටුවේ, 28 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ආ) තැරැව්කරු මණ්ඩලය විසින් මේ පනත යටතේ නිකුත්" "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***28 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*28 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 28, as amended, ordered to stand part of the Bill.*

***29 සිට 37 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*29 ஆம் வாசகத்திலிருந்து 37ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 29 to 37 ordered to stand part of the Bill.*

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

There is an Amendment to Clause 38 to be moved by the Hon. Eran Wickramaratne.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

He is not here. But, may I -

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

No, you cannot. It should be moved by the Member who gave notice.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

But, give him an opportunity.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

A Member can move an amendment. There is nothing to prevent a Member moving an amendment. But, we do not accept these amendments. That is all.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

There is a clarification, Sir. I only have the English version. On page 3, line 16, there was an amendment to Clause 8, but there is no change. The amendment states, I quote:

"three years of being issued with a licence under..."

So, it reads, I quote:

"Every insurer shall be required within three years of being issued with a licence under section 15 of this Act, to have itself listed on a licensed stock exchange."

But, is there not a contradiction with Clause 51, line 17?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

No.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

But, amendment to Clause 51 states that you need to list it in five years. [*Interruption.*] So, in one place, it states that you need to list it in three years and in another place it states that you need to list it in five years.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

So, we will make both as three years.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

No, Sir, we have to make it five years; not three years.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

No, no.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

That is the amendment you proposed in Clause 51.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
In which Clause is the amendment is proposed as five years?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, in your own amendment to Clause 51 on page 26, you proposed five years. I hope I am not mistaken. I am just reading out what I see here. So, please clarify this.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
What is the amendment that you are referring to?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
I am reading from page 2 of the amendments. It states, I quote:

"Page 26, Clause 51 - delete lines 17 to 20 (both inclusive) and substitute the following:-.."

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
Hon. Member, three years for new companies and five years for existing companies for listing.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Okay.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
So, that is the clarification.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Okay. Then, to Clause 52, what we suggested, Sir, is -

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
No. We have not yet come to Clause 52.

***38 සිට 45 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*38ஆம் வாசகத்திலிருந்து 45ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 38 to 45 ordered to stand part of the Bill.*

## 46 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 114 වන වගන්තිය සංශෝධනය කිරීම)
## வாசகம் 46. - (முதன்மைச் சட்டவாக்கத்தின் 114 ஆம் பிரிவைத் திருத்துதல்)
## CLAUSE 46. - *(Amendment of section 114 of the principal enactment.)*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "25 වන පිටුවේ, 21 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'රක්ෂණකරුවකු' යන යෙදුමේ අර්ථ නිරූපණයේ 'ලියාපදිංචි කරන ලද සමාගමක්' යන වචන වෙනුවට 'ලියාපදිංචි කරන ලද තැනැත්තකු' යන වචන ආදේශ කරන්න.";

(2) "26 වන පිටුවේ, 8 සිට 13 දක්වා පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ලෙස ලියාපදිංචි වී ඇති තැනැත්තෙකු අදහස් වේ.' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***46 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*46ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 46, as amended, ordered to stand part of the Bill.*

***47 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*47ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 47, ordered to stand part of the Bill.*

## 48 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් උපලේඛනයක් එකතු කිරීම)
## வாசகம் 48. - (முதன்மைச் சட்டவாக்கத்திற்குப் புதிய அட்டவணையொன்றைச் சேர்த்தல்)
## CLAUSE 48. - *(Addition of new Schedule to the principal enactment.)*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"27 වන පිටුවේ, 6 සහ 7 වන පේළි ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරයකු වීම සඳහා ඇති නුසුදුසුකම්' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***48 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*48ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 48, as amended, ordered to stand part of the Bill.*

***49 සහ 50 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*49ஆம் 50ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 49 and 50, ordered to stand part of the Bill.*

## 51 වන වගන්තිය. - (බලපත්‍ර දරන රක්ෂණකරුවන් බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කිරීම)
## வாசகம் 51. - (உரிமம் ஒன்றை வைத்திருக்கும் காப்புறுதியாளர்கள் உரிமமளிக்கப்பட்ட பங்குத்தொகுதிப் பரிவர்த்தனையொன்றில் நிரற்படுத்தப்படுதல்)
CLAUSE 51. - *(Insurers holding a licence to be listed on a licensed stock exchange.)*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"29 වන පිටුවේ, 6 සිට 10 දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'සෑම රක්ෂණකරුවකු විසින්ම, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් වසර පහක කාලයක් ඇතුළත අවශ්‍ය අවස්ථාවන්හි දී මේ පනතේ 52 වන වගන්තියේ නිශ්චිතව සඳහන් කොට ඇති වෙන් කිරීමේ අවශ්‍යතාවය සපුරාලීමෙන් පසු 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයකින් ලැයිස්තුගත කරනු ලැබිය යුතු බවට නියම කරනු ලැබිය යුතු ය.;' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***51 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*51ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 51, as amended, ordered to stand part of the Bill.*

## 52 වන වගන්තිය.- (රක්ෂණකරුවන් විසින් ඔවුන්ගේ දීර්ඝකාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වෙන් වෙන් වශයෙන් පවත්වාගෙන යා යුතු බව)
## வாசகம் 52. - (காப்புறுதியாளர்கள் தங்களது நீண்டகால மற்றும் பொதுக் காப்புறுதித் தொழிலை பிரித்துவிடல்)
CLAUSE 52. - *(Insurers to segregate their long term and general insurance business.)*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"29 වන පිටුවේ, (1) 22 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:-

'යටතේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වලංගු';

(2) 25 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් වසර හතරක කාලයක්';

(3) 27 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'රක්ෂණ ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය, වෙන් වෙන්' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***52 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*52ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 52, as amended, ordered to stand part of the Bill.*

## 34 වන අලුත් වගන්තිය .- (ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වගන්තිය සංශෝධනය කිරීම)
## புதிய வாசகம் 34. - (முதன்மைச் சட்டவாக்கத்தின் 90ஆம் பிரிவைத் திருத்துதல்)
NEW CLAUSE 34. - *(Amendment of section 90 of the principal enactment.)*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"21 වන පිටුවේ, 5 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න.

'ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වගන්තිය සංශෝධනය කිරීම

34. ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය එහි "සමාගමක්" යන වචනය වෙනුවට ඒ වචනය යෙදෙන සෑම ස්ථානයකම තැනැත්තෙකු' යන වචනය ආදේශ කිරීමෙන්.' "

***ඉදිරිපත් කරන ලදින්, පළමු වන වර කියවන ලදී.***

*கொண்டுவரப்பட்டு முதன்முறை மதிப்பிடப்பட்டது.*

*Brought up, and read the First time*

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Member, do you need any clarification?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Yes. Sir, for Clause 52, we requested that this be applied either for new companies, not retroactively or make it six years. That was our request.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
No, the Government is not prepared to accept that amendment.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
So, are you not prepared to accept six years?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
We have made it four years.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
So, at least let us meet in the middle, Sir.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
That is why we have made it four years.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Let us make it five years.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
No, it is four years.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, for existing companies, you gave five years to list. So, why do you not give the same five years to break up the companies?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
The Debate is over. The Hon. Member cannot debate now.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
No, not a Debate.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Member, this is not a Debate. Please sit down.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
The Hon. Minister is saying that this amendment is not accepted.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
I move,

"That the Clause be read a Second time."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***34 වන අලුත් වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යැයි නියෝග කරන ලදී.***
*வாசகம் சட்டமூலத்தில் சேர்க்கப்பட வேண்டுமென வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*புதிய வாசகம் 34, சட்ட மூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Question, that the Clause be added to the Bill, put, and agreed to.*
*New Clause 34, ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව, වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendment.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
Minor corrections such as typographical errors will be corrected by the Legal Draftsman.

I move,

"That the Bill, as amended, be now read the Third time."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන් වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

# කල්තැබීම
# ஒத்திவைப்பு
# ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The Adjournment Motion is to be moved by the Hon. Shantha Bandara. Before that, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

I propose the Hon. Alhaj A.H.M. Azwer to now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්,***
***ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே,*
*மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

# සමෘද්ධි සංවර්ධන නිලධාරින් සඳහා විශ්‍රාම වැටුප්
# சமுர்த்தி அபிவிருத்தி உத்தியோகத்தர் களுக்கான ஓய்வூதியம்
# PENSION FOR SAMURDHI DEVELOPMENT OFFICERS

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අප රටින් දුප්පත්කම තුරන් කිරීමේ අරමුණ ඇතිව සමෘද්ධි වැඩසටහන ආරම්භ කර ඇත. එමඟින් අඩු ආදායම්ලාභී පවුල් සවිබල ගැන්වීම කරනු ලබයි. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ මෙහෙයවීම මත සමෘද්ධි අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරන වැඩසටහන්වලට ජනතාවගෙන්ද විශාල ප්‍රසාදයක් ඇත. මෙම කාර්යයන් ගමේ ජනතාව හා බද්ධ වී ඉටු කරනු ලබන්නේ සමෘද්ධි සංවර්ධන නිලධාරින් විසිනි. ඔවුන් රජයේ අරමුණ සඵල කර ගැනීමට සුවිසල් දායකත්වයක් ලබා දේ. එහෙත් ඔවුන්ගේ අනාගත සුරක්ෂිතභාවය පිළිබඳ ගැටලු පවතී. ඒ අතර විශ්‍රාම වැටුප ප්‍රධාන ගැටලුවකි. එබැවින් අප රටේ සමෘද්ධි සංවර්ධන නිලධාරින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් ක්‍රමයක් කඩිනමින් අරඹන ලෙසට ගරු සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙරටින් දුප්පත්කම තුරන් කිරීමේ අරමුණ ඇතිව අඩු ආදායම්ලාභී පවුල් සවිබල ගන්වා, රටේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව 1995 වර්ෂයේදී සමෘද්ධි වැඩ පිළිවෙළ ආරම්භ කළ බව අපි දන්නවා. මුලින්ම ඒ ඒ ප්‍රදේශවල ඉන්න දක්ෂ නිර්මාණශීලී තරුණ තරුණියන්ට තමයි සමෘද්ධි වැඩ පිළිවෙළ සඳහා ආරාධනා කළේ. මුලින්ම වැටුපක් නොගෙවූ නිසා සමහර අය ප්‍රතික්ෂේප කරද්දි ගමේ නායකත්වය ගෙන කටයුතු කළ අය, ක්‍රීඩා සමාජවල, යෞවන සමාජවල නායකත්වය ගෙන කටයුතු කළ අය ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් වෙලා මේ සඳහා කටයුතු කළා. ඉන් පසුව ඔවුන්ට රජය මඟින් රුපියල් 2,000ක දීමනාවක් ලබා දෙමින් ගමේ ජනතාවත් එක්ක රජයේ අරමුණු සඵල කරමින් සමෘද්ධි නිලධාරින් පියවරෙන් පියවර ඉදිරියට ගමන් කළා. ඉතිහාසයේ ඉඳලා අපට පළපුරුද්ද තිබුණේ, අපි අත් දැකීම් ලබා ගෙන තිබුණේ අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් නැත්නම් දුප්පත් ජනතාව වෙනුවෙන් කූපන් ක්‍රම ක්‍රියාත්මක කිරීම ගැනයි. 1994 ආණ්ඩුව බිහි කරන්න කැප වුණු තරුණයන් හැටියට අපි කල්පනා කළේ මේක තවත් කූපන් ක්‍රමයක් විතරක් වෙයි කියායි. නමුත් වසර කිහිපයක් ඉදිරියට ගමන් කරන කොට අඩු ආදායම්ලාභී පවුල් නඟා සිටුවීම සඳහා ආසියාකරයේම තිබෙන දැවැන්ත ශක්තිමත් වැඩ පිළිවෙළ සමෘද්ධි වැඩ පිළිවෙළයි කියා අපි සියලු දෙනාම තේරුම් ගෙන තිබෙනවා. එදා හිටපු අඩු ආදායම්ලාභී පවුල් ප්‍රමාණය අද වන විට විශාල වශයෙන් අඩු වෙලා තිබෙනවා. ඔවුන් සවිබල ගැන්විලා තිබෙනවා. සමෘද්ධි වැඩ පිළිවෙළ මඟින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවලා තිබෙනවා. ඒ නිසා මේ වැඩ පිළිවෙළ ඉතාම සාර්ථක වැඩ පිළිවෙළක්. විශේෂයෙන්ම සමෘද්ධි සංවර්ධන නිලධාරින් විසින් ගමේ ජනතාවට කූපන් ටික බෙදා දෙනු ලබනවා. ඒ සහනාධාර ක්‍රම ඇරෙන්න අද විශාල වැඩ පිළිවෙළ රාශියක් ක්‍රියාත්මක කරනවා. ඊට උදාහරණයක් මතක් කරන්න ඕනෑ. අද යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ගමේ ජනතාව වෙනුවෙන් අපේ රජයෙන් ලබා දෙන්නේ ඉතාම සුළු මුදලක්. එය උපයෝගි කර ගෙන ශ්‍රම පදනම ඒක රාශි කරලා ගමේ ජනතාවත් එක්ක විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම තුළින් අපේ ජාතික ආර්ථිකයට විශාල ශක්තියක් එකතු කරන්න සමෘද්ධි නිලධාරින් කටයුතු කරනවා. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමාගේ, අපේ රජයේ විශේෂ වැඩ පිළිවෙළක් අනුව ක්‍රියාත්මක කරනු ලබන ජීවනෝපාය සංවර්ධන වැඩ පිළිවෙළ ඉතාම ආකර්ෂණීය, ඒ වාගේම ජනතාව විසින් ඇද බැඳ ගනු ලැබූ වැඩසටහනක් බවට පත් වෙලා තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගමේ අයට දක්ෂතාව තිබෙනවා; නිර්මාණශීලී හැකියාව තිබෙනවා. නමුත් ඔවුන්ට වියදම් කරන්න, ඒ සඳහා වැය බරක් දරන්න හැකියාව නැතිකම නිසා ඔවුන්ගේ දක්ෂතාව හැංගිලා තිබෙනවා. ඒ නිසා ඒ දක්ෂතාව තිබෙන අය ගමෙන් එළියට අරගෙන, ඔවුන්ට රජයේ දායකත්වයත් ලබා දීලා, විවිධ ජීවනෝපායන් සඳහා අවශ්‍ය උපකරණ පවා ලබා දෙමින් ඔවුන් ස්වයං රැකියාවලට යොමු කරන්න, ඒ වාගේම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් බවට පත් කරන්න අද සමෘද්ධි වැඩ පිළිවෙළ කටයුතු කිරීම අප විශේෂයෙන්ම අගය කරන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රණ විරු පවුල්වලට නිවාස ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ, ඒ වාගේම අපේ රටේ ඉන්න නිවාස නැති වැන්දඹුවන් වෙනුවෙන්, එනම් ස්වාමිපුරුෂයා අහිමි වෙලා අහිංසක තත්ත්වයට පත් වෙච්ච කාන්තාවන් වෙනුවෙන්, විශේෂයෙන්ම ස්ථිර නිවසක් නැති නිසා ආරක්ෂාවක් නැතිව ජීවත් වන ගැහැනු දරුවන් ඉන්න මව්වරුන්

වෙනුවෙන් මූලිකත්වය ලබා දීමේ පදනම මත "දිරිය පියස" නිවාස වැඩ පිළිවෙළ අද අපේ රට තුළ ක්‍රියාත්මක කරන්නේ සමෘද්ධි වැඩ පිළිවෙළ හරහා. ඒ මඟින් මේ වන කොට නිවාස 20,000කට වඩා වැඩි ප්‍රමාණයක වැඩ අවසන් කරලා තිබෙනවා. රජයෙන් රුපියල් ලක්ෂයක මුදලක් ලබා දෙන කොට සමෘද්ධි සංවර්ධන නිලධාරිතුමාගේ නායකත්වයෙන්, ගමේ සියලුම දෙනා ඒක රාශි කර ගෙන, සියලු සම්පත් උපයෝගී කර ගෙන නිවාස ගොඩ නඟා දීලා, ඒ වෙනුවෙන් තෝරා ගත්තු පවුල්වලට ඒ නිවාසවල සුරක්ෂිතව ඉන්න අවශ්‍ය වැඩ පිළිවෙළ නිර්මාණය කරලා දෙන්නේත් සමෘද්ධි වැඩ පිළිවෙළ හරහා බව අප ඉතාම ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද "සිප් දොර" ශිෂ්‍යත්ව වැඩසටහනද ක්‍රියාත්මක වනවා. සාමාන්‍ය පෙළ ඉතාම ඉහළින් සමත් වුණාට මුල්‍ය ශක්තිය නැතිකම නිසා සහ ඊට අවශ්‍ය මූලික පදනමක් නැතිකම නිසා උසස් පෙළ අධ්‍යාපනය හරියට ලබා ගන්න, උසස් පෙළ විභාගයට අවශ්‍ය කටයුතු කර ගන්න බැරි අපහසුතා අපේ දරුවන්ට ඇති වනවා.

අන්න ඒ අවස්ථාවලදී ගම්වල අඩු ආදායම්ලාභී පවුල්වල ඉන්න එවැනි දරුවන් තෝරා ගෙන ඔවුන්ට "සිප් දොර" ශිෂ්‍යත්වය ලබා දීලා මාසයකට රුපියල් 500ක දීමනාවක් ලබා දෙන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා. එය ක්‍රියාත්මක කරන්නේත් සමෘද්ධි සංවර්ධන නිලධාරින් හරහා. සමාජ සංවර්ධන වැඩ පිළිවෙළ සමෘද්ධි ව්‍යාපාරය මඟින් ක්‍රියාත්මක කරන එක අප අගය කරන්න ඕනෑ. ඒ හරහා මත් ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්, දුම් වැටි විරෝධී වැඩසටහන්, ළමා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වනවා. විශේෂයෙන්ම සමෘද්ධි ව්‍යාපාරය මඟින් ක්‍රියාත්මක වන කුඩා කණ්ඩායම් වැඩ පිළිවෙළ ඉතාම සාර්ථක බව මා මේ සභාවට ඉදිරිපත් කරන්න ඕනෑ. පවුල් පහේ කුඩා කණ්ඩායම් හදලා ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා චක්‍රීය ණය වැඩසටහන් පහක් ක්‍රියාත්මක කරමින් ඔවුන් සවිබල ගැන්වීම පිණිස විශේෂ ක්‍රියාවලියක් කරනවා. ඒ විතරක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැදගත්ම කාර්යය තමයි ඉතුරුම් වැඩ පිළිවෙළ. අද සමෘද්ධි බැංකු ඉතාම ශක්තිමත් බැංකු බවට පත් වෙලා තිබෙනවා. ඒ ශක්තිමත් බැංකුවල තිබෙන මුදල් අඩු ආදායම්ලාභී පවුල්වල මුදල්. එදා සමෘද්ධි වැඩ පිළිවෙළ ආරම්භ කරද්දී රුපියල් 100ක්වත් බැංකු පොතක තිබුණේ නැති ඒ අහිංසක පවුල් වෙනුවෙන් අද රුපියල් ලක්ෂයේ සිට රුපියල් ලක්ෂ 10 දක්වා මුදල් මේ වැඩ පිළිවෙළ හරහා ඉතිරි වෙලා තිබෙනවා කියන එක ඉතාම ගෞරවයෙන් මේ සභාවට මතක් කරන්න කැමැතියි.

අද "ගම නැඟුම" සමෘද්ධි ගම්මාන වැඩසටහන ඉතාම සාර්ථකව ඉදිරියට ගෙන යනවා. ඒ වාගේම ආධ්‍යාත්මික වැඩසටහන් ඉතාම සාර්ථකව ඉදිරියට ගෙන යනවා සමෘද්ධි වැඩ පිළිවෙළ හරහා. ඒ සියල්ල සඳහා ගමේ ජනතාව පෙළ ගස්වන්නේ අපේ සමෘද්ධි සංවර්ධන නිලධාරින් සහ සමෘද්ධි කළමනාකරුවන්. නමුත් මේ සභාවට මා මතක් කරන්න ඕනෑ, අද රජයේ සාමාන්‍ය නිලධාරින්ට, ජාතික ආර්ථිකයට මීට වඩා අඩු දායකත්වයක් දෙන නිලධාරින්ට වඩා අඩු පහසුකම් තමයි සමෘද්ධි ක්ෂේත්‍රයේ නිලධාරින්ට ලැබෙන්නේ කියන කාරණය. ඒ පිළිබඳව අප විශේෂ අවධානය යොමු කරන්න අවශ්‍ය වෙලා තිබෙනවා. මෙවැනි අඩු පාඩුකම් රාශියක් මැද්දේ තමයි ඔවුන් අද කටයුතු කර ගෙන යන්නේ. අද ඒ නිලධාරින්ට ඔවුන්ගේ සේවා කාලය අවසන් කරලා හිස් අතින් ගෙදර යන්න සිද්ධ වෙලා තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. උදාහරණයක් ගනිමු. අද සමෘද්ධි කළමනාකාරවරුන් හැටියට කටයුතු කරන්නේ උපාධිධාරින්. නමුත් ඒ උපාධිධාරින්ට අද රාජ්‍ය පරිපාලන සේවයට එන්න විධියක් නැහැ. ඒ සඳහා ක්‍රමවේදයක් සකස් වෙලා නැහැ. ඒ වාගේම ඔවුන්ගේ වැටුප්වල විශාල විෂමතා රාශියක් තිබෙනවා.

අපේ රට තුළ උපාධිය ලබා ගත් දක්ෂ සමෘද්ධි කළමනාකරුවන් 2,200ක් විතර සිටින බව අපි දන්නවා. ඔවුන්ගේ අඩු පාඩුකම් පිළිබඳව සොයා බැලීම අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ වාගේම අපේ රටේ සමෘද්ධි සංවර්ධන නිලධාරින් 23,000ක් ඉන්නවා. සේවය අවසන් කළාට පස්සේ ඒ 23,000ටම ගෙදර යන්න වන්නේ හිස් අතින්. ඒ නිසා ඒක අපි ඉතා සංවේදීව බලන්න ඕනෑ කාරණයක්. එදා අපි යෞවන සමාජවලින්, ක්‍රීඩා සමාජවලින් දක්ෂයන් හැටියට තෝරා ගෙන බඳවා ගත් ඒ නිර්මාණශීලී තරුණයන් හිස් අතින් ගෙදර යැවීම සුදුසු නැහැ.

මේ වන විට වෙනත් වසම් ආවරණය කරන ග්‍රාම නිලධාරින්ට නම් වෙනම දීමනාවක් දෙනවා. නමුත් වෙනම වසම් ආවරණය කරනවාට අද සමෘද්ධි නිලධාරින්ට දීමනාවක් ලැබෙන්නේ නැහැ. ඒ වාගේම කාර්යාල දීමනාව ගැනත් කියන්න ඕනෑ. ඉස්සර සමෘද්ධි සංවර්ධන නිලධාරින් සේවය කළේ තමන් පදිංචි ගමේමයි. නමුත් අද ඒ අය වෙනත් වසම්වල සේවය කළ යුතුව තිබෙනවා. ඒ පිළිබඳව චක්‍රලේඛ නිකුත් වෙලා තිබෙනවා. වෙනත් වසම්වල කාර්යාල කටයුතු කළාට මේ වන තෙක් ඔවුන්ට කාර්යාල දීමනාවක් ලැබෙන්නේ නැහැ.

ඒ වාගේම ඔවුන්ට තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි විශ්‍රාම වැටුප නැතිකම. මම හිතන විධියට මේ අය වෙනුවෙන් විශ්‍රාම වැටුප් ක්‍රමයක් ආරම්භ කිරීම පිළිබඳව විශේෂයෙන්ම අපේ අතිගරු ජනාධිපතිතුමාත් අවධානය යොමු කරලා තිබෙනවා. මේ පිළිබඳව අපි විටින් විට සාකච්ඡා කරලා තිබෙනවා.

ඒ නිසා සමෘද්ධි කළමනාකරුවන්ට සහ සමෘද්ධි සංවර්ධන නිලධාරින්ට මතු වෙලා තිබෙන ගැටලු නිරාකරණය කරන්නට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මැදිහත් වෙයි කියන ලොකු විශ්වාසයක් තිබෙනවා. මොකද, ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාත්, අපේ නියෝජ්‍ය අමාත්‍යතුමන්ලා ඇතුළු සියලු දෙනාත් මේ වන විට ඒ ගැන අවධානය යොමු කරලා තිබෙන නිසා. මෙම නිලධාරින් ඇතුළත් සමෘද්ධි අධිකාරිය දෙපාර්තමේන්තුවකට අනුයුක්ත කර හෝ අන්තර්ග්‍රහණය කර හෝ මෙම නිලධාරින්ට රාජ්‍ය සේවයේ පූර්ණ විශ්‍රාම වැටුප ලබා දීමට පියවර ගන්නා ලෙස ඉතාම ගෞරවයෙන් යුතුව මේ ගරු සභාවට යෝජනා කර සිටිනවා.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ මෙම ගරු සභාවට ඉදිරිපත් කළ යෝජනාව අපි සියලු දෙනාම ඉතාම අගය කරන යෝජනාවක්. අපි තමුන්නාන්සේලා සියලු දෙනාටම මතකයි, 1994ට කලින් පැවති එක්සත් ජාතික පක්ෂ රජය සමයේ -ඒ අවුරුදු 17ක පාලන කාලයේ දී- මේ රටේ තරුණ ප්‍රශ්නවලට ඇහුම් කන් දෙන්නේ නැතිව අතිවිශාල තරුණ සංහාරයක් සිද්ධ වුණ බව. 1989 කාලයේ දී විශේෂයෙන්ම රට පාලනය කළ එක්සත් ජාතික පක්ෂයත්, ඒ සිද්ධියට මුල් වුණු ජනතා විමුක්ති පෙරමුණත් සම සම විධියට අතිදැවැන්ත තරුණ සංහාරයක් සිද්ධ කළා. ඒ තරුණ සංහාරයත් එක්ක 60,000ක විතර තරුණ තරුණියන්ට ජීවිත පූජා කරන්න සිද්ධ වුණා. ඒකත් එක්ක තමයි තරුණ තරුණියන්ගේ අසහනය නැති කරන්නට, ඉගෙන ගත්ත තරුණ තරුණියන්ට යම් කිසි ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒක විසඳන්න ඕනෑ කියන මතය රට පුරා ශීඝ්‍රයෙන් පැතිරෙන්නට පටන් ගත්තේ. ඒකත් එක්ක, තමයි ලොකු බලයක් එක්ක තමයි 1994 දී පොදු ජන එක්සත් පෙරමුණු රජය බිහි වුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොදු

[ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා]

ජන එක්සත් පෙරමුණු රජය බිහි වුණාට පසුව පළමුවැනි අදහස වුණේ, මේ ඉගෙන ගත් තරුණ පිරිස රටේ සංවර්ධනයට දායක කර ගන්නට යම් කිසි අත්වැලක් වන්නට ඕනෑ කියන එකයි. ඒ අදහස පෙරදැරි කර ගෙන තමයි ඒ වෙලාවේ සමෘද්ධි ව්‍යාපාරය හරහා සමෘද්ධි නිලධාරින් හැටියට මේ පිරිසත්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර කියන පිරිසත් බඳවා ගත්තේ. ගම්වල හිටපු ඉගෙන ගත්ත පිරිස රටේ සංවර්ධනයට දායක කර ගන්න, කෘෂි කර්මාන්තයට, ධීවර කර්මාන්තයට, සංචාරක ව්‍යාපාරයට වාගේ රටේ ආර්ථිකයට ශක්තියක් දෙන අංශවලට දායක කර ගන්න තමයි ඒ අවස්ථාව ලබා දුන්නේ. ඒ අවස්ථාව ලබා දුන්න කෘෂිකර්ම නිලධාරින්ට අද වන විට දෙපාර්තමේන්තු මට්ටමින් විශ්‍රාම වැටුප ලැබෙනවා. ග්‍රාමීය මට්ටමින් අද ඒ අය රටට ලබා දෙන දායකත්වය ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා පැහැදිලි කළා. ජනතාවගේ දිළිඳුකම තුරන් කරන්න, ආර්ථිකය ශක්තිමත් කරන්න, පවුල් ඒකක ගොඩ නඟන්නට, ගම නැඟුම, ජාතික සවිය, මඟ නැඟුම, ආදී ග්‍රාමීය වශයෙන් සංවර්ධනය කරන්න ගෙන තිබෙන විවිධ වූ වැඩසටහන් ගැන එතුමා පැහැදිලි කළා. ඒ හරහා මේ සමෘද්ධි සංවර්ධන නිලධාරින් දැවැන්ත සහයෝගයක් ලබා දෙනවා. ඒ වෙලාවේ අවුරුදු 25ක් වූ සමෘද්ධි සංවර්ධන නිලධාරියෙක් අද වන විට අවුරුදු 40 සීමාවට ඇවිල්ලා. තමුන්නාන්සේ දන්නවා ඔවුන් තව අවුරුදු 10ක් යන කොට විශ්‍රාම වැටුප ලබා ගන්නා වයස් සීමාවට එන බව. අද ඒ අයගේ දරුවන් මූලික අධ්‍යාපනය ලබලා උසස් අධ්‍යාපන කටයුතු කරන්න බලා ගෙන ඉන්නවා. එහෙම අය ඉන්නවා. රැකී රක්ෂාවලට යන්න බලා ගෙන ඉන්න අය ඉන්නවා. එහෙම බලද්දී ඒ අයගේ පවුල්වල ආර්ථික වශයෙන් ලොකු ප්‍රශ්න තිබෙනවා. ඊ ළඟට ගත්තාම ඒ සමෘද්ධි සංවර්ධන නිලධාරින් එක එක වසම්වල වැඩ කරද්දී ඒ අයට සේවා දුෂ්කරතා ඇති වනවා. නමුත් ඒ සේවය සඳහා දුෂ්කර දීමනා කිසිවක් ඔවුන්ට හම්බ වන්නේ නැහැ. අතිගරු ජනාධිපතිතුමා හැම අංශයක් කෙරෙහිම අවධානය යොමු කරපු නායකයකු නිසා අපට ඉතා ප්‍රබල විශ්වාසයක් තිබෙනවා, ජාතික ආර්ථිකයට දැවැන්ත ශක්තියක් දෙන මේ පිරිසට විශ්‍රාම වැටුප ලබා දෙන්නට එතුමාගේ මූලිකත්වයෙන් අපේ රජයක් තුළ කටයුතු කරන්න පුළුවන් වෙයි කියලා. එහිදී ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා හැටියට බැසිල් රාජපක්ෂ මැතිතුමාට විශාල වැඩ කොටසක් පැවරෙනවා. දැන් මෙතැන හිස් සභාවක් තිබුණත්, අපේ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා මෙතැන රැඳී සිටින නිසා වටිනාකමක් තිබෙනවා කියලා මම හිතනවා. මේ පණිවුඩය අරගෙන ගිහිල්ලා, සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ ජීවිත ශක්තිමත් කරන්න ඒ දෙන්න පුළුවන් ශක්තිය ලබා දීලා, විශේෂයෙන්ම ඒ අයට ලබා දෙන්න යෝජනා කරපු විශ්‍රාම වැටුප ලබා දීලා, ඔවුන් කරපු රාජ්‍ය සේවයට, ඔවුන් කරපු ජනතා සේවයට යම් කිසි අස්වැසිල්ලක් ලබා දෙයි කියලා අපි බලාපොරොත්තුව වනවා. ඒක කියමින් මම මේ යෝජනාව ස්ථිර කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. මේ යෝජනාව වෙනුවෙන් කථා කරන්න විරුද්ධ පක්ෂයේ යම් මන්ත්‍රීවරයෙකු සිටීද? නැත. එහෙම නම් ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාට පිළිතුරු කථාව කරන්න අවස්ථාව දෙනවා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා ඉතා වැදගත් යෝජනාවක් ඉදිරිපත් කළා. අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා එය ස්ථිර කළා.

විශේෂයෙන්ම අපේ රජයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ සමෘද්ධි ව්‍යාපාරය ක්‍රියාත්මක වන නිසා අපට වග කීමක් තිබෙනවා, එතුමන්ලා සඳහන් කළ පරිදිම මේ ව්‍යාපාරය ශක්තිමත්ව ගෙන යන පදනම වන සමෘද්ධි සංවර්ධන නිලධාරින්ට මේ පහසුකම් ටික ලබා දීමට. විශේෂයෙන්ම තරුණයන්, ස්ත්‍රීන් ඒ වාගේම අවාසි සහගත සමාජ මට්ටමේ හිටපු පිරිස්වල ආදායම් මාර්ග වැඩි කිරීම සඳහාත්, සමාජයේ ස්ථාවරය ප්‍රවර්ධනය කිරීම සඳහාත්, දුගී දුප්පත් බව තුරන් කිරීම සඳහාත් 1995 වර්ෂයේදී මෙම සමෘද්ධි සංවර්ධන ව්‍යාපාරය ආරම්භ කළා. ලංකාවේ සමෘද්ධි ව්‍යාපාරයේ 26,000ක් සේවයේ යෙදී ඉන්නවා. ඒ 26,000න් 23,000ක් සමෘද්ධි සංවර්ධන නිලධාරින්. බැංකු කළමනාකරුවන්, විගණක ක්ෂේත්‍රයේ ලිපිකරුවන් ඇතුළු අනිකුත් නිලධාරින් ගත්තාම මේ ව්‍යාපාරය තුළ මුළු සේවක සංඛ්‍යාව 26,000ක් වනවා. අද මේ රටේ ඉතාම ශක්තිමත් ව්‍යාපාරයක් හැටියට සමෘද්ධි ව්‍යාපාරය පවතිනවා. සමෘද්ධි බැංකු 1,067ක රුපියල් මිලියන 45,000ක් ජනතාව ඉතුරු කරලා තිබෙනවා. ඒ සඳහා සම්පූර්ණ ශක්තිය ලබා දුන්නේ සමෘද්ධි සංවර්ධන නිලධාරින්. ඒ නිසා මේ සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ රැකියාවේ ස්ථිරභාවය පිළිබඳ වගකීම අපි හොඳට තේරුම් අරගෙන ඉන්නවා. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමා එතුමාගේ අය වැය කථාවේ 29 වන පිටුවේ ඉතාම පැහැදිලිව සඳහන් කර තිබෙනවා, "සංවර්ධන ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා රාජ්‍ය සේවය තව දුරටත් ශක්තිමත් කළ යුතු බව මා විසින් අය වැයට පෙර පැවැත්වූ සාකච්ඡාවලදී තහවුරු වූ බැවින් රාජ්‍ය සේවය ශක්තිමත් කිරීමට මම හැකි සියලු පියවර ගන්නවා." කියලා. දීර්ඝ කාලයක් තිස්සේ අනෙකුත් අයට තිබෙන පහසුකම් මේ අයට නැහැ කියන මතයක් ඒ අය තුළ තිබුණා. නමුත් අනෙක් සියලුම සේවකයන්ට දෙනවා වාගේම සමෘද්ධි නිලධාරින් සඳහාත් උත්සව අත්තිකාරම් මුදල අපි ලබා දෙනවා. චක්‍රීය අරමුදලක් යටතේ ආපදා ණය අපි ලබා දෙනවා. ඒ වාගේම 2000 වර්ෂයේ ඉඳලා සියයට 9ක පොලී ප්‍රතිශතයක් යටතේ සේවකයන් 17,500කට පමණ රුපියල් 50,000 පාරිභෝගික ණය ලබා දීලා තිබෙනවා. ඒ වාගේම සියයට 10 පොලිය යටතේ රුපියල් 85,000ක වාහන ණයක් යතුරු පැදියක් මිලදී ගැනීමට ලබා දීලා තිබෙනවා. රුපියල් ලක්ෂ 5 උපරිමයකට යටත්ව නිවාස ණය අපි දැන් ලබා දීලා තිබෙනවා.

සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ සේවය විශ්‍රාම වැටුප් සහිත සේවයක් බවට පත් කරනවා කියලා ජනාධිපතිතුමා "මහින්ද චින්තන" වැඩ පිළිවෙළ යටතේ අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳන් කරලා තිබෙනවා. ඒ නිසා ජනාධිපතිතුමා, බැසිල් රාජපක්ෂ මැතිතුමා ආර්ථික සංවර්ධන ඇමතිවරයා හැටියට පත් කළාට පස්සේ ඒ ඇමතිතුමා විසින් මේ සම්බන්ධ කමිටුවක් පත් කළා. රංජිත් සියඹලාපිටිය මැතිතුමාගේ සභාපතිත්වයෙන් සාමාජිකයන් හත් දෙනෙකුගෙන් යුතු කමිටුවක් පත් කරලා, සමෘද්ධි නිලධාරින්ගේ වැටුප් විෂමතාවන්, ඔවුන්ට තිබෙන ප්‍රශ්න සහ මේ ව්‍යාපාරය පිළිබඳ වාර්තාවක් දෙන්න කියලා ඒ කමිටුවට කිව්වා. ලංකාවේ විවිධ ප්‍රදේශවල අය මේ කමිටුවට සාක්ෂි දුන්නා. ඒ

වාගේම ඒ අයගේ ඉල්ලීම් කමිටුවට ලබා දුන්නා. ඒ වාර්තාවෙන් නිර්දේශයක් දීලා තිබෙනවා, සමෘද්ධි නිලධාරින් විශ්‍රාම වැටුප් සේවයට ඇතුළු කළ යුතුයි කියලා. ඒ අනුව ජනාධිපතිතුමා දැනට සති දෙකකට තුනකට කලින් ලංකාවේ සමෘද්ධි නිලධාරින්ගේ සහ කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින්ගේ ඒකාබද්ධ සංගමයේ රැස්වීමක් අරලිය ගහ මන්දිරයේ පැවැත්වූවා. ඊට විනාඩි දහයකට කලින් මම ජනාධිපතිතුමා හම්බ වෙලා, මේ සමෘද්ධි ව්‍යාපාරයේ තිබෙන මූලික ප්‍රශ්න පිළිබඳව සඳහන් කළාම එතුමා මට කිව්වා, විශ්‍රාම වැටුප් දෙනවා කියලා භය නැතුව කියන්න කියලා. ඒ අනුව මගේ කථාවේදී මම ඉතාම පැහැදිලිව සඳහන් කළා, ජනාධිපතිතුමා විශ්‍රාම වැටුප් දීමට තීන්දු කරලා තිබෙනවා, ඒ නිසා ඔය ගොල්ලන්ගේ මූලික ප්‍රශ්නය ඉවරයි කියලා. ඒ වාගේම ජනාධිපතිතුමාගේ කථාවේදීත් ජනාධිපතිතුමා කිව්වා, සමෘද්ධි නිලධාරින් තවත් සමෘද්ධිලාභියකු බවට පත් කරන්නේ නැහැ, සමෘද්ධි නිලධාරින්ගේ සේවය අපි ස්ථිර කරලා ඒ සේවය විශ්‍රාම වැටුපක් තිබෙන සේවයක් බවට පත් කරනවා කියලා. ඒ නිසා මේ සමෘද්ධි නිලධාරින් කරන සේවය සලකලා, 1995 ඉඳලා මේ රටේ දුප්පත් ජනතාව වෙනුවෙන් ඔවුන් කළ කැප වීම සලකා බලලා ඔවුන්ට විශ්‍රාම වැටුපක් ඇති කිරීමට අපි අමාත්‍යාංශයක් හැටියට ඉදිරියේදී පියවර ගන්නා බව ප්‍රකාශ කරන අතර, මේ යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීතුමාට මගේ ස්තුතිය මේ අවස්ථාවේදී පිරිනමනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.44 ට, 2011 ජනවාරි 07 වන සිකුරාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி.ப. 6.44 மணிக்கு பாராளுமன்றம், 2011 சனவரி 07, வெள்ளிக்கிழமை பி.ப.1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Adjourned accordingly at 6.44 p.m. until 1.00 p.m. on Friday, 07th January, 2011.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.